CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED

# හෙට දින සඳහා
# බලශක්තිය



ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

වාර්ෂික වාර්තාව 2022



# හෙට දින සඳහා
# බලශක්තිය



# අන්තර්ගතය


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 05 |
| කාර්ය සාධන විශේෂතා | 10 |
| වසර දෙස බැල්මක් | 12 |
| අපගේ නායකත්වය | 14 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 16 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 20 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 26 |
| කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය | 31 |
| මෙහෙයුම් පරිසරය | 32 |
| මූල්‍ය ප්‍රාග්ධනය | 44 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | 48 |
| මානව ප්‍රාග්ධනය | 55 |
| පාලනය සහ අනුකූලතාව | 64 |
| ආයතනික පාලනය | 66 |
| අවදානම් කළමනාකරණය | 78 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 89 |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 92 |
| මූල්‍ය ප්‍රකාශන | 96 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 98 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 111 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 112 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 113 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 114 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 115 |
| සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය | 151 |
| පස් අවුරුදු මූල්‍ය සාරාංශය | 153 |

# ආයතනික තොරතුරු

**ආයතනයේ නම**
ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**නෛතික ස්වභාවය:**
රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට හැරවීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත.

**ලියාපදිංචි කාර්යාලය:**
නිමාව, කොළොන්නාව, වැල්ලම්පිටිය,
ශ්‍රී ලංකාව.

**දුරකථන**
+94 11 2694482
+94 11 2691643
+94 11 2532122
ෆැක්ස් +94 11 2547827
විද්‍යුත් තැපෑල secret@cpstl.lk
වෙබ් අඩවිය www.cpstl.lk

**බදු ගෙවීම් හඳුනාගැනීමේ අංකය:**
134011157

**මූල්‍ය වර්ෂ**
ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

**සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ**
එම්. උවයිස් මොහොමඩ් මහතා

**අධ්‍යක්ෂවරු**
ඊ.ඒ.රත්නසීල මහතා
දීපක් දාස් මහතා
අසීම් භාර්ගවා මහතා
රාජේෂ් කුමාර් භගත් මහතා
ඩී.පී.ආර්. මනෝජ් කුමාර් මහතා
ධර්මදාස පණ්ඩිතරත්න මහතා
යසිරු ලංකාතිලක මහතා

**මව් සමාගම**
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

**ලේකම්වරු**
ගිණුම්කරණ පද්ධති ලේකම් සේවා
(පුද්ගලික) සමාගම,
අංක 11, කාසල් පටුමග, කොළඹ 04.

**විගණකවරු**
රජයේ විගණකාධිපති

**බැංකුකරුවන්**
මහජන බැංකුව, ලංකා බැංකුව



# දැක්ම

දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම.

# මෙහෙවර

පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටුකරමින් දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම සහ ක්‍රියාකාරී සේවාවක් පවත්වා ගැනීමටත්, පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් සපයන්නා වූ ඛනිජතෙල් නිෂ්පාදන ධාරිතාවේ නියමිත ගුණාත්මකභාවය සහතික කරමින්, අඛණ්ඩ වර්ධනයකින් යුතු පාරිභෝගිකයා තෘප්තිමත් කරන්නා වූ සේවයක් සැලසීමටත්, කැපවීමටත්, මහජන හා පාරිභෝගිකයින්ගේ ප්‍රතිචාර හා මාර්ගෝපදේශකත්වය මත පදනම් වූ පරිසරයට ගෞරවය දක්වමින් හා එහි ප්‍රමිතීන් සුරකිමින්, නීතිගරුක, තෘප්තිමත්, මනා පුහුණුවක් හා කැපවීමකින් යුත්, ශ්‍රම බලකායේ සහභාගිත්වය ලබාදීමත්, අපගේ මෙහෙවරය.

# අප ගැන

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම්වලට හැරවීමේ පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර, එයට 2003 ඔක්තෝම්බර් 13 දිනැති අංක 1310/8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති අයුරින්, තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම්වල අයිතිය ඇත.

අපි ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් නිෂ්පාදන හැසිරවීම සඳහා වූ උසස් තත්ත්වයේ යටිතල පහසුකම්වලින් සමන්විත ඛනිජතෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ නියුක්ත සමාගමක් වන්නෙමු. තරඟකාරී සහ යහපත් ලෙස ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම තුලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන් මගට සහයවීම සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරමින් අපගේ පාර්ශවකරුවන්ගේ වටිනාකම් අඛණ්ඩව ඉහළ නංවමින් සිටින්නෙමු.

අප ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන අතර මෙහි කොටස් ප්‍රාග්ධනයෙන් 2/3 ක හිමිකම් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ද ඉතිරි කොටස ලංකා IOC PLC සමාගමට ද අයත් ය. එසේ ම ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සිය මව් සමාගමෙහි දශක හයක පමණ අත්දැකීම්, විශේෂඥ දැනුම උරුම කොටගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා නවෝත්පාදනයට දායක වන අතර බලශක්ති අංශයේ පාරිසරික තිරසාරත්වය සහතික කරයි.

රටේ සිල්ලර පාරිභෝගිකයින්ගේ බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට සහ ලංකා IOC PLC සමාගමට අයත් දිවයින පුරා අලෙවිසල් දහසකට අධික ප්‍රමාණයකට සහ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ විවිධ කර්මාන්ත අංශයන්හි තොග පාරිභෝගිකයන් විශාල සංඛ්‍යාවකගේ බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා අපි සේවය කරන්නෙමු. මෙහිදී ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා තොග ගබඩා 11 කින් සහය දක්වන ප්‍රධාන පර්යන්ත දෙකක් හරහා විවිධ ක්‍රියාකාරකම්වලට සමාග මේ සේවකයින් 2,500ක් පමණ සක්‍රීයව දයක වෙයි.

### ප්‍රධාන පර්යන්තයන්

- කොළොන්නාව නිමාව හා මුතුරාජවෙල පර්යන්තය

### තොග ගබඩා

- අනුරාධපුර
- කොටගල
- මඩකලපුව
- මාතර
- හපුතලේ
- සරසවි උයන
- බදුල්ල
- කුරුණෑගල
- ගාල්ල
- පේරාදෙණිය
- කන්කසන්තුරෙයි

කොළොන්නාව පර්යන්තය මගින් ඛනිජතෙල් නිෂ්පාදන 13ක් ද මුතුරාජවෙල පර්යන්තය මගින් ඛනිජතෙල් නිෂ්පාදන 3ක් ද මෙහෙයවනු ලැබේ.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ බෙදාහැරීම් කාර්යාංශය විසින් අලෙවිකරණ සමාගම් වන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා IOC PLC වෙනුවෙන් ඛනිජතෙල් නිෂ්පාදන බෙදාහැරීමේ කාර්යය සිදු කරනු ලබන අතර කොළොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්ත දෙක මගින් දිවයින පුරා ඛනිජතෙල් නිෂ්පාදන බෙදාහැරීම ශක්තිමත් කිරීමත් පිට පළාත්වල තොග ගබඩා 11 ක් සහ එක් අභ්‍යන්තර දුම්රිය ඩිපෝවක් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලබයි. තොග ගබඩාවලට සහ අභ්‍යන්තර දුම්රිය ගබඩාව වෙත නිෂ්පාදන නැවත පිරවීම සඳහා ප්‍රධාන පර්යන්තවලින් පැටවෙන ඉන්ධන ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත් සහ කුලී පදනම මත ලබාගත් ටැංකි රථ මගින්ද කොළොන්නාව පර්යන්තය තුල පිහිටි දුම්රිය බෝගී මගින් ද ප්‍රවාහනය කරනු ලැබේ. කොළොන්නාව පර්යන්තයේ පමණක් ගබඩා කෙරෙන ගුවන් යානා ඉන්ධන දිනපතා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට (BIA) දුම්රියෙන් ප්‍රවාහනය කරන අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෙහෙයවනු ලබන රත්මලාන සහ අනෙකුත් ගුවන් ක්ෂේත්‍ර ඔවුන්ගේ ඉන්ධන අවශ්‍යතා ලබා ගන්නේ ටැංකි රථ මඟිනි. සල්ෆර් අඩු දැවි තෙල් මුතුරාජවෙල පර්යන්තයේ පමණක් ගබඩා කරන අතර, මේ ඉන්ධන ඒ සඳහා ම වෙන්කෙරුණු විශේෂ භූගත නළ පද්ධතියක් ඔස්සේ කෙරවලපිටිය විදුලි බලාගාරය වෙත මාරු කරනු ලැබේ.


පර්යන්තය
තොග ගබඩාව
කන්කසන්තුරේ
අනුරාධපුර
මඩකලපුව
කුරුණෑගල
පේරාදෙණිය
මුතුරාජවෙල
සරසවි උයන
කොළොන්නාව
කොටගල
බදුල්ල
හපුතලේ
ගාල්ල
මාතර

# කාර්ය සාධන විශේෂතා

| | | | 2022 | 2021 (නැවත ප්‍රකාශිත) | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: මූල්‍ය වර්ධනය** | | | | | | | |
| | ආදායම | රු. මිලියන | 9,433 | 14,276 | 13,568 | 15,340 | 13,130 | 14,176 |
| | මෙහෙයුම් ලාභය | රු. මිලියන | (989) | 1,377 | 1,906 | 1,966 | 1,405 | 3,208 |
| | බදු පෙර ලාභය/(අලාභය) | රු. මිලියන | (704) | 1,578 | 2,215 | 2,289 | 1,522 | 3,273 |
| | බදු පසු ලාභය/(අලාභය) | රු. මිලියන | (1,059) | 1,169 | 2,001 | 1,305 | 197 | 2,800 |
| | හිමිකම් මත ප්‍රතිලාභ | % | -4% | 4% | 7% | 5% | 1% | 11% |
| | **මූල්‍ය ස්ථාවරත්වය** | | | | | | | |
| | මුළු වත්කම් | රු. මිලියන | 33,481 | 33,999 | 32,588 | 31,522 | 30,322 | 29,991 |
| | මුළු වගකීම් | රු. මිලියන | 6,252 | 5,999 | 5,369 | 5,773 | 5,556 | 4,828 |
| | කොටස් හිමියන්ගේ අරමුදල් | රු. මිලියන | 27,229 | 28,000 | 27,218 | 25,749 | 24,766 | 25,163 |
| | මුදල් සහ මුදල් සමාන දෑ | රු. මිලියන | 2,006 | 2,257 | 3,442 | 3,999 | 3,149 | 1,474 |
| | **කොටස් හිමියන්ගේ තොරතුරු** | | | | | | | |
| | කොටසක ඉපයීම | රු. | (1.41) | 1.56 | 2.67 | 1.74 | 0.26 | 3.73 |
| | කොටසකට ලාභාංශය (ගෙවූ) | රු. | - | - | 0.48 | 0.30 | 0.868 | 0.54 |
| | කොටසක ශුද්ධ වත්කම | රු. | 36 | 37 | 36 | 34 | 33 | 33 |
| | ආර්ථික අගය එකතු කිරීම | රු. මිලියන | (704) | 1,812 | 2,458 | 2,319 | 1,613 | 3,616 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: මෙහෙයුම් විශිෂ්ඨත්වය** | | | | | | | |
| | **දේපල, පිරියත සහ උපකරණ** | | | | | | | |
| | පර්යන්ත සහ තොග ගබඩා | ගණන | 13 | 13 | 13 | 13 | 13 | 14 |
| | ප්‍රාග්ධන වියදම් | රු. මිලියන | 925 | 1,358 | 1,085 | 981 | 375 | 833 |
| මානව ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: සේවකයින් තුළ ආයෝජනය** | | | | | | | |
| | මුළු සේවක සංඛ්‍යාව | ගණන | 2,474 | 2,629 | 2,766 | 2,856 | 2,932 | 3,045 |
| | කාන්තා නියෝජනය | ගණන | 308 | 343 | 321 | 326 | 334 | 343 |
| | සේවක ගෙවීම් | රු. මිලියන | 6,745 | 6,908 | 5,918 | 6,636 | 6,853 | 5,570 |
| | සේවක ඉවත්වීම් අනුපාතය | % | 6% | 6% | 4% | 5% | 6% | 1% |
| | පුහුණුවීම් සඳහා ආයෝජන | රු. මිලියන | 2 | 3 | 4 | 17 | 22 | 32 |
| | මුළු පුහුණුවීම් පැය | පැය | 5,006 | 3,806 | 6,245 | 9,706 | 12,609 | 21,832 |
| | සාමාන්‍ය පුහුණුවීම් පැය/සේවක | පැය | 8 | 4 | 6 | 5 | 7 | 9 |
| | සේවකයෙකුට ආදායම | රු. මිලියන | 3.81 | 5.43 | 4.91 | 5.37 | 4.48 | 4.66 |
| සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය | සේවකයෙකුට ශුද්ධ ලාභය (අලාභය) | රු. මිලියන | (0.43) | 0.44 | 0.68 | 0.42 | 0.09 | 0.89 |
| | අනියම් සේවකයින් (ආසන්න වශයෙන්) | ගණන | 70 | 75 | 61 | 71 | 63 | 105 |
| | පාරිභෝගික ස්පර්ශ ස්ථාන | ගණන | 40 | 40 | 40 | 40 | 40 | 40 |
| | CSR සඳහා ආයෝජනය | රු. මිලියන | 0.3 | 6.5 | 1.7 | 3.8 | 2.1 | 6.1 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආසන්න වශයෙන්) | ගණන | 775 | 8,600 | 4,000 | 8,800 | 8,700 | 8,500 |
| ස්වාභාවික ප්‍රාග්ධනය | රජයට දායක වීම | රු. මිලියන | 1,796 | 1,608 | 1,683 | 2,441 | 2,579 | 2,175 |
| | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: තිරසාර බව** | | | | | | | |
| | බලශක්ති පරිභෝජනය | කි. වොට් | 4,717,569 | 5,342,888 | 5,602,794 | 6,360,903 | 6,397,024 | 5,554,900 |
| | ජල පරිභෝජනය | කි. ලීටර් | 204,872 | 280,239 | 270,023 | 299,011 | 333,344 | 276,214 |
| | තෙල් මණ්ඩි ඉවත් කිරීම | කි. ලීටර් | 99.6 | 32.4 | 244.2 | 118.8 | 165 | - |



# වසර දෙස බැල්මක්

**විකුණුම් පරිමාව**
කි.ලී. මිලියන
**3,954,237**

**ආදායම**
රු. බිලියන
**9.43**

**වත්කම් පදනම**
රු. බිලියන
**33.5**

**බදු පසු ලාභය**
රු. බිලියන **-1.0**












### මුළු වත්කම් වර්ධනය (රු. මිලියන)




### හිමිකම් මත ප්‍රතිලාභ %




### ජංගම/ ක්ෂණික වත්කම් අනුපාතය (වාර)




### කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)




### වත්කම් පිරිවැටුම් අනුපාතය




### තෝලන අනුපාතය (වාර)



# අපගේ නායකත්වය



# සභාපතිතුමාගේ පණිවිඩය

ගත වූ වසර තුළ ආර්ථික දුෂ්කරතා සහ ප්‍රතිපත්තිමය දුර්වලතා මත ශ්‍රී ලංකාවේ දේශීය ආර්ථිකය අභියෝගවලට මුහුණ දුන් අතර මෙම අභියෝග පුරාවටම, CPSTL ආයතනය සිය වගකීම් සහගත ව්‍යාපාරික භාවිතයන් සහ ආයතනික පුරවැසිභාවය තුළින් ජාතික ආර්ථික ස්ථාවරත්වයට සහාය වීමට කැපවී සිටියේය.



2022 වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි. 2022 වර්ෂය තුළ ගෝලීය ඛනිජතෙල් කර්මාන්තය සුවිශේෂී පරිවර්තනයකට මෙන්ම සැලකිය යුතු අභියෝගවලට මුහුණ දුන් අතර 2020 දී COVID-19 වසංගතයත් සමග ඇතිවූ ආර්ථික පසුබෑමෙන් අනතුරුව මෙම වර්ෂයේදී ඛනිජතෙල් මිලෙහි කැපී පෙනෙන ප්‍රකෘතියක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය තුළ, දේශීය හා සාර්ව ආර්ථික පරිසරයන්හි මෙන්ම ඛනිජතෙල් කර්මාන්තයට විශේෂිත වූ අභියෝග හමුවේ, අපගේ සේවාවන් මුහුණ දෙන අභියෝගාත්මක මෙහෙයුම් භූ දර්ශනයක් තිබියදීත්, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම ඛනිජතෙල් පර්යන්ත ක්‍රියාකරු බවට පත්වීමේ සිය ගමන අඛණ්ඩව පවත්වාගෙන ගියේය. අපගේ වෘත්තිය විශේෂඥයින්ගේ කැපවීම සහ විශ්වාසවන්ත, තෘප්තිමත් සහ හොඳින් පුහුණු වූ ශ්‍රම බලකායේ නොසැලෙන සහයෝගය මත මෙය සිදු කළ හැකි විය.

මෙහෙයුම් පරිසරය

2022 දී, විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ශ්‍රී ලංකාව දැඩි ඉන්ධන අර්බුදයකට මුහුණ දුන් අතර, සමාජ නොසන්සුන්තාව සහ ඉන්ධන පිරවුම්හල්වල දිගු පෝලිම් ඇති විය. අර්බුදය විසඳීම සඳහා රජය කෙටි කාලීන ණය පහසුකම් සුරක්ෂිත කිරීම, මිල සූත්‍ර සංශෝධනය කිරීම සහ අපනයනකරුවන් සඳහා ප්‍රමුඛතා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම, QR කේතය පදනම් කරගත් ඉන්ධන බෙදා හැරීම සහ සංචාරකයින් සඳහා පෙරගෙවුම් කාඩ්පත් ලබා දීම ඇතුළු ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදි.

මෙම කාලය තුළ, භූ දේශපාලනික ආතතීන් සහ සැපයුම් බාධාවන් හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල ඉහළ මට්ටමක පැවති නමුත් 2023 මුල් භාගයේදී තරමක් දුරට මධ්‍යස්ථ විය. මෙම උච්චාවචනයන් CPSTL හි මෙහෙයුම් සහ තීරණ ගැනීම කෙරෙහි බලපෑවේය. කෙසේ වෙතත්, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තාක්ෂණය වැළඳ ගැනීම සහ වෙනස්වන පාරිභෝගික මනාපයන් සමග පෙළගැස්වීම මගින් සිය අනුවර්තනය වීමේ හැකියාව පෙන්නුම් කළ අතර එය අපගේ මෙහෙයුම් ප්‍රශස්ථව පවත්වාගෙන යාමේ මූලික පදනම විය.

ගෝලීය බොරතෙල් මිල වසර පුරා ඉහළ පහළ යෑම් අත්විඳින ලද අතර, භූ දේශපාලන ආතතීන් සහ රුසියාවට එරෙහි සම්බාධක හේතුවෙන් මාර්තු මාසයේදී බොරතෙල් බැරලයක මිල ඇ.ඩො. 140 දක්වා ඉහළ ගියේය. වසරේ අග භාගයේදී, ගෝලීය ආර්ථික මන්දගාමීත්වය, මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම, චීනයේ COVID-19 සීමා කිරීම් සහ එක්සත් ජනපදයේ උපායමාර්ගික ඉන්ධන සංචිත නිකුත් කිරීම, මිල ගණන් පහත වැටීමට දායක විය. එසේ තිබියදීත්, ඔපෙක් නිෂ්පාදන කප්පාදුව, G-7 රටවල් විසින් රුසියානු තෙල් මත මිල සීමා පැනවීම, යුරෝපා සංගමය රුසියානු බොරතෙල් ආනයනය තහනම් කිරීම සහ චීනයේ ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමේ සලකුණු වැනි සාධක හේතුවෙන් වරින් වර මිල ඉහළයාම් සිදු විය.

ගත වූ වසර තුළ ආර්ථික දුෂ්කරතා සහ ප්‍රතිපත්තිමය දුර්වලතා මත ශ්‍රී ලංකාවේ දේශීය ආර්ථිකය අභියෝගවලට මුහුණ දුන් අතර මෙම අභියෝග පුරාවටම, CPSTL ආයතනය සිය වගකීම් සහගත ව්‍යාපාරික භාවිතයන් සහ ආයතනික පුරවැසිභාවය තුළින් ජාතික ආර්ථික ස්ථාවරත්වයට සහාය වීමට කැපවී සිටියේය.

ප්‍රාග්ධන විභවය

2022 දී, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සැලකිය යුතු ආර්ථික අභියෝගවලට මුහුණ දුන් අතර, පෙර වසරට සාපේක්ෂව ආදායමේ 34% ක පහත වැටීමක් වාර්තා විය. ඉන්ධන සැපයුම් දාම අර්බුදය සමග ඇතිවූ ඉන්ධන හිඟයේ ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පරිමාව 2021 වසරට සාපේක්ෂව 17% කින් අඩුවීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස දළ ලාභය 56% කින් අඩු වූ අතර, 2021 දී 41% ක් වූ දළ ලාභ ආන්තිකය 2022 දී 28% දක්වා පහත වැටෙන ලදි. 2021 දී 10% ක් වූ මෙහෙයුම් ලාභ ආන්තිකයට සාපේක්ෂව 2022 දී රු. බිලියන 0.9 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදි.

# සභාපතිතුමාගේ පණිවිඩය

මෙම දුෂ්කරතා මධ්‍යයේ වුවද, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සිය උපාය මාර්ගික පියවරයන් පිළිබඳ විශ්වාසය සහ ඉදිරි චින්තන ප්‍රවේශය මගින් දුෂ්කරතා අතික්‍රමණය කිරීමට මෙන්ම විකාශනය වන ව්‍යාපාරික පරිසරයේ සැරිසැරීමට සහ ශක්තිමත්, වඩා ක්‍රියාකාරී සහ සමෘද්ධිමත් සමාගමක් ලෙස ඉස්මතු වීමට අඛණ්ඩව කැපවී සිටී.

## සංවර්ධන පරිසරය

2004 දී ආරම්භ කරන ලද CPSTL හි මුතුරාජවෙල පර්යන්තය, කාර්ය මණ්ඩල සාමාජිකයින් 52 දෙනෙකු සමග දෛනිකව ඩීසල්, දැව් තෙල් සහ භූමිතෙල් මෙට්‍රික් ටොන් 500ක් කළමනාකරණය කරන ලදී. වර්තමානයේ, වැඩිවන ඉන්ධන ඉල්ලුම හේතුවෙන්, එය සේවකයින් 306 ක් සමග දිනකට මෙට්‍රික් ටොන් 6000 ක් කළමනාකරණය කරයි. අනාගත සැලසුම් තුලින් මෙම ධාරිතාව ඉහළ නැංවීමට අරමුණු කර ඇති අතර අර්ධ ස්වයංක්‍රීය පර්යන්තය මාර්ග ටැංකි සඳහා වේගවත් හැරවුම් කාලයන් සහ වරාය ගාස්තු නොමැතිව SPBM-02 වෙතින් සෘජු නිෂ්පාදන මාරු කිරීම් වැනි කාර්යක්ෂමතා වාසි ලබා දෙයි. තවද, පිටත වටරවුම් අධිවේගී පිවිසුමේ එහි උපායමාර්ගික පිහිටීම දිවයින පුරා ලාභදායී ඉන්ධන බෙදා හැරීමට හැකියාව ලැබෙනු ඇත.

CPSTL ආයතනය විශේෂයෙන් පෙට්‍රල් සඳහා ගැන්ට්‍රි පිරවුම් ධාරිතාව ඉහළ නැංවීමට සැලසුම් කර ඇත. මෙයට කලාප 07 හි අධි ධාරිතාවයෙන් යුත් පොම්ප ස්ථාපනය කිරීම, කලාප අංක 06 හි නව නිෂ්පාදන පොම්පාගාරයක් ඉදිකිරීම (රු. මිලියන 36) සහ නල මාර්ග සඳහා අගල් කැපීම (රු. මිලියන 50) 2024 මුල් භාගයේදී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

ඇමරිකානු පෙට්‍රෝලියම් ආයතනයේ (API) නිර්දේශයන්ට අනුකූලව, CPSTL හි වාෂ්පීකරණ පාඩු අවම කිරීම සඳහා අභ්‍යන්තර පාවෙන වහල (IFR) හඳුන්වා දෙන ලදී. 2023 දෙසැම්බර් වන විට ගාල්ල තොග ගබඩාවේ ටැංකි අංක 04 සහ ටැංකි අංක 05 හි IFR ස්ථාපනය නිම කිරීමට සැලසුම් කර ඇති අතර කොළොන්නාව පර්යන්තයේ සහ ලංකා තොග ගබඩාවල ක්‍රියාත්මක කර ඇත.

කුරුණෑගල තොග ගබඩා ව්‍යාපෘතියට නව පිරවුම් ගැන්ට්‍රියක්, නිෂ්පාදන නල මාර්ග, IFR සහිත LS 92 ගබඩා ටැංකි වෙත ගිනි පෙණ පෝෂණය කිරීමේ නල මාර්ග සහ ආරක්ෂාව සඳහා ටැංකි ඩ්‍රේනේජ් නල මාර්ග ඉදිකිරීම ඇතුළත් වේ. එය 80%ක් සම්පූර්ණ කර ඇති අතර 2023 පෙබරවාරි මාසයේදී අවසන් කිරීමට නියමිතය.

## කුසළතා සංචිතය

අප ආයතනය සේවකයන්ගේ දැනුම, කුසළතා, පළපුරුද්ද සහ යහපැවැත්ම ඇතුළත් මානව ප්‍රාග්ධනය ඉතා ඉහළින් අගය කරයි. අපගේ සේවකයින් ආයතනයේ සාර්ථකත්වයට තීරණාත්මක වන අතර ඔවුන්ගේ වෘත්තීය වර්ධනයට සහය වීමට සහ ඔවුන්ගේ දායකත්වය හඳුනා ගැනීමට අප ආයතනය කැපවී සිටී. අභිප්‍රේරණ සේවා පරිසරයක් නිර්මාණය කිරීමට සහ සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයතනය ප්‍රමුඛත්වය ලබා දෙන අතර ඒ වෙනුවෙන් පාලන ව්‍යුහයන් ක්‍රියාත්මකව ඇත. අප ශ්‍රම බලකාය ආයතනික වටිනාකම් ආරක්ෂා කරමින් උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායක වන සේවකයින් 2,474 කින් සමන්විත වේ. අනාගත ව්‍යාපාරික ඉල්ලීම් සපුරාලීම සඳහා ඉදිරි දැක්මක් සහිත ඉගෙනුම් උපාය මාර්ගයක වැදගත්කම සංවිධානය හඳුනාගෙන ඇති අතර පුහුණු සහ මානව සම්පත් සංවර්ධන අංශය හරහා අප ශ්‍රම බලකාය සංවර්ධනය කිරීමට කැපවී සිටී.

## පිළිගැනීම්

අපගේ ධෛර්ය සම්පන්න මෙහෙයුම් අපගේ හැකියාවන් කෙරෙහි ගැඹුරින් මුල් බැසගත් විශ්වාසයකින් සමන්විත වේ. අප කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා ගබඩා සහ බෙදාහැරීමේ පද්ධති ප්‍රශස්ත කරමින් යටිතල පහසුකම් සහ තාක්ෂණය සඳහා උපායමාර්ගික ආයෝජන සිදු කළෙමු. ආයතනයේ දැක්ම පිළිබඳ විශ්වාසයකින් මෙහෙයවනු ලබන අපගේ ශ්‍රම බලකාය, ජාතියේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ පහසුකම් බාධාවකින් තොරව ක්‍රියාත්මක වන බව සහතික කරමින්, ඔවුන්ගේ හැකියාවන් කෙරෙහි කැපී පෙනෙන විශ්වාසයක් ප්‍රදර්ශනය කළහ. අපි නියාමන වෙනස්කම් සහ වෙළඳපොළ අස්ථාවරත්වය හසුරුවනු ලැබුවේ අපගේ මෙහෙවර පිළිබඳ ස්ථිර විශ්වාසයකින් වන අතර මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන විට, ශ්‍රී ලාංකීය

ජනතාවගේ සහ එහි වර්ධනය වෙමින් පවතින ආර්ථිකයේ අභිලාෂයන් පෝෂණය කිරීමෙහිලා අපගේ නොපසුබට උත්සාහයන් අඛණ්ඩව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි යන විශ්වාසය ඇතිව අපි එය ඉදිරිපත් කරමු. 2022 දී අපගේ ධෛර්ය සම්පන්න සහ විශ්වාසනීය මෙහෙයුම් මගින් බලශක්ති ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයේ සහ විශ්වසනීයත්වයේ පහනක් ලෙස අප ස්ථානගත කර ඇති අතර, ඉදිරි වසරවලදී වඩා විශිෂ්ඨ සාර්ථකත්වයක් අත්කර ගැනීමට අපගේ කැපවීම තුළ අපි නොසැලී සිටිමු.

CPSTL හි ඵලදායී පාලනය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. 2022 අභියෝගාත්මක වසර පුරාවටම මාගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ මගපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මම ඔවුන්ට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. එමෙන්ම ගෙවුණු වසරේ අභියෝගවලට මුහුණ දීමේදී ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව සහ ශක්තිය වෙනුවෙන් මම CPSTL කණ්ඩායමට මාගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි.

ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍ය - කාංචන විජේසේකර මහතා සහ ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වන ඩී.වී. චානක මහතා සහ ඉන්දික අනුරුද්ධ මහතා අප කෙරෙහි තැබූ විශ්වාසයට සහ ඔවුන්ගේ මග පෙන්වීම වෙනුවෙන් අපි අපගේ අවංක ස්තුතිය පුද කරමු. තවද මාගේ සෙසු අධ්‍යක්ෂවරුන්ට, කැපවූ කළමනාකරණ කණ්ඩායමට, කැපවූ සේවකයින්ට සහ අගනා ව්‍යාපාරික හවුල්කරුවන්ට ඔවුන්ගේ නොසැලෙන පක්ෂපාතිත්වය සහ ස්ථිර සහයෝගය වෙනුවෙන් මම මාගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි. අප ඉදිරි ගමන ආරම්භ කරන විට, අපගේ සාමූහිකත්වය සහ නොසැලෙන කැපවීම තුළ අප ඉදිරියේ ඇති නව අභියෝගවලට මුහුණ දීමට සහ ජය ගැනීමට අපට හැකි වනු ඇතැයි මා විශ්වාස කරමි.



එම්.යූ. මොහොමඩ්
සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය

01



එම්. උවයිස් මොහොමඩ් මහතා
සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ

02



ඊ.ඒ.රත්නසීල මහතා
අධ්‍යක්ෂ

## 01 එම්. උවයිස් මොහොමඩ් මහතා
**සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ**

''මිනිසුන්ව හොඳින් පුහුණු කරන්න, එවිට ඔවුන්ට ඉවත්ව යාමට කැමැත්තක් ඇති වුව ද ඔවුන්ට හොඳින් සලකන විට එසේ ඉවත්ව යාමට අවශ්‍ය නොවනු ඇත.'' - රිචඩ් බ්‍රැන්සන්

සිය ශ්‍රම බලකාය ක්‍රමෝපායික පිළිවෙත් මත එක්සත් සහ එක්සිත්ව කටයුතු කිරීම, ඵලදායී ආකාරයෙන් ඉදිරියට යා හැකි එකම මාර්ගය බව, මොහොමඩ් උවයිස් මොහොමඩ් මහතා දැඩි ලෙස විශ්වාස කරයි. ඔහුට සිය වෘත්තීය ජීවිතය තුළ දශක දෙකක පමණ නායකත්ව තනතුරුවල අත්දැකීම් ඇත.

වර්තමානයේ ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන දෙකෙහිම සභාපති තනතුරු දරණ අතර ව්‍යවසාය සම්පත් සැලසුම් සඳහා බලශක්ති අමාත්‍යාංශයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි.

මොහොමඩ් මහතා 2015-2016 කාලය තුළ Aberdeen Holdings (Pvt) Ltd හි ERP සහ BI ඒකකයේ ප්‍රධානියා වූ අතර 2006 සිට 2015 දක්වා කාලය තුළ Expolanka Holding PLC හි ERP සහ මූල්‍ය කළමනාකරු ලෙසද 2003 සිට 2006 දක්වා එක්සත් රාජධානියේ London College of Business හි සාමාන්‍යාධිකාරීවරයා ලෙසද කටයුතු කළේය. ඔහු තවදුරටත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ (NAITA) අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුවේ නිර්මාතෘ උපදේශක සාමාජිකයෙකුද වේ. ඔහුගේ සේවා පළපුරුද්ද සහ අත්දැකීම් යුරෝපය සහ දකුණු ආසියාවේ අනෙකුත් ප්‍රදේශ ඇතුළුව ලෝකයේ විවිධ කලාපවලට විහිදේ.

03



**දීපක් දාස් මහතා**
**අධ්‍යක්ෂ**

04



**අසීම් භාර්ගවා මහතා**
**අධ්‍යක්ෂ**

CPSTL හි පත් වූ ලාබාලතම සභාපතිවරයා ලෙස පසුගිය අර්බුද සමයේ සිය සාර්ථක ව්‍යාපාරික අදහස් සහ නව්‍යකරණ විසඳුම් හමුවේ ආයතනය ඉදිරියට මෙහෙයවමින් තමා, උපායශීලී දක්ෂ පුද්ගලයෙකු බව උවයිස් මහතා ඔප්පු කළේය.

මොහොමඩ් මහතා එක්සත් රාජධානියේ වේල්ස් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ද, ඇමරිකාවේ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ද හිමි කරගෙන ඇත. තවද, බ්‍රිතාන්‍යයේ තොරතුරු තාක්ෂණය සඳහා වූ වරලත් ආයතනයේ සාමාජිකයෙකු (MBCS) හා කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) අවසන් අදියරේ විද්‍යාර්ථයෙක් වන ඔහු, Toastmaster International හි ACB සුදුසුකම දරන්නෙකි. වසර ගණනාවක් පුරා තොරතුරු තාක්ෂණ සහ ගිණුම්කරණය ඇතුළු ඔහුගේ අභිලාෂ ක්ෂේත්‍රවල බොහෝ වෘත්තීය සුදුසුකම් සහ සහතික වලින් සන්නද්ධ වී ඇති මොහොමඩ් මහතා ව්‍යවසාය මට්ටමින් ආයතනික ERP පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂ දැනුමක් ඇත්තෙකි.

මොහොමඩ් මහතා දූරදර්ශී, ප්‍රතිඵල මත පදනම් වූ, ව්‍යාපාර සංවර්ධනය, මූල්‍ය කාර්ය සාධනය, උපාය මාර්ගික සැලසුම්කරණය, අලෙවිකරණය සහ බහු-ඒකක මෙහෙයුම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර ගණනාවක් සත්‍යාපනය කළ හැකි සාර්ථකත්වයක් සහිත ඉහළ මට්ටමේ වෘත්තිකයෙක් වන අතර පුළුල් පරාසයක කර්මාන්තවල ඉහළ කීර්තියක් සහ පළපුරුද්දක් ඇති ව්‍යාපාර වලට නායකත්වය දෙන්නෙකි. පුළුල් පරාසයක දැනුම සහ කුසලතාවයන්ගෙන් සමන්විත, නිරන්තරයෙන්

# අධ්‍යක්ෂ මණ්ඩලය

05



**රාජේෂ් කුමාර් භගත් මහතා**
**අධ්‍යක්ෂ**

06



**ඩී.ජී.ආර්. මනෝජ් කුමාර් මහතා**
**අධ්‍යක්ෂ**

අපේක්ෂාවන් ඉක්මවා යාමට ප්‍රබල හැකියාවක් ඇති ඔහු මෙහෙයුම් විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම සඳහා කැපවී සිටින අතර අඛණ්ඩ සංවර්ධනය තුළින් ආයතනවලට සාර්ථකව මග පෙන්වයි.

## 02 ඊ.ඒ. රත්නසීල මහතා
**අධ්‍යක්ෂ**

රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන ඊ.ඒ. රත්නසීල මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි පළමුවන ශ්‍රේණියේ නිලධාරියෙකි. ඔහු 2007/2008 දී ඇමරිකා එක්සත් ජනපදයේ මැසසුචෙස්ට් හි විලියම්ස් විද්‍යාලයෙන්, ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇති අතර 1995 වර්ෂයේ රුහුණු විශ්වවිද්‍යාලයෙන් ඔහුගේ විද්‍යාවේදී උපාධිය සම්පූර්ණ කර ඇත. 2002 කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත් 2003 / 2004 ජපානයේ චිබා, IDE ආර්ථික විද්‍යා උසස් පාසලෙන් සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද හිමිකර ගත්තේ ය.

ඊ.ඒ. රත්නසීල මහතා 2001 දී සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙනි. 2007 සිට 2010 දක්වා වෙළඳ සහ තීරුබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස ඔහු තවදුරටත් සේවය කළේය. තවද වර්ෂ 2011 සිට 2013 දක්වා ජාතික සැළසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු ලෙසද 2013 සිට 2016 දක්වා ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කළ ඔහු, 2016 සිට 2023 දක්වා, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ / අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු ලෙස සේවය කර ඇත.

සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව, කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික පර්යේෂණ සභාව, ජාතික

07



**ධර්මදාස පණ්ඩිතරත්න මහතා**
**අධ්‍යක්ෂ**

08



**යසිරු ලංකාතිලක මහතා**
**අධ්‍යක්ෂ**

සංවර්ධන බැංකුව වැනි රාජ්‍ය ආයතන කිහිපයක මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇති ඊ.ඒ. රත්නසීල මහතා දැනට ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.

## 03 දීපක් දාස් මහතා
**අධ්‍යක්ෂ**

දීපක් දාස් මහතා NIT Silchar හි යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධාරියෙකු වන අතර ඛනිජතෙල් කළමනාකරණය පිළිබඳ සහතිකයක් දරයි. ඛනිජතෙල් ක්ෂේත්‍රයේ වසර 27කට වැඩි ප්‍රවීණතාවයක් ඇති දාස් මහතාට Global Fortune 500 සමාගමක් වන සීමාසහිත ඉන්දියන් ඔයිල් කෝපරේෂන් ලිමිටඩ් (IOCL) හි විවිධ භූමිකාවන් පිළිබඳ පුළුල් අත්දැකීම් තිබේ.

ඔහු ඉන්දියාවේ කේරළ ප්‍රාන්තය, තෙලන්ගානා, ආන්ද්‍ර ප්‍රදේශ්, රාජස්ථාන්, බටහිර බෙංගාලය සහ ඊසානදිග ප්‍රාන්තවල විශාල භූගෝලීය ප්‍රදේශ ආවරණය කරමින් විවිධ තනතුරුවල ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය.

සිල්ලර විකුණුම් සහ මෙහෙයුම් අංශයේ ඔහුගේ විවිධ ප්‍රධාන කළඹ හැරුණු විට, දාස් මහතා ඉන්දියාවේ බලශක්ති සිතියමට ලක්ෂවදීප් දූපත් ගෙන ඒම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ඔහු කේරළ ප්‍රාන්තයේ සිල්ලර විකුණුම් ප්‍රධානියා ලෙස කටයුතු කළ කාලය තුළ දූපත් දෙකක ගබඩා පර්යන්ත ඇතුළුව ලක්ෂවදීප් හි කවරට්ටි, මිනිකෝයි, ඇන්ඩ්‍රොට් සහ කල්පේනි දූපත්වල ඛනිජතෙල් සිල්ලර අලෙවිසැල් පිහිටුවන ලදී.

# අධ්‍යක්ෂ මණ්ඩලය

ලංකා IOC පීඑල්සී හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ඔහුගේ ප්‍රධාන භූමිකාවට අමතරව, දාස් මහතා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු CPC සහ Lanka IOC හි හවුල් ව්‍යාපාරයක් වන Trinco Petroleum Terminal (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ද වේ. එසේම, ඔහු ඉන්දියානු ප්‍රධාන විධායක නිලධාරී සංසදයේ සභාපති (රජයේ සම්බන්ධීකරණ) ලෙස සේවය කරන අතර ලංකා වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ඉන්දියානු සංගමය වැනි විවිධ මණ්ඩලවල ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එසේම ඔහු විසින් දිවයින පුරා සිටින අසරණ පුද්ගලයින්ට උපකාර කිරීම සඳහා විවිධ සමාජ සත්කාර වැඩසටහන් සංවිධානය කරයි.

## 04

### අසීම් භාර්ගවා මහතා
**අධ්‍යක්ෂ**

අසීම් භාර්ගවා මහතාට සීමාසහිත ඉන්දියන් ඔයිල් සමාගමෙහි මූල්‍ය, ජාත්‍යන්තර වෙළඳ සහ වාණිජ ක්ෂේත්‍රයන්හි, තෙල් සහ ගෑස් අංශයේ දශක දෙකකට වැඩි විවිධ සේවා පළපුරුද්දක් ඇත. ඔහු සැලකිය යුතු කාලයක් පිරිපහදු ස්ථානයක ද සේවයකර ඇත. ව්‍යාපාරය සමග මූල්‍ය අරමුණු සහසම්බන්ධ කරගනිමින් සංවිධානාත්මක උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම විවිධාකාර හැකියාවන් ඔහුට අවකාශ සලසා ඇත. ජ්‍යේෂ්ඨ උප සභාපති (මුදල) ලෙස ඔහු සමාගමේ සමස්ත මූල්‍ය කටයුතු පිළිබඳ වගකීම් දරයි.

ඔහු ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (ගෞරව) උපාධියක් දරයි. ඉන්දියාවේ පූනේ සහජීවන කළමනාකරණ අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලන (මූල්‍ය) ඩිප්ලෝමාවකටද ඔහු හිමිකම් කියන අතර දක්ෂතා ලැයිස්තුවේ ඉන්දියාවේ 10 වෙනි ස්ථානය සමගින් ඉන්දියාවේ සමාගම් ලේකම්වරුන්ගේ ආයතනයෙන් සමාගම් ලේකම් ධූරයද ලබා ඇත.

ඔහු IOC හි සේවය කරන අතරතුර, පිරිපහදු මූල්‍ය, පිරිපහදු ප්‍රධාන කාර්යාලය, ආයතනික මූල්‍ය, ජාත්‍යන්තර කටයුතු ආදී විවිධ අංශයන්හි ආයතනික මට්ටම්වල පළපුරුද්ද ලැබුවේය. භාර්ගවා මහතා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු මෙන්ම විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙක් ද වෙයි.

## 05

### රාජේෂ් කුමාර් භගත් මහතා
**අධ්‍යක්ෂ**

දැනට Lanka IOC PLC හි ජ්‍යේෂ්ඨ උප සභාපති (මෙහෙයුම්, ආනයන සහ බංකර් අලෙවිය) ලෙස කටයුතු කරන රාජේෂ් කුමාර් භගත් මහතාගේ ඛනිජ තෙල් අංශයේ පළපුරුද්ද වසර 20කට අධික ය. 2001 දී කළමනාකරණ ආධුනිකයෙකු ලෙස ඉන්දියන් ඔයිල් කෝපරේෂන් සමාගමට සම්බන්ධ වී Tuticorin පර්යන්තයේ මෙහෙයුම් අංශයේ වසර හතරක් සේවය කර ඇත. 2005 සිට, මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ මුම්බායි සහ පූනේහි ආයතනික විකුණුම් දෙපාර්තමේන්තුවේ ONGC සහ අනෙකුත් නැව් කර්මාන්ත සඳහා බංකර් අලෙවිය ඇතුළුව Tata Group, Adani Group වැනි ප්‍රධාන කර්මාන්ත සඳහා අවශ්‍ය විවිධ ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිය සොයා බලමින් සේවය කළේය. දැනට, ඔහු රටේ ඉල්ලුම සපුරාලීම සඳහා ලංකා IOC PLC හි ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය ඇතුළුව බංකර් ව්‍යාපාරයෙහි ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

භගත් මහතා, නිෂ්පාදන ඉංජිනේරු අංශයෙන් බී ටෙක් උපාධිය ද, මුම්බායි හි ප්‍රකට කළමනාකරණ විද්‍යාලයක් වන Narsee Monjee වෙතින් ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබාගෙන ඇත.

තෙල් පර්යන්තයේ මෙහෙයුම් සහ බංකර් මෙහෙයුම් ඇතුළු කටයුතුවලදී ද, ඉන්ධන අලෙවිය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තීරණ ගැනීමේ දී ද CPSTL හි අධ්‍යක්ෂවරයෙකු ලෙස, භගත් මහතාගේ දායකත්වය අතිශයින් තීරණාත්මක ය.

## 06 ඩී.ජී.ආර්. මනෝජ් කුමාර් මහතා
**අධ්‍යක්ෂ**

ආර්. මනෝජ් ගමගේ මහතා ( ඩී.ජී.ආර්. මනෝජ් කුමාර්) 2022 දෙසැම්බර් 13 වැනිදා සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කටයුතු කරයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වන ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි.

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නීතිමය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා වන ඔහු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහ දේපල සංවර්ධන මණ්ඩලයේ (ලංකා බැංකුවේ අනුබද්ධිත ආයතනයකි) අධ්‍යක්ෂවරයෙකු ලෙසද පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි.

ශ්‍රී ලංකා ජාතික රූපවාහිනිය සහ ටීවී දෙරණ යන ආයතනයන්ට වසර ගණනාවක් තිස්සේ දායක වන ඔහු පළපුරුදු මාධ්‍යවේදියෙකි.

යුක්තිය සඳහා වන නීතිඥයින්ගේ සංගමයේ සභාපතිවරයා ලෙස ඔහු සිවිල් ක්‍රියාකාරකම් රැසකට සහභාගී වේ.

ඉහත කරුණු වලට අමතරව, ඔහු මහින්ද රාජපක්ෂ, හිටපු අගමැතිතුමාගේ මහජන සම්බන්ධීකරණ ලේකම් සහ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නීතිමය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා ද විය. තවද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ තනතුර ද හොබවන ලදී.

## 07 ධර්මදාස පණ්ඩිතරත්න මහතා
**අධ්‍යක්ෂ**

ධර්මදාස පණ්ඩිතරත්න මහතා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි 2022 අගෝස්තු මාසයේ සිට කටයුතු කරයි. ඔහු 1990 දශකයේ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඉංජිනේරු අංශයෙහි සේවය කරඇති අතර කැස්බෑව නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු පිළිගත් දේශපාලනඥයෙකි. ජනතාවගේ ගැටළු විසඳීම සහ සමාජ මෙහෙවර තුළින් ජනතාවගේ හදවත් දිනා ගැනීමට සමත් වී ඇත.

## 08 යසිරු ලංකාතිලක මහතා
**අධ්‍යක්ෂ**

යසිරු ලංකාතිලක මහතා 2023 මාර්තු මාසයේ සිට ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර ඇති අතර ඔහු එහි විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකාවේ ෂේක්ස්පියර් මධ්‍යස්ථානයේ ප්‍රසාංගික කලා BPA උපාධිධාරියෙකු වන අතර එක්සත් රාජධානියේ City & Guilds හි මෝටර් රථ වාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ලබා ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා ඔටෝමෝටිව් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

යසිරු ලංකාතිලක මහතා මෝටර් රථ අංශයේ තාක්ෂණය සහ ව්‍යාපාර සඳහා ගැඹුරු ආශාවක් ඇති නව්‍ය සහ කාර්ය සාධනය මත පදනම් වූ ව්‍යවසායකයෙකි. ඔහු 2022 වසරේ සිට Lucksons Trading Company (Pvt) Ltd හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන අතර එය දැනට ප්‍රජාවේ මුළු බලශක්ති ගබඩා කොටස් සඳහා විසඳුම් සපයයි. සංවිධාන සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම, මූල්‍යකරණය සහ මානව සම්පත් හැසිරවීම සහ බහු සංස්කෘතික සමාජ කොටස් සමග කටයුතු කිරීම සහ ප්‍රජාව සඳහා හොඳම විසඳුම් ලබා ගැනීම වැනි විවිධ ක්ෂේත්‍රවල ලංකාතිලක මහතාට පුළුල් අත්දැකීම් තිබේ.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**ඕ. පී. කග්ගොඩ ආරච්චි මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**ජී. එම්. ඒ. බණ්ඩාර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ඉංජිනේරු සහ උපකාරක සේවා)



**ටී. වී. සරත්චන්ද්‍ර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**එච්. එන්. බී. යූ. ජයවර්ධන මහතා**
කළමනාකාර (ආරක්ෂක)



**ඩී. ඒ. ජේ. එස්. ධර්මප්‍රිය මහතා**
මෙහෙයුම් කළමනාකාර (මෝටර් වාහන)



**එස්. එන්. ගමගේ මිය**
කළමනාකාරිනී (ආයතනික කටයුතු)



**ඊ. ඒ. ආර්. ඩී. බණ්ඩාර මහතා**
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් හා පාලන) / කළමනාකාර
(පුහුණු සහ මානව සම්පත් සංවර්ධන)



**ජේ. ඒ. යූ. ආර්. කේ. ජයලත් මහතා**
කළමනාකාර (මූල්‍ය)



**ඩී. ආර්. එෆ්. ඩයස් මහතා**
කළමනාකාර (තොරතුරු පද්ධති)



**ආර්. එස්. එස්. ප්‍රේමකුමාර මහතා**
කළමනාකාර (ප්‍රසම්පාදන)



**ඩබ්ලිව්. එම්. ටී. ඩබ්. ඒ. බණ්ඩාර මහතා**
කළමනාකාර (බෙදාහැරීම්)



**අජිත් විජේසූරිය මහතා**
කළමනාකාර (පාරිශ්‍ර සහ ඉංජිනේරු සේවා)

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**ඩබ්ලිව්. එස්. හේමන්ත කුමාර මහතා**
කළමනාකාර
(තොග චලන හා තොග නිෂ්පාදන)



**වෛද්‍ය ආර්. සුසිරිවර්ධන මහත්මිය**
වෛද්‍ය නිලධාරිනී



**කේ. එච්. එම්. ජයසේකර මහතා**
කළමනාකාර (අභ්‍යන්තර විගණන)



**එන්. එම්. මුනාස් මහතා**
කළමනාකාර (මානව සම්පත්)



**ඩබ්ලිව්. පී. පී. ඒ. ඩබ්ලිව්. ජයවර්ධන මිය**
ප්‍රධාන නීති නිලධාරිනී



**ජී. එච්. එන්. එම්. චන්ද්‍රසිරි මහතා**
කළමනාකාර (රසායනාගාර)



**මේජර් ආර්. එම්. එන්. ජයතිලක**
WWV RWP RSP (විශ්‍රාමික)
කළමනාකාර (විමර්ශන)



**ගෘෘප් කපිතාන් පී. එම්. සී. පී. ඩයස්**
කළමනාකාර (ගිනි හා ප්‍රවේසම්)



**එච්. එම්. යූ. බණ්ඩාර මහතා**
කළමනාකාර (ඉංජිනේරු)



**ඩී. ජේ. ඒ. එස්. ද එස්. රාජකරුණා මහතා**
වැඩ බලන කළමනාකාර
(මුතුරාජවෙල පර්යන්තය)



**ඩී. ආර්. ජේ. බෝපෙආරච්චි මහතා**
වැඩ බලන කළමනාකාර
(අක්වෙරළ මෙහෙයුම්)



**එම්. ඩී. ඒ. අශෝක කුමාර මහතා**
වැඩ බලන කළමනාකාර (ගබඩා)



# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

# මෙහෙයුම් පරිසරය

**2022 මූල්‍ය වර්ෂය තුළ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) මෙහෙයුම් පරිසරය භූ දේශපාලන ගතිකත්වය, ආර්ථික උච්චාවචනයන්, තාක්ෂණික දියුණුව සහ ගෝලීය දේශගුණික විපර්යාස වැනි සංකීර්ණ සාධක මත පදනම් වූ අතර, මෙම සාධක අපගේ මෙහෙයුම් සහ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කර ඇත. මෙම ගතික සහ සංකීර්ණ මෙහෙයුම් පරිසරය තුළ, CPSTL සිය උපායමාර්ගික ඥානය භාවිතා කර ඇති අතර මෙහිදී, මෙහෙයුම් පරිසරය තුලදී සාර්ථකත්වය ලබා ගැනීම සඳහා වෙනස් වන වෙළඳපොළ තත්ත්වයන්ට නිරන්තරව අනුගත වීම, තාක්ෂණික දියුණුව වැළඳ ගැනීම සහ වෙනස්වන පාරිභෝගික මනාපයන් සමග පෙළගැස්වීම අවශ්‍ය බව අපි හඳුනාගෙන ඒ සඳහා ක්‍රියා කර ඇත්තෙමු. මෙම අනුවර්තනය වීමේ හැකියාව අපගේ මෙහෙයුම් ප්‍රශස්ථව පවත්වාගෙන යාමේ සහ නැගී එන අවස්ථා ග්‍රහණය කර ගැනීමේ හැකියාවේ මූලික පදනම විය.**

### ගෝලීය ඛනිජතෙල් වෙළඳපොළ

2022 දී ගෝලීය තෙල් කර්මාන්තය සුවිශේෂී පරිවර්තනයකට මෙන්ම සැලකිය යුතු අභියෝග වලටද මුහුණ දුන්නේය. 2020 දී COVID-19 වසංගතය නිසා ඇති වූ ආර්ථික පසුබෑමෙන් පසුව, 2022 දී තෙල් මිලෙහි කැපී පෙනෙන වෙනස්වීමක් සිදු විය. මෙහිදී ගෝලීය බොරතෙල් මිල ගණන් පහත සාධකවල බලපෑම මත කැපී පෙනෙන උච්චාවචනයන් පෙන්නුම් කළේය. වසරේ මුල් භාගයේදී බොරතෙල් මිල ඉහළ ගිය අතර, මාර්තු මාසයේදී බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිල ඩොලර් 140 දක්වා ඉහළ ගියේය. මෙම වැඩිවීමට මූලික වශයෙන් හේතු වූයේ නැගෙනහිර යුරෝපයේ භූ දේශපාලනික ආතතීන් සහ ප්‍රධාන ඛනිජතෙල් අපනයනකරුවෙකු වන රුසියාවට පැනවූ සම්බාධකයි. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගය දිග හැරෙන විට, ගෝලීය ආර්ථික මන්දගාමිත්වය හේතුවෙන් මිල පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්විය.

2022 අග භාගයේදී බොරතෙල් මිල පහත වැටීමේ ප්‍රවණතාවයට සාධක කිහිපයක් දායක විය. ගෝලීය වර්ධනය මන්දගාමී වීම, ලොව පුරා ප්‍රධාන මහ බැංකු විසින් ආක්‍රමණශීලී මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම (ගෝලීය බලශක්ති ඉල්ලුම අඩු කිරීමට අපේක්ෂා කෙරේ), චීනයේ දැනට පවතින COVID-19 සීමා කිරීම්, සහ එක්සත් ජනපදයේ උපායමාර්ගික සංචිත වලින් බොරතෙල් සැලකිය යුතු ලෙස මුදා හැරීම. එසේ වුවද, 2022 අවසානය දක්වා වරින් වර මිල ඉහළ යාමක් සිදු විය. මේවාට ඔක්තෝබර් මාසයේදී ඛනිජතෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC) සහ එහි සම්බන්ධිත රටවල් විසින් නිෂ්පාදන කප්පාදුව නිවේදනය කිරීම, G7 විසින් රුසියානු බොරතෙල් මත මිල සීමාවක් පැනවීම, දෙසැම්බර් මාසයේ රුසියානු බොරතෙල් ආනයනය සඳහා යුරෝපා සංගමය තහනම් කිරීම සහ චීනයේ ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමේ වැනි කරුණු ඇතුළත් විය.

බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල 2022 දී ඩොලර් 99.06 දක්වා එනම් පෙර වසරේ සාමාන්‍ය බැරලයක මිල වූ ඩොලර් 70.80 ට සාපේක්ෂව 39.9% කින් වැඩි විය. ඒ හා සමානව, බටහිර ටෙක්සාස් අතරමැදි (WTI) මිල 2021 දී බොරතෙල් බැරලයකට ඩොලර් 67.94 වූ අතර එය 2022 දී බැරලයකට ඩොලර් 94.41 ක සාමාන්‍යයක් ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2023 පළමු කාර්තුවේදී ගෝලීය බොරතෙල් මිලෙහි සුළු මධ්‍යස්ථභාවයක් නිරීක්ෂණය විය. මෙම ඉහළ යන ප්‍රවණතාවලට අනුකූලව පෙට්‍රල් (ඔක්ටේන් 92 සහ ඔක්ටේන් 95), ඔටෝ ඩීසල්, සුපර් ඩීසල් සහ භූමිතෙල් ඇතුළු ප්‍රධාන පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදන මිල 2022 දී 40% සිට 75% දක්වා ඉහළ ගියේය.

### ගෝලීය බොරතෙල් මිල ප්‍රවණතා




මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

## ගෝලීය මෙහෙයුම් පරිසරය

**2022 දී, ගෝලීය මෙහෙයුම් පරිසරය භූ දේශපාලනය, ආර්ථිකය, තාක්ෂණය සහ පරිසරය පුරා විහිදුණු අභියෝග සහ අවස්ථා ඔස්සේ සැකසී තිබුණි.**

**භූ දේශපාලනය:** විශේෂයෙන්ම චීනය ගෝලීය ක්‍රීඩකයෙකු ලෙස මතුවීමත් සමඟ බල ගතිකයේ වෙනස්කමක් සිදු විය. ප්‍රධාන ආර්ථිකයන් අතර වෙළඳ බලපෑම් පැවතුන අතර කලාපීය ගැටුම්, ස්ථාවරත්වයේ අභියෝග මතුකරමින් සාමකාමී විසඳුම් සඳහා ජාත්‍යන්තර ප්‍රයත්නයන් දක්නට ලැබුණි. මෙහිදී රුසියාව-යුක්රේන අර්බුදය, රුසියාවට එරෙහිව එක්සත් ජනපදයෙන් සහ යුරෝපා සංගමයෙන් විස්තීර්ණ ආර්ථික සම්බාධක පැනවීම, යුරෝපයේ ගෑස් සැපයුම සහ මිල ගණන් පිළිබඳ උච්චාවචනයන් නිර්මාණය කර ඇත. 2021 අග භාගයේ රුසියානු ගෑස් අලෙවිය අඩුවීම, ගෑස් මිල සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

**ආර්ථික:** ගෝලීය ආර්ථික දැක්ම මගින්, ගෝලීය ආර්ථික වර්ධනයේ පහත වැටීමක් පෙන්නුම් කරන බව සඳහන් කර ඇති අතර, ඇස්තමේන්තුගත ආකාරයට 2022 3.5% සිට 2023 සහ 2024 වර්ෂයේදී එය 3.0% දක්වා සංක්‍රමණය වන බව පුරෝකථනය කර ඇත. පුරෝකථනය අනුව මූල්‍ය උත්තේජක සහ මූල්‍ය ප්‍රතිපත්ති මගින් 2023 අප්‍රේල් ලෝක ආර්ථිකය සාපේක්ෂව සුළු දියුණුවක් පෙන්නුම් කළද, එය තවමත් ඓතිහාසික වර්ධන මට්ටමකට වඩා අඩු බවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, මෙම වෙනස්වීම් වල විෂමතා පැවතුණු අතර, මේ සඳහා සැපයුම් දාම බිඳ වැටීම් වීම සහ රජයේ වියදම් ඉහළ යාම, උද්ධමන පීඩන මතුවීමට හේතු විය. ගෝලීය උද්ධමනය 2022 දී 8.7% සිට 2023 දී 6.8% දක්වා සහ 2024 දී තවදුරටත් 5.2% දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පවතින (මූලික) උද්ධමනය වඩාත් ක්‍රමානුකූල වේගයකින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2024 දී උද්ධමනය ඉහළ යනු ඇති බවට අනාවැකි සංශෝධනය කර ඇත.

**තාක්ෂණය:** නැගී එන තාක්ෂණයන් භාවිතා කිරීම වේගවත් වී, විවිධ කර්මාන්ත ප්‍රතිනිර්මාණය කිරීම සහ නවෝත්පාදනයන් වර්ධනය වීම දක්නට ලැබේ. කෙසේ වෙතත්, මෙහිදී උත්සන්න වන සයිබර් ආරක්ෂණ තර්ජන ශක්තිමත් ආරක්ෂක පියවරයන් සහ ජාත්‍යන්තර සහයෝගීතාවයේ වැදගත්කම අත්‍යවශ්‍යයෙන්, අවධාරණය කර ඇත. තවද 2022 දී, කෘතිම බුද්ධිය (AI) සහ IoT වැනි ඩිජිටල් තාක්ෂණයන් භාවිතය කර්මාන්තය තුළ වැඩි වෙමින් පවතී.

**පරිසරය:** හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමට සහ පිරිසිදු බලශක්ති ප්‍රභවයන් කරා සංක්‍රමණය වීමට දරන ප්‍රයත්නයන් මගින් සනිටුහන් කරන ලද දේශගුණික විපර්යාසවලට විසඳුම් සෙවීමේ හදිසි අවශ්‍යතාව ප්‍රධාන තැනක් ගන්නා ලදී. මෙහිදී ආන්තික කාලගුණික සිදුවීම්වල වැඩිවීම දේශගුණික විපර්යාස හා සම්බන්ධ අවදානම් අවධාරනය කර ඇති අතර, ඒ සඳහා ගෝලීය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීම පිළිබඳ ක්‍රියාකාරකම් වැඩි දියුණු වී ඇත. මීට අමතරව, පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ජෛව විවිධත්වය සහ සංරක්ෂණ ප්‍රයත්නයන් පිළිගැනීමට ලක් වීම කර්මාන්තය කෙරෙහි බලපෑම් එල්ල කරන විශේෂ ලක්ෂණ වී ඇත.

**බලශක්ති සංක්‍රාන්තිය:** ෆොසිල ඉන්ධන වලින් ඉවත්ව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කරා සංක්‍රමණය වීම වේගවත් වෙමින් පවතී. ප්‍රධාන වාහන නිෂ්පාදකයින් අභ්‍යන්තර දහන එන්ජින් වාහන ඉවත් කිරීමට ප්‍රතිඥා දීමත් සමඟ විද්‍යුත් වාහන භාවිතා කිරීම වේගයෙන් වර්ධනය වෙමින් පවතී. සුළං සහ සූර්ය බලශක්ති උත්පාදනය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වන විට, ඒවායේ විචල්‍යතාව සහ බලශක්ති පද්ධතියේ විශ්වසනීයත්වය කෙරෙහි ඇති බලපෑම පිළිබඳ උත්සුකයන් වර්ධනය වී ඇත. ඒ සඳහා ප්‍රතිචාර වශයෙන්, 2023 දී ස්ථිර සහ නම්‍යශීලී පිරිසිදු බලශක්ති විසඳුම් සඳහා වැඩි උනන්දුවක් පවතී. තවද විශේෂයෙන් ජපානය, කැලිෆෝනියා සහ චීනය වැනි වෙළඳපොළවල, බලශක්ති ගබඩා සංකල්පය කෙරෙහි සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කරයි. ජපානය, දකුණු කොරියාව සහ චීනය වැනි රටවල ද න්‍යෂ්ටික බලශක්තිය ව්‍යාප්ත වීමට දැනටමත් අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

**බලශක්ති ප්‍රතිපත්ති:** දැඩි පාරිසරික රෙගුලාසි සහ විමෝචන අඩු කිරීමේ ඉලක්ක හඳුන්වා දීම. හරිතාගාර වායු විමෝචනය මැඩපැවැත්වීම සඳහා කාබන් මිලකරණ යාන්ත්‍රණ, පුනර්ජනනීය බලශක්ති දිරිගැන්වීම් සහ විමෝචන වෙළඳ පද්ධති ක්‍රියාත්මක වෙමින් පවතී.

## ගෝලීය තෙල් කර්මාන්තයේ ගතිකත්වය

**වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ, ගෝලීය තෙල් කර්මාන්තය අභියෝග කිහිපයකට මුහුණ දුන්නද, ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වි ඇත. උච්චාවචනය වන තෙල් මිල කෙරෙහි සැපයුම් ගැලපීම්, භූ දේශපාලනික වර්ධනයන් සහ තිරසාර බලශක්ති ප්‍රභවයන් වෙත දැනට පවතින ගෝලීය මාරුව ඇතුළුව සියුම් සාධක සමතුලිතතාවයක් බලපා ඇත. මෙම සංකීර්ණ පරිසරයේ සැරිසැරීමට අපට සුපරීක්ෂාකාරී අධීක්ෂණයක් පවත්වා ගැනීමට සහ ක්‍රියාශීලී උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය.**

# මෙහෙයුම් පරිසරය

2022 දී ගෝලීය තෙල් කර්මාන්තය සැලකිය යුතු වර්ධනයන් සහ දුෂ්කරතා අත්විඳින ලදී. මෙහිදී 2020 දී COVID-19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑමෙන් පසුව, ආර්ථිකයන් නැවත විවෘත වීමත් සංචාරක සීමාවන් ලිහිල් වීමත් සමඟ තෙල් මිල යථා තත්ත්වයට පත් වීමට පටන් ගත් අතර, මෙම ප්‍රකෘතිය ගෝලීය ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීම සමඟ සමීපව බැඳී පැවතුනත්, සමහර රටවල් අනෙක් ඒවාට වඩා ශක්තිමත් ප්‍රගතියක් පෙන්නුම් කළේය.

මෙම කාල පරිච්ඡේදය තුළ, ඛනිජතෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC) සහ OPEC + හි කාර්යභාරය තෙල් වෙළඳපොළ තුළ ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා වැදගත් මෙහෙවරක් ඉටු කල අතර, 2022 දී, OPEC + වසංගතයට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදන කප්පාදුව ලිහිල් කිරීමට ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කළේය. මෙම උපායමාර්ගය ඵලදායි ලෙස හදිසි තෙල් අධි සැපයුමක් වළක්වා ගත් අතර එමඟින් මිල සඳහා අත්‍යාවශ්‍ය සහය ලබා දී ඇත. මෙහිදී ගෝලීය කර්මාන්තය 2023 වෙත සංක්‍රමණය වන විට, තෙල් වෙළඳපොළ මිල ගණන් සාපේක්ෂ ස්ථාවරත්ව ගමන් පථයක යෙදී තිබුණි.

තෙල් කර්මාන්තය සඳහා අඛණ්ඩ සැලකිල්ලක් ලෙස භූ දේශපාලනික සාධක මතු විය. තෙල් නිෂ්පාදනයේ අතිශය වැදගත් කලාපයක් වන මැදපෙරදිග බලපෑම්, සැපයුම් දාම කඩාකප්පල් කිරීමේ සහ ගෝලීය මිල ගණන් කෙරෙහි පැහැදිලි බලපෑමක් ඇති කිරීමේ විභවය දැරීය. තෙල් නිපදවන කලාපවල ගැටුම් සහ භූ දේශපාලනික සිදුවීම් වෙළඳපොළට සැලකිය යුතු අස්ථාවරත්වයක් ඇති කර තිබුණි. ඔපෙක් + සංවිධානයේ සීමාවෙන් ඔබ්බට, ඔපෙක් නොවන නිෂ්පාදනය, විශේෂයෙන් එක්සත් ජනපදයේ - ෂේල් තෙල් ඇතුළුව, ගෝලීය තෙල් සැපයුමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. OPEC නොවන නිෂ්පාදකයින්ගේ ප්‍රතිචාරයන් මාරු වන වෙළඳපොළ තත්ත්වයන්, මිල මට්ටම් සහ ආයෝජන තීරණ පුළුල් සැපයුම් ගතිකතාවයන් හැඩගැස්වීමට උපකාරී විය. ඔපෙක් + සහ ඔපෙක් නොවන නිෂ්පාදකයින් අතර අන්තර් ක්‍රියාකාරිත්වය ගෝලීය තෙල් සැපයුම් භූ දර්ශනය වින්‍යාස කිරීමේදී එහි ප්‍රධාන භූමිකාව රඳවා ගත්තේය.




| ගෝලීය ඛනිජතෙල් සහ අනෙකුත් ද්‍රව | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| **බ්‍රෙන්ට් බොරතෙල්** | | | | |
| ස්ථාන මිල (බැරලයකට ඩොලර්) | 70.89 | 100.94 | 84.09 | 94.91 |
| **ගෝලීය ද්‍රව ඉන්ධන නිෂ්පාදනය** | | | | |
| (දිනකට බැරල් මිලියන) | 95.70 | 99.95 | 101.26 | 102.19 |
| **OPEC ද්‍රව ඉන්ධන නිෂ්පාදනය** | | | | |
| (දිනකට බැරල් මිලියන) | 31.66 | 34.17 | 33.30 | 33.19 |
| **OPEC නොවන ද්‍රව ඉන්ධන නිෂ්පාදනය** | | | | |
| (දිනකට බැරල් මිලියන) | 64.04 | 65.78 | 67.96 | 69.01 |
| **ගෝලීය ද්‍රව ඉන්ධන පරිභෝජනය** | | | | |
| (දිනකට බැරල් මිලියන) | 97.14 | 99.16 | 100.92 | 102.24 |
| **ගෝලීය නිෂ්පාදනය** | | | | |
| (ප්‍රතිශතය වෙනස් වීම) | 6.4 | 3.3 | 2.9 | 2.6 |

දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ගෝලීය මාරුව තෙල් සමාගම් මත සැලකිය යුතු පීඩනයක් ඇති කළේය. රජයන්, සංස්ථා සහ පාරිභෝගිකයින් හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත සංක්‍රමණය වීම අවධාරණය කළහ. මෙම මාරුව බොහෝ තෙල් සමාගම් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම මගින් ඔවුන්ගේ නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීමට ද හේතු විය. විශේෂයෙන් ප්‍රවාහනය වැනි අංශවල පාරිසරික තිරසාරභාවය ප්‍රමුඛත්වය ලබා ගන්නා බැවින්, විකාශනය වන ඉල්ලුම සපුරාලීමේදී තෙල් කර්මාන්තය අඛණ්ඩ අභියෝගවලට මුහුණ දීමට සිදු වී තිබුණි.

එසේම, තෙල් කර්මාන්තය තාක්ෂණික දියුණුව හරහා කැපී පෙනෙන පරිවර්තනයකට ලක් විය. ඩිජිටල්කරණය, ස්වයංක්‍රීයකරණය සහ කෘතිම බුද්ධිය මෙහෙයුම් විධිමත් කිරීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ තෙල් සමාගම් සඳහා පිරිවැය අඩු කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. මීට අමතරව, දියුණු කැණීම් ශිල්පීය ක්‍රම සහ වැඩිදියුණු කළ තෙල් ප්‍රතිසාධන ක්‍රම මගින් කලින් භාවිතා නොකළ සංචිතවලින් තෙල් නිස්සාරණය කිරීමට හැකි විය. මෙම තාක්ෂණික නවෝත්පාදනයන් මත වෙළඳපොළ ගතිකතාවයන් වෙනස් වන අතර පිරිසිදු බලශක්ති ප්‍රභවයන් සඳහා වැඩිවන ඉල්ලුමට අනුවර්තනය වෙමින් නිෂ්පාදන මට්ටම් පවත්වා ගැනීමට කර්මාන්තයට ඉඩ ලබා දුන්නේය.

### දේශීය ආර්ථිකය

සමාලෝචිත වර්ෂය තුලදී ශ්‍රී ලංකාවේ දේශීය ආර්ථිකයේ සන්දර්භය, සැලකිය යුතු අභියෝගවලින් සමන්විත වී ඇති අතර, මෙහිදී ආර්ථික දුෂ්කරතා සහ ප්‍රතිපත්තිමය දුර්වලතා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ ආර්ථික සමතුලිතතාවය කරා සංක්‍රමණය වීමේ අවශ්‍යතාව තදින්ම මතුවී තිබුණි. ජාතියේ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශවයක් ලෙස, CPSTL උපායමාර්ගික ව්‍යාපාරික භාවිතයන් සහ වගකිවයුතු ආයතනික පුරවැසිභාවය තුළින් ජාතික ආර්ථික ස්ථාවරත්වයට සහාය වීමට කැපවී සිටියේය.

### ආර්ථික අභියෝග

**විනිමය අනුපාතික ස්ථායීකරණය:** ඉල්ලුම් පීඩනයන් විසඳීමට සහ මූල්‍ය ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා පාවෙන විනිමය අනුපාත යාන්ත්‍රණයකට සංක්‍රමණය වීම.

**මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම:** උද්ධමනය මැඩපැවැත්වීම සහ ඉල්ලුම් පීඩනය කළමනාකරණය කිරීම ඉලක්ක කරගත් මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීම සඳහා ස්ථිර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

**විදේශ විනිමය කළමනාකරණය:** අත්‍යාවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය ලබා ගැනීම සහතික කිරීම, ආනයන සඳහා ප්‍රමුඛත්වය දීම සහ ප්‍රාග්ධන පිටතට ගලායාම කළමනාකරණය කිරීම සඳහා පාලන පියවර ක්‍රියාත්මක කිරීම.

| ශ්‍රී ලංකා ආර්ථික දත්ත | | | | | |
|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| **ජනගහනය** | | | | | |
| (මිලියන) | 21.8 | 21.9 | 22.2 | 22.4 | **21.7** |
| **ද.දේ.නි.** | | | | | |
| (ඇ.ඩො. බිලියන) | 89.0 | 84.5 | 88.7 | 74.2 | 94.4 |
| **ඒක පුද්ගල ද.දේ.නි.** | | | | | |
| (ඇ.ඩො.) | 4,084 | 3,855 | 4,003 | 3,315 | 4,357 |
| **ද.දේ.නි.** | | | | | |
| (ශ්‍රී ලංකා රු.) | 15,911 | 15,672 | 17,600 | 24,148 | 15,352 |
| **ආර්ථික වර්ධනය** | | | | | |
| (නාමික ද.දේ.නි., වාර්ෂික වෙනස්වීම %) | 3.6 | -1.5 | 12.3 | 37.2 | 6.7 |
| **ආර්ථික වර්ධනය** | | | | | |
| (ද.දේ.නි., වාර්ෂික වෙනස්වීම %) | -0.2 | -4.6 | 3.5 | -7.8 | 2.3 |

**රජයේ මූල පිරිම්:** ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීම, වියදම් සීමා කිරීම, රජය සතු ව්‍යවසාය (SOEs) ප්‍රතිසංස්කරණය කිරීම, ආනයන පාලනයන් ක්‍රියාත්මක කිරීම සහ බලශක්ති සැපයුම සලාකනය කිරීම ඇතුළුව රජය විසින් මෙහෙයවනු ලබන මූල පිරිම් මාලාවක් ක්‍රියාත්මක කිරීම.

# මෙහෙයුම් පරිසරය

**ජාත්‍යන්තර සහය අපේක්ෂා කිරීම:** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහය ලබා ගැනීම ඇතුළුව ජාත්‍යන්තර සහයෝගය සඳහා මාර්ග ලුහුබැඳීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නවල ක්‍රියාකාරීව නිරත වීම.




**2023 සඳහා ඉදිරි දැක්ම:** වැදගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, පාර්ශවකරුවන් අතර ඵලදායී සම්බන්ධීකරණයක් ඇති කිරීම සහ තිරසාර ආර්ථික ප්‍රගතිය සහ සමෘද්ධිය ළඟා කර ගැනීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට ඉදිරි වසර තුළ සූදානම් වේ.

### ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග

- 2022 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 7.8% කින් හැකිළී ගිය අතර, අමුද්‍රව්‍ය ඇතුළු ආදාන හිඟය සහ සැපයුම් දාම අවහිරවීම් හේතුවෙන් සියලුම ප්‍රධාන අංශවලට, විශේෂයෙන් නිෂ්පාදන හා ඉදිකිරීම්වලට බලපෑම් එල්ල විය.
- ගෝලීය භාණ්ඩ මිල ගණන්, මූල්‍ය හිඟය, මුදල් අවප්‍රමාණය සහ ආහාර සැපයුම් බාධාවන්ගේ බලපෑම මත උද්ධමනය සැප්තැම්බර් මාසයේදී 69.8% දක්වා ඉහළ ගිය නමුත් 2022 වසර සඳහා එය 57.2% කින් අවසන් වීම.
- උද්ධමනය මැඩපැවැත්වීම සඳහා මහ බැංකුව 2022 ජනවාරි සිට ප්‍රතිපත්ති පොලී අනුපාත 1,050 කින් ඉහළ නැංවීම.
- විශේෂයෙන්ම නාගරික සහ වතු ප්‍රදේශවල දරිද්‍රතා අනුපාත වැඩි වීමට තුඩු දුන් කර්මාන්ත හා සේවා අංශයේ රැකියා මිලියන භාගයක් අහිමි වීම.
- අපනයන වැඩි වීම හේතුවෙන් 2022 දී වෙළඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 5.2 දක්වා අඩු වූ නමුත් අඩු මුදල් ප්‍රේෂණ සහ සංචාරක ආදායම් ලැබීම් අඩුවීම, සමස්ත ආදායම් අඩුවීම කෙරෙහි මෙන්ම ආහාර ඇතුළු අවශ්‍යතාවන්හි අනාරක්ෂිත භාවයට හේතු වීම.
- ශ්‍රී ලංකා රුපියල (LKR) එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 78% කින් අවප්‍රමාණය වූ නමුත් අඩු වෙළෙඳපොළ ඉල්ලුම මධ්‍යයේ එය ස්ථාවර වීම.
- ආදායම් ඉහල නැංවීමේ ක්‍රියාමාර්ග සහ පාලන වියදම් අඩු කිරීමේ ක්‍රියාමාර්ග සමඟ මූල්‍ය හිඟය අඩු වූ නමුත් පොලී ගෙවීම් ඉහළ මට්ටමක පැවතීම.
- රට දැඩි විදේශ විනිමය ද්‍රවශීලතා සීමාවන්ට මුහුණ දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන සහ ඖෂධ වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇති වීම.
- ශ්‍රී ලංකාව 2022 අප්‍රේල් මාසයේදී විදේශ ණය සේවා අත්හිටුවීමක් සහ විදේශ විනිමය ප්‍රකාශයට පත් කිරීම සහ කළමනාකරණ උපායමාර්ග මඟින් රටෙහි බාහිර අංශය තරමක් ස්ථාවර කිරීම.
- 2023 මාර්තු මාසයේදී IMF විසින් ඇ.ඩො. බිලියන 2.9 විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහනක් අනුමත කිරීම.
- මෙහිදී, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසංස්කරණ සමඟ රටෙහි, මූල්‍ය ඒකාග්‍රතාවය වර්ධනය අඩාල විය හැකි වුවත්, උද්ධමනය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන අතර ජංගම ගිණුමේ හිඟය අඩු වනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

- මෙහිදී ප්‍රධාන අවාසිදායක අවදානම් අතර මන්දගාමී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක්, සීමිත බාහිර මූල්‍යකරණයක්, ගෝලීය ආර්ථික මන්දගාමිත්වයක් සහ දරිද්‍රතාවයට සහ මූල්‍ය අංශයට අහිතකර බලපෑම් ඇතුළත් වන බව ප්‍රකාශ කිරීම.
- මෙම කාරණා මත අඩු ආදායම් ලාභීන්ට වන බලපෑම් අවම කිරීම හා ජාත්‍යන්තර සහයෝගය මගින් විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීමට සහ ආර්ථික ප්‍රකෘතිය සඳහා ප්‍රාග්ධන ගලා ඒම ආකර්ෂණය කර ගැනීම රටෙහි පාලන තන්ත්‍රයේ ප්‍රධාන අරමුණ වීම.

### දේශීය බලශක්ති අංශය

2022 දී විදේශ විනිමය ද්‍රවශීලතාවයේ හිඟය හේතුවෙන් ශ්‍රී ලංකාව දැඩි ඉන්ධන අර්බුදයකට මුහුණ දුන් අතර මෙම අර්බුදය සමාජ නොසන්සුන්තාව සහ ඉන්ධන පිරවුම්හල්වල දිගු පෝලිම් ඇති කිරීමට හේතු විය. මෙහිදී, අර්බුදය සමනය කිරීම සඳහා රජය කෙටි කාලීන ණය පහසුකම් සුරක්ෂිත කිරීම, මිල සූත්‍ර සංශෝධනය, ඉන්ධන බෙදා හැරීම කළමනාකරණය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය.

2023 මුල් භාගයේදී යම් මධ්‍යස්ථ බවක් පෙන්නුම් කළද, භූ දේශපාලනික බලපෑම් සහ සැපයුම් බාධාවන් විසින් මෙහෙයවනු ලබන ගෝලීය බොරතෙල් මිල ඉහළ මට්ටමක පැවතුනි.

මෙම අභියෝග මධ්‍යයේ වුවද, කර්මාන්ත, කෘෂිකර්මාන්තය සහ සංචාරක ව්‍යාපාරය වැනි අත්‍යාවශ්‍ය අංශවලට සහාය වෙමින් ඉන්ධන සැපයුම සහ මිලකරණය ස්ථාවර කිරීමට ශ්‍රී ලංකාව උනන්දුවෙන් ක්‍රියා කළේය. මෙම ප්‍රයත්නයන් ආර්ථික ක්‍රියාකාරකම් තිරසාරව පවත්වාගෙන යාමට සහ COVID-19 න් පසු සංචාරක කර්මාන්තයේ ප්‍රකෘතිය සඳහා පහසුකම් සැලසීමට තීරණාත්මක විය.

ඉන්ධන සහ ගල් අඟුරු හිඟය, විදේශ විනිමය සීමා කිරීම් සහ ජලාශ ජල මට්ටම් පහත වැටීම හේතුවෙන් විදුලිය සැපයීමේදී විදුලි අංශ ද සැලකිය යුතු අභියෝගවලට මුහුණ දුන් අතර මෙය ආර්ථිකයට බලපෑ දිගු විදුලිය ඇනහිටීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජල විදුලිය, දැවි තෙල් මත පදනම් වූ සහ ගල් අඟුරු බල උත්පාදනයේ දායකත්වය අඩු වීමත් සමඟ 2022 දී මුළු විදුලි ජනනය 4.6% කින් අඩු විය. මෙම ගැටලු විසඳීමට මහ බැංකුව සහ බලධාරීන් විසින් ගල් අඟුරු ප්‍රසම්පාදන අරමුදලක් පිහිටුවීම ඇතුළු තවත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී.

**විදුලිබල සහ බලශක්ති අංශයේ උත්සන්න වුණු අවදානම් හේතුවෙන් හදිසි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට සිදුවිය.**



# මෙහෙයුම් පරිසරය

### දේශීය ඛනිජතෙල් කර්මාන්තය

ශ්‍රී ලංකාවේ සංකීර්ණ මෙහෙයුම් පරිසරය ඛනිජතෙල් කර්මාන්තයට සෘජුවම බලපෑ අතර ප්‍රධාන සමාගම් දෙකක් වන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) නියාමන අධීක්ෂණය යටතේ දේශීය ඛනිජතෙල් කර්මාන්තයට සම්බන්ධ විය.

වසර පුරාවටම ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ගෝලීය තෙල් මිල උච්චාවචනයන්, ආනයන වියදම්, බදු සහ රජයේ රෙගුලාසි හේතු වූ අතර, සාමාන්‍ය ජනතාව මුහුණ දෙන ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් පිරිවැය ප්‍රතිසාධනය සහ පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල අතර සමතුලිතතාවයක් ඇති කිරීම සඳහා බලධාරීන් ඉන්ධන මිල ප්‍රවේශමෙන් කළමනාකරණය කළහ.

චීන, ඇමරිකානු සහ ඕස්ට්‍රේලියානු සමාගම් ඇතුළු විදේශීය තෙල් සමාගම් සඳහා ශ්‍රී ලංකාවේ දේශීය සිල්ලර වෙළඳපොළ මෑතකදී විවෘත කිරීම සමස්ත කර්මාන්තයටම බලපෑම් ඇති කරනු ඇති බව පුනරාකථනය කර ඇත.

විදේශ විනිමය ද්‍රවශීලතාවයේ ඌනතාවය හේතුවෙන් ආනයනය අඩුවීම, දේශීය ඛනිජතෙල් නිෂ්පාදනවල ඉහළ මිල ගණන්, ඉන්ධන සලාකනය සහ වසර පුරා පැවති ආර්ථික ක්‍රියාකාරකම් පහත වැටීම ඇතුළු සාධකවල ප්‍රතිඵලයක් ලෙස 2022 දී ඛනිජතෙල් නිෂ්පාදනවල දේශීය විකුණුම් පරිමාව පහත වැටුණි.

මෙම තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා රජය 2022 අගෝස්තු මාසයේ සිට QR කේතය පදනම් කරගත් ඉන්ධන සලාක ක්‍රමයක් ක්‍රියාවට නංවමින් ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ග හඳුන්වා දෙන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ දේශීය වෙළෙඳපොළේ සැපයුම සහ ඉල්ලුම සමතුලිත කිරීමය. මෙහිදී, ඊට ප්‍රතිවිරුද්ධව, එම කාලසීමාව තුළ LIOC හි විකුණුම් පරිමාවන් කැපී පෙනෙන වර්ධනයක් අත්විඳින ලද අතර, ඊට ප්‍රධාන වශයෙන් CPC හි ඉන්ධන සැපයුමේ අඩාල වීම හේතු විය.

වාසිදායක ජලාශ මට්ටම්වල සහය ඇතිව ජලවිදුලි උත්පාදනය වැඩි කිරීම දෙසට මාරුවීම සහ විදේශ විනිමය බාධාවන් මත සීමිත ඉන්ධන සැපයුම හේතුවෙන් අඛණ්ඩ විදුලිය ඇනහිටීම්, බලශක්ති උත්පාදන අංශයෙන් සමස්ත ඉන්ධන ඉල්ලුම අඩුවීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළදී බලශක්ති උත්පාදනය සඳහා ඉන්ධන අලෙවිය 6.8% කින් අඩු විය.

2022 වසර පුරාවටම සපුගස්කන්ද පිරිපහදුව දින 225කට ආසන්න කාලයක් අක්‍රීයව පැවතියේ එහි ක්‍රියාකාරීත්වයට අවශ්‍ය බොරතෙල් නොලැබීම හේතුවෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස, පිරිපහදුවෙහි සැකසූ සමස්ත බොරතෙල් පරිමාව 2022 වසර තුළ 58.4% කින් පහත වැටුණි. තවද, ඩීසල්, පෙට්‍රල්, දැවි තෙල් සහ නැප්තා ඇතුළු ප්‍රධාන පෙට්‍රෝලියම් නිෂ්පාදන නිෂ්පාදනය මෙම කාලය තුළ පිළිවෙලින් 65.4%, 68.8%, 45.7% සහ 71.2% කින් සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි.

2022 වසර තුළ, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සැලකිය යුතු බාධකවලින් සලකුණු කරන ලද අභියෝගාත්මක මූල්‍ය දර්ශනයකට මුහුණ දුන්නේය.

2022 දී CPC හි මූල්‍ය කාර්ය සාධනයේ එක් ප්‍රධාන විශේෂත්වයක් වූයේ එහි මෙහෙයුම් පාඩුව පෙර වසරට සාපේක්ෂව අවම වීමයි. විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලින් හෙළි වූයේ CPC හි මෙහෙයුම් අලාභය 2022 වසර තුළ රු. බිලියන 6.2 ක් බවයි. මෙය පෙර වසරේ මෙහෙයුම් අලාභය වූ රු. බිලියන 41.3 ට සාපේක්ෂව සැලකිය යුතු දියුණුවක් පෙන්විය. ගෝලීය බොරතෙල් මිලෙහි කැපී පෙනෙන උච්චාවචනයන් මධ්‍යයේ වුවද, නියමිත පරිදි සිදු කල මිල සංශෝධනවල බලපෑම මෙම දියුණුවට හේතු විය. කෙසේ වෙතත්, CPC මුහුණ දුන් වැදගත්ම අභියෝගය වූයේ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීමයි. 2022 මාර්තු සිට මැයි දක්වා මෙසේ දැඩි ලෙස රුපියල අවප්‍රමාණය වූ අතර මෙම අවප්‍රමාණයේ ප්‍රතිඵලයක් ලෙස CPC සඳහා රු. බිලියන 527.0 ක පමණ විනිමය හුවමාරු අලාභයකට මුහුණ දීමට සිදු විය. මෙම දැවැන්ත අලාභය CPC හි සමස්ත මූල්‍ය කාර්ය සාධනය මත සැලකිය යුතු බරක් පැටවූ අතර, සමස්ත පාඩුව (බදු ගෙවීමට පෙර) 2022 දී රු. බිලියන 615.1 ක් ලෙස සනිටුහන් විය. මෙය රු. බිලියන 81.8 ක් ලෙස පසුගිය වසරේ වාර්තා විය.

මෙම දරුණු අභියෝග මධ්‍යයේ වුවද, පිරිවැය පරාවර්තක මිල ගැලපීම් ක්‍රියාත්මක කිරීම සහ විනිමය හුවමාරු අනුපාත ස්ථායීකරණය මෙන්ම රුපියලේ අගය වර්ධනය වීමත් සමග CPC 2022 ජූලි මාසයේ සිට මාසික ලාභ (බදු ගෙවීමට පෙර) වාර්තා කිරීමට පටන් ගැනීමට CPC සමත් විය.

මෙලෙස විනිමය අනුපාතිකයේ ධනාත්මක විචල්‍යතා ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ CPC හි රජයේ සහතික කළ ඩොලර් බිලියන 2.5 ක විදේශ මුදල් ණය තොගය රජයේ ශේෂ පත්‍රයට පැවරීමයි. මෙම උපායමාර්ගික පියවර 2021 අවසානයේ

ඇමරිකානු ඩොලර් බිලියන 3.4 සිට 2022 අවසන් වන විට ඩොලර් බිලියන 0.2 දක්වා පහත වැටුණු CPC හි හිඟ විදේශ මුදල් වර්ග ණය සහ ආනයන බිල්පත් සැලකිය යුතු ලෙස අඩු කළේය.

මීට අමතරව, CPC හි මූල්‍ය ක්ෂේත්‍රය රාජ්‍ය සංස්ථා වෙතින් ලැබිය යුතු සමස්ත වෙළඳ ලැබිය යුතු මුදල් ප්‍රමාණය 2022 අවසන් වන විට රු. බිලියන 220.3 ක් දක්වා සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹුකල අතර මෙය 2021 වසර අවසානයේදී රු. බිලියන 59.3 ක් විය. මෙම වෙළඳ ලැබිය යුතු මුදල් අතර, ශ්‍රී ලංකන් ගුවන් සමාගම (SLA) සහ ලංකා විදුලි බල මණ්ඩලය (CEB) කැපී පෙනුණු අතර, එය 2022 අවසානයේ සමස්ත වෙළඳ ලැබිය යුතු මුදල් වලින් පිළිවෙළින් 49.3% ක් සහ 31.1% ක් විය. විනිමය අනුපාතිකයේ තියුණු අවප්‍රමාණයවීම් සමග සමපාත වෙමින්, CPC වෙත SLA හි වගකීම් සඳහා සිදු කරන ලද සමානාත්මතා ගැලපීම හේතුවෙන්, 2022 තුළ SLA වෙතින් ලැබිය යුතු ශේෂයේ රුපියලේ අගය සැලකිය යුතු ලෙස වැඩි වීමද සිදු විය.

## LPG ගෑස්

2022 දී, විදේශ විනිමය හිඟය හේතුවෙන් LPG (ද්‍රව පෙට්‍රෝලියම් ගෑස්) සැපයීමේදී ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් වසරේ මුල් භාගයේදී සැලකිය යුතු බාධා වලට මුහුණ දුන්නේය. මෙම හිඟය නාගරික සහ අර්ධ නාගරික කුටුම්භ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, ලෝක බැංකුවේ මූල්‍ය ආධාර සහ විදේශ විනිමය ද්‍රවශීලතාවය ඉහළ නැංවීමට මහ බැංකුව ගත් උත්සාහයන් සමග, LPG ආනයනය පහසු කර, සාමාන්‍ය සැපයුම යථා තත්ත්වයට පත් කරන ලදී.

2022 අගෝස්තු මාසයේදී රජය විසින් දේශීය LPG මිල තීරණය කිරීම සඳහා පිරිවැය පරාවර්තක සූත්‍රයක් අනුමත කරන ලද අතර එය එම මාසයේ සිට ක්‍රියාත්මක කරන ලදී. ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ

### ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරිත්වය

| ශීර්ෂය | | 2021 (අ) | 2022 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|---|
| | | | | 2021(අ) | 2022(ආ) |
| ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000) | | | | | |
| බොරතෙල් | | 1,182 | 649 | -29.1 | -45.1 |
| පිරිපහදු නිෂ්පාදිත | | 4,553 | 3,927 | 13.0 | -13.8 |
| ගල් අඟුරු | | 2,206 | 1,707 | -15.1 | -22.6 |
| එල්.පී. ගෑස් | | 422 | 290 | -3.3 | -31.2 |
| දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000) | | 17 | 6 | -34.1 | -65.8 |
| ආනයන වටිනාකම (මි.ර.ගැ.) | | | | | |
| බොරතෙල් | (රු.මිලියන) | 123,865 | 157,408 | 15.0 | 27.1 |
| | (එ.ජ.ඩො. මිලියන) | 625 | 484 | 7.2 | -22.6 |
| පිරිපහදු නිෂ්පාදිත | (රු. මිලියන) | 564,681 | 1,294,311 | 75.5 | 129.2 |
| | (එ.ජ.ඩො. මිලියන) | 2,840 | 4,048 | 63.0 | 42.5 |
| ගල් අඟුරු | (රු.මිලියන) | 55,118 | 99,949 | 37.1 | 81.3 |
| | (එ.ජ.ඩො. මිලියන) | 278 | 365 | 27.8 | 31.3 |
| එල්. පී. ගෑස් | (රු.මිලියන) | 64,436 | 75,882 | 47.1 | 17.8 |
| | (එ.ජ.ඩො. මිලියන) | 324 | 234 | 37.2 | -27.8 |
| බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.) | | | | | |
| | (රු./බැරල්) | 13,645 | 32,573 | 62.2 | 138.7 |
| | (එ.ජ.ඩො./බැරල්) | 68.86 | 100.11 | 51.1 | 45.4 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය | (මෙ.ටො. '000) | 853 | 641 | 7.0 | -24.9 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම | | | | | |
| | (රු.මිලියන) | 100,975 | 177,194 | 46.7 | 75.5 |
| | (එ.ජ.ඩො. මිලියන) | 506 | 568 | 35.6 | 12.2 |
| දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000) | | 4,447 | 3,833 | -3.3 | -13.8 |
| ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (ඇ) | | 1,238 | 1,119 | 8.7 | -9.6 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | | 116 | 69 | -3.5 | -40.7 |
| සුදු ඩීසල් (ඈ) | | 1,875 | 1,693 | 7.1 | -9.7 |
| සුපිරි ඩීසල් | | 75 | 78 | 8.2 | 5.0 |
| භූමිතෙල් | | 185 | 98 | 5.6 | -46.9 |
| දැවිතෙල් | | 720 | 496 | -25.8 | -31.1 |
| ගුවන්යානා ඉන්ධන | | 224 | 246 | 18.6 | 9.8 |
| නැප්තා | | 11 | 32 | -93.5 | 203.6 |
| දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000) | | 457 | 294 | -3.3 | -35.6 |
| දේශීය මිල (වසර අවසානයේ දී) (රු./ලීටර) | | | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | | 177.00 | 370.00 | 29.2 | 109.0 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | | 207.00 | 510.00 | 28.6 | 146.4 |
| සුදු ඩීසල් | | 121.00 | 420.00 | 16.3 | 247.1 |
| සුපිරි ඩීසල් | | 159.00 | 510.00 | 20.5 | 220.8 |
| භූමිතෙල් | | 87.00 | 365.00 | 24.3 | 319.5 |
| දැවිතෙල් | | | | | |
| තත්පර 800 | | 110.00 | 320.00 | 57.1 | 190.9 |
| තත්පර 1,500 | | 110.00 | 320.00 | 57.1 | 190.9 |
| එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්) | | | | | |
| ලිට්‍රෝ ගෑස් | | 214.00 | 368.80 | 79.2 | 72.3 |
| ලාෆ්ස් ගෑස් | | 227.20 | 424.00 | 90.2 | 86.6 |
| ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් (එ.ජ.ඩො./බැරල්) | | | | | |
| බ්‍රෙන්ට් | | 70.80 | 99.06 | 63.3 | 39.9 |
| ඩබ්.ටී.අයි. | | 67.94 | 94.41 | 70.8 | 39.0 |
| ඛනිජ තෙල් සහ අනෙකුත් ද්‍රව ඉන්ධන | | | | | |
| ලෝක සැපයුම (දිනකට බැරල් මිලියන) | | 95.7 | 99.9 | 1.9 | 4.3 |
| ලෝක ඉල්ලුම (දිනකට බැරල් මිලියන) | | 97.1 | 99.4 | 5.6 | 2.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ඈ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම
ලංකා මැරීන් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය
එ.ජ. බලශක්ති තොරතුරු පරිපාලනය

# මෙහෙයුම් පරිසරය

ලාෆ් ගෑස් පීඑල්සී වැනි සමාගම් ගෝලීය මිල උච්චාවචනයන්ට ප්‍රතිචාර වශයෙන් වසර පුරා ඔවුන්ගේ දේශීය LPG මිල ගණන් වෙනස් කළහ. වෙනස් වන වෙළඳපොළ තත්ත්වයට සමගාමීව මිල ගණන් අවස්ථා කිහිපයකදී ඉහලට සහ පහලට සංශෝධනය කරන ලදී.

තවද, LPG ආනයනය සඳහා වන මූල්‍ය බර ලිහිල් කිරීම සඳහා, LP ගෑස් ආනයනය සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද (PAL) ආනයන වියදමෙන් 7.5% සිට 2.5% දක්වා අඩු කරන ලද අතර, එය 2023 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වේ. මෙම අඩු කිරීම, LPG ගෑස් වඩා දැරිය හැකි සහ පාරිභෝගිකයින්ට ප්‍රවේශ විය හැකි මට්ටමට පත් කිරීම අරමුණු කර ගෙන ඇත.

ගෝලීය බලශක්ති වෙළඳපොළේ සැපයුම් දුර්වලතාවයන් හේතුවෙන් ගෝලීය LPG මිල අප්‍රේල් මාසයේදී මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 954 දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ඒවා ක්‍රමයෙන් මධ්‍යස්ථ වූ අතර, 2022 දෙසැම්බර් වන විට මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 650 දක්වා එනම් 31.9% කින් පමණ පහත වැටුණි. ගෝලීය පරිභෝජන ඉල්ලුම අඩුවීම මෙම පහත වැටීමට මූලික වශයෙන් හේතු විය.

මෙම මධ්‍යස්ථභාවය තිබියදීත්, ගෝලීය LPG මිල සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවති අතර, 2023 පළමු කාර්තුව අවසන් වන විට මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 700 ට වඩා ඉහළ මට්ටමක පැවතුනි. මෙයින් ඇඟවෙන්නේ 2022 තුළ මිලෙහි සැලකිය යුතු පහත වැටීමක් තිබුණද, ඒවා තවමත් ඉහළ මට්ටම් රඳවාගෙන ඇති බවයි.

### ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්වල කාර්ය සාධනය



**ප්‍රවාහන ක්‍රියාකාරකම් අඩාල වීම**




## නව මෝටර් වාහන ලියාපදිංචිය

| වර්ගය | 2021 | 2022 (අ) | වර්ධනය (%) 2021 | වර්ධනය (%) 2022 (අ) |
|---|---|---|---|---|
| **නව මෝටර් වාහන ලියාපදිංචිය (ගණන)** | **33,850** | **20,510** | **-83.3** | **-39.4** |
| බස් රථ | 281 | 404 | -51.4 | 43.8 |
| මෝටර් කාර් | 3,495 | 1,489 | -83.4 | -57.4 |
| ත්‍රිරෝද රථ | 2,093 | 36 | -70.7 | -98.3 |
| ද්විත්ව කාර්ය වාහන | 771 | 760 | -91.9 | -1.4 |
| යතුරු පැදි | 8,011 | 9,060 | -94.7 | 13.1 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 4,432 | 1,832 | 12.5 | -58.7 |
| ගොඩබිම් වාහන | 14,764 | 6,929 | 77.8 | -53.1 |
| Quadricycles සහ මෝටර් නිවාස | 3 | - | -99.4 | - |

(අ) තාවකාලික

*මූලාශ්‍රය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

# මෙහෙයුම් පරිසරය

### දුම්රිය ප්‍රවාහනය

2022 දී, ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) COVID-19 වසංගතයෙන් පසුව මහජන සංචලනය වෙත ක්‍රමානුකූලව නැවත පැමිණීමක් පෙන්නුම් කරමින් එහි මෙහෙයුම් කාර්ය සාධනයේ සාමාන්‍ය දියුණුවක් දක්නට ලැබුණි. SLR හි ඇස්තමේන්තුගත සමස්ත ක්‍රියාත්මක කිලෝමීටර් ප්‍රමාණය සහ මඟී කිලෝමීටර් ප්‍රමාණය 2022 වසර තුළදී පිළිවෙලින් 67.3% කින් සහ 205.9% කින් සැලකිය යුතු වැඩි වීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, භාණ්ඩ ප්‍රවාහනය (භාණ්ඩ කිලෝමීටර් ප්‍රමාණයෙන් මනිනු ලැබේ) 2021 වසරට සාපේක්ෂව 14.2% ක අඩුවීමක්, එනම් පෙර වසරේ අගය වූ මෙට්‍රික් ටොන් කිලෝමීටර් මිලියන 161.6 ට සාපේක්ෂව 2022 දී එය මෙට්‍රික් ටොන් කිලෝමීටර් මිලියන 138.7 ක් විය.

2022 දී, ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) මූල්‍ය අභියෝගවලට මුහුණ දුන් අතර, එහි මෙහෙයුම් අලාභය රු. බිලියන 12.4 ක් දක්වා වැඩි වී ඇත්තේ 2021 දී තිබූ රුපියල් බිලියන 10.3 ක අලාභයට සාපේක්ෂවය. කෙසේ වෙතත්, SLR හි මුළු ආදායම රු. බිලියන 8.4 සිට රු. බිලියන 11.1 ක් දක්වා වර්ධනය වී ඇත. මෙම ආදායම් වැඩිවීම මූලික වශයෙන් 2022 ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද ගාස්තු ඉහළ නැංවීම හා මඟී ප්‍රවාහන ක්‍රියාකාරකම් වල වැඩි වීම මත පදනම් විය.

2022 දී, SLR හි මුළු වියදම් රු. බිලියන 2.1 කින් වැඩි වූ අතර එය රුපියල් බිලියන 42.5 ක් ලෙස සටහන් විය. මෙලෙස වියදම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉහළ පුනරාවර්තන වියදම් හා මූලික වශයෙන් වසර පුරා සිදු වූ ඉන්ධන මිල ගැලපීමයි. නමුත්, 2022 වසර තුල ප්‍රාග්ධන වියදම් 30.7% කින් පහළ ගොස් තිබූ අතර, 2022 තුල සමස්ථ ප්‍රාග්ධන වියදම රු. බිලියන 19.0 ක් ලෙස සටහන් විය.

### ගුවන්

2022 දී, COVID-19 වසංගතයෙන් පසුව ගෝලීය සංචාරක ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ සිවිල් ගුවන් සේවා අංශය සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය. පෙර වසරට සාපෙක්ෂව 266.8% ක ආකර්ෂණීය වර්ධනයක් සනිටුහන් කරමින් 2022 දී මඟී සංචලන මිලියන 5.5 දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනයට බොහෝ දුරට හේතු වී ඇත්තේ ගෝලීය සංචාර නැවත ආරම්භ කිරීම සහ 2021 දී වාර්තා වූ අඩු සංඛ්‍යානමය පදනමයි. කෙසේ වෙතත්, භාණ්ඩ හැසිරවීම පෙර වසරට සාපෙක්ෂව 9.3% ක හැකිලීමක් අත්විඳ ඇති අතර, මෙය මුළු මෙට්‍රික් ටොන් 166,969 ක් ලෙස සටහන් විය.

2022 අවසානය වන විට, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ගුවන් සේවා 33 ක් සහ අභ්‍යන්තර ගුවන් සේවා පහක් සඳහා සත්කාරකත්වය ලබා දී, සමස්ථ ගුවන් යානා චලනයන් 42,196 කට දායක වූ අතර, එය 68.2% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (BIA) පමණක් ගුවන් යානා චලනයන්හි සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර, වසර තුළ චලනයන් 41,547 ක් දක්වා එනම් 70.7% කින් වර්ධනය විය.

### ඛනිජ තෙල් මිල ගණන්




බෙදහරින ලද ප්‍රමාණය



## නියාමන සහ නීතිමය පරිසරය

### වත්මන් නියාමන රාමුව

ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ සමස්ථ නියාමන අධිකාරිය බලශක්ති අමාත්‍යවරයා සතු වේ. මෙහිදී, ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් කර්මාන්තය නියාමනය කිරීම දැනට පාලනය වන්නේ 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත මගිනි.

මීට අමතරව, පහත සඳහන් රෙගුලාසි කර්මාන්තයේ අදාළ ක්‍රියාකාරකම් නියාමනය කරනු ඇත.

- 2007 අංක 7 දරණ සමාගම් පනත
- 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත
- 1954 සාප්පු සහ කාර්යාල සේවක පනත
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත

### සැපයුම් දාමය සහ යටිතල පහසුකම්

අපගේ සැපයුම් දාමයේ ප්‍රධාන අංග සහ අපගේ මෙහෙයුම් සඳහා සහාය වන තීරණාත්මක යටිතල පහසුකම් තුල ඇතුළත් වන්නේ;

පිරිපහදු හුවමාරු කිරීම් සහ නළ මාර්ග ඔස්සේ බෙදා හැරීම්: අප පිරිපහදුව කොළොන්නාවට සම්බන්ධ කරන නල මාර්ග තුනක ජාලයක් භාවිතා කරන අතර, ආරක්ෂිත සහ කාර්යක්ෂම නිෂ්පාදන හුවමාරුවක් සහතික කර ඇත.

**තොග බෙදා හැරීමේ කාර්යය:** අපගේ දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලය මාර්ග සහ දුම්රිය ඇතුළු විවිධ ක්‍රම හරහා තොග ඛනිජතෙල් නිෂ්පාදන කාර්යක්ෂමව ලබා දෙන අතර, I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ තොග ගබඩා වල උපාය මාර්ගික ඉන්ධන කළමනාකරණය අපගේ සැපයුම් දාමය වැඩිදියුණු කරයි. තවද ගුවන් තොටුපළ වෙත දෛනික ගුවන් ඉන්ධන බෙදා හැරීම, බාධාවකින් තොර ගුවන් මෙහෙයුම් සහතික කරයි.

**මුතුරාජවෙල පර්යන්තය:** 2004 සිට ක්‍රියාත්මක වන මෙම පර්යන්තය 2008 දී පෙට්‍රල් 92 ඔක්ටේන් සහ අඩු සල්ෆර් ඩීසල් තෙල් හැසිරවීම දක්වා පුළුල් විය. ඒ සඳහා වෙන් කරන ලද ලැබීම් නල මාර්ග දෙකක් සහ ද්විත්ව මාර්ග බෝයාව භාවිතා කරයි.

**අක්වෙරළ මෙහෙයුම්:** අපගේ අක්වෙරළ කණ්ඩායම අභියෝගාත්මක තත්ත්වයන් ආරක්ෂිතව පාලනය කරමින් මුතුරාජවෙල බෝයාව වෙත ඉන්ධන නැව් පැමිණීම කළමනාකරණය කරයි. මූරිං මාස්ටර්, කිමිදුම්කරුවන් සහ සමුද්‍ර සවිකරන්නන් ආරක්ෂිත ගොඩබෑම සහතික කරන අතර අපගේ නඩත්තු සහ හදිසි ප්‍රතිචාර යාත්‍රාව (MERV) හදිසි අවස්ථා සඳහා සූදානම්ව සිටී.

**කොළොන්නාව පර්යන්තයෙන් බෙදා හැරීම:** අපගේ කොළොන්නාව පර්යන්තය මධ්‍යම කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කරන අතර, දුම්රිය බෙදාහැරීම්, නල මාර්ග මාරු කිරීම් සහ ඛනිජතෙල් නිෂ්පාදන (PPP) ගබඩා කිරීම සඳහා සහාය වේ.

# මූල්‍ය ප්‍රාග්ධනය

### මූල්‍ය කාර්ය සාධනය

#### ආදායම

2022 වර්ෂය තුළ බොහෝ ආර්ථික අභියෝග යටතේ, සමාගමේ ආදායම පෙර වසරට සාපේක්ෂව 34% කින් පහත වැටී ඇති අතර, ප්‍රධාන වශයෙන් සමාගමේ විකුණුම් පරිමාව අඩුවීම එයට හේතු විය. 2022 වසරේ ඉන්ධන සැපයුම් දාමයේ අර්බුදය හේතුවෙන් සීමිත ඉන්ධන තොගයක් තිබීම සමාගමේ විකුණුම් පරිමාවට බෙහෙවින් බලපෑ අතර 2021 වසරට සාපේක්ෂව, 2022 දී විකුණුම් පරිමාව 17% කින් අඩු වී ඇත.

**විකුණුම් පරිමාව (කි.ලී. මිලියන)**




#### ලාභදායීත්වය

ආදායම පහත වැටීමෙන් පසුව, පෙර වසරට සාපේක්ෂව 2022 දී දළ ලාභය 56% කින් පහත වැටී ඇත. ඒ අනුව 2022 වසරේ දළ ලාභ ආන්තිකය 28% දක්වා පහත වැටුණු අතර 2021 වසරේ එය 41%ක් විය.

**ආදායම සහ දළ ලාභ ආන්තිකය (රු. මි)**




2022 වර්ෂයේ සමාගමේ මෙහෙයුම් අලාභය රු. බිලියන 0.9 ක් සහ මෙහෙයුම් අලාභ ආන්තිකය 10% ක් වූ අතර 2021 වර්ෂයේ දී මෙහෙයුම් ලාභ ආන්තිකය 10% ක් විය.

**මෙහෙයුම් කාර්ය සාධනය**




**බදු පෙර හා බදු පසු ලාභය (රු. මිලියන)**




සමාලෝචිත වර්ෂය තුළ බදු පෙර අලාභය රු. බිලියන 0.7 ක් වන අතර එය 2021 වර්ෂයේ බදු පෙර ලාභයට සාපේක්ෂව 324% පහත වැටීමකි. 2022 වර්ෂය තුළ පුද්ගල පිරිවැය, කාර්ය මණ්ඩල සුබසාධනය වැනි වියදම් වලින් යම් පිරිවැයක් ඉතිරියක් සිදු වුවද, එම ඉතුරුම් ආදායම් පහත වැටීම ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් නොවීය. ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වය යටතේ පවා සෘජු වියදම් සහ පරිපාලන වියදම් පිළිවෙලින් 19% කින් සහ 3% කින් පහත වැටුණි.

මූල්‍ය ආදායම සමන්විත වන්නේ ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම, REPO තැන්පතු සහ කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොලී ආදායමෙන් වන අතර 2022 වර්ෂයේදී තැන්පතු සඳහා වන පොලී අනුපාත වැඩිවීම නිසා මූල්‍ය ආදායම 42% කින් ඉහළ ගියේය. සමාලෝචිත වර්ෂය සඳහා බදු ගෙවීමෙන්

පසු අලාභය රු. බිලියන 1 ක් වූ අතර එය 210% ක පහත වැටීමකි. ප්‍රධාන වශයෙන් 2022 වර්ෂයේදී විකුණුම් පරිමාව අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස ආදායම අඩුවීම එයට හේතු විය. 2022 වර්ෂයේ ආදායම් බදු වියදම් රු. මිලියන 354 ක් වූ අතර බදු අනුපාතය 24% සිට 30% දක්වා ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ විලම්භිත බදු වියදමේ බලපෑම එයට හේතු විය.

සමාගමේ අනෙකුත් විස්තීර්ණ ආදායම (OCI) ප්‍රධාන වශයෙන් නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් මත ශුද්ධ ආයුගණන අලාභයෙන් සමන්විත වේ.

### මූල්‍ය තත්ත්වය

#### මුළු වත්කම්

**මුළු වත්කම් සංයුතිය**




**මුළු වත්කම් වර්ධනය (රු. මිලියන)**




ශේෂ පත්‍රයෙහි බහුතරය ජංගම නොවන වත්කම් වන අතර එය මුළු වත්කම්වලින් 48% ක් විය. ජංගම වත්කම් අතරින් වැඩි ප්‍රමාණයක් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වන අතර එය මුළු වත්කම් වලින් 32% ක් විය. නියමිත වේලාවට ලැබිය යුතු මුදල් නොලැබීම නිසා වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ එකතු වී ඇත. අනෙකුත් මූල්‍ය වත්කම් සහ මුදල් පිළිවෙළින් 5% සහ 6% ක ප්‍රතිශතයක් නියෝජනය කරයි.

2022 වර්ෂය අවසානයේ දී මුළු වත්කම් පදනම රුපියල් බිලියන 33.4 ක් වූ අතර එය 2021 වර්ෂයේ දී වාර්තා කළ රුපියල් බිලියන 34 ට සාපේක්ෂව 2% ක අඩුවීමකි. ආර්ථිකයේ මන්දගාමිත්වය හේතුවෙන් උද්ධමනය සහ ආදායම් අඩුවීම නිසා මුදල් සහ මුදල් සමාන දෑ අඩු විය.

#### කාරක ප්‍රාග්ධනය

ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය 2022 වසර අවසන් වන විට පිළිවෙලින් 5.36 සහ 5.06 ලෙස වාර්තා වූ අතර ජංගම වගකීම් වැඩි වීම ජංගම වත්කම් අඩු වීම හේතුවෙන් අනුපාත දෙකම පෙර වසරට වඩා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

# මූල්‍ය ප්‍රාග්ධනය

**ජංගම/ ක්ෂණික වත්කම් අනුපාතය (වාර)**




**මූල්‍යකරණ සංයුතිය**




## වත්කම් පිරිවැටුම් අනුපාතය (Asset Turnover Ratio)

වත්කම් පිරිවැටුම් අනුපාතය මගින් ආයතනයෙහි වත්කම් විකුණුම් උත්පාදනය සඳහා යොදාගැනීමේ කාර්යක්ෂමතාවය පෙන්නුම් කරයි. ආදායම පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස 2021 දී 43% ක් වූ වත්කම් පිරිවැටුම් අනුපාතය 2022 දී 28% ක් දක්වා සැළකිය යුතු ලෙස අඩු විය. 2022 වසරේ පැවති සමාගමට පාලනය කළ නොහැකි ආර්ථික තත්ත්වය හේතුවෙන් විකුණුම් උත්පාදනය සඳහා වත්කම් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව අඩු වී ඇත.

**වත්කම් පිරිවැටුම් අනුපාතය**




## හිමිකම් සහ වගකීම්

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) කොටස් හිමියන්ගේ අරමුදල් වූ රු. බිලියන 27.2 සමාගමේ වත්කම්වලින් 81%ක් මූල්‍යකරණය කරයි. 2016 දී සමාගම සියලු ණය ගෙවා ඇති අතර මේ වසරට නව ණය ගැනීම් නැත. CPSTL හි සම්පූර්ණ වගකීම් 2021 දී රු. බිලියන 6.0 සිට 2022 දී රු. බිලියන 6.2 දක්වා ඉහළ ගොස් ඇත.

## හිමිකම් මත ප්‍රතිලාභ

පෙර වර්ෂයේ වාර්තා වූ +4% ට සාපේක්ෂව 2022 දී, සමාගම -4% ක හිමිකම් මත ප්‍රතිලාභ වාර්තා කර ඇත. 2022 වර්ෂයේ දී බදු පසු අලාභයක් වාර්තා වීම ප්‍රධාන වශයෙන් මෙම අඩු වීමට හේතුවී ඇත.

**හිමිකම් මත ප්‍රතිලාභ %**




## තෝලනය සහ ප්‍රාග්ධන ව්‍යුහය

සමාගමේ වත්කම්වලින් 77%ක් හිමිකම් ප්‍රාග්ධනය හරහා අරමුදල් සපයන අතර ඉතිරි 23% දිගුකාලීන සහ කෙටි කාලීන වගකීම් මගින් මූල්‍යකරණය කෙරේ. එය 2021 වර්ෂයේ දී, හිමිකම් ප්‍රාග්ධනය මගින් 79% ක් හා වෙනත් කෙටිකාලීන සහ දිගුකාලීන ප්‍රාග්ධන මූලාශ්‍ර මගින් 21% ක් විය. පහත ප්‍රස්ථාරවල දැක්වෙන පරිදි, බදු පසු අලාභයක් වාර්තා වීම හේතුවෙන් හිමිකම් ප්‍රාග්ධනයේ දායකත්වය 2021 වසරට සාපේක්ෂව 2022 දී සුළු වශයෙන් අඩු වී ඇත.

සමාගමේ තෝලන අනුපාතය වසර ආරම්භයේ 21% ට සාපේක්ෂව 2022 වසර අවසානයේ 23% දක්වා වැඩි වී ඇත.

### අරමුදල් මූලාශ්‍ර (රු. මිලියන)




### කොටස් හිමියන්ගේ වටිනාකම් නිර්මාණය

| | 2022 | 2021 |
|---|---|---|
| කොටසක ඉපයීම (රු.) | (1.41) | 1.56 |
| කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | 36 | 37 |

කොටසක ඉපයීම 2022 දී (1.41) වන අතර එය 2021 දී 1.56 කි. 2022 වසර අවසානයේ දී කොටසක ශුද්ධ වත්කම් අගය 37 ගුණයක සිට 36 ගුණයක් දක්වා අඩු වී ඇත. 2022 වර්ෂයේ දී බදු පසු අලාභයක් වාර්තා වීම කොටසක ඉපයීම අඩුවීමට හේතු වී ඇති අතර කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම අඩුවීමට හේතු වී ඇත්තේ සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ වත්කම්වල අඩුවීමයි.

### කොටසක ඉපයීම (රු.)




### තෝලන අනුපාතය (වාර)




### කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

### 1. මුතුරාජවෙල යටිතල පහසුකම් සංවර්ධනය

දෛනිකව ඉන්ධන මෙට්‍රික් ටොන් 500ක් නිෂ්පාදන තුනකින් (ඩීසල්, දැව්තෙල් සහ භූමිතෙල්) බෙදාහැරීමේ අරමුණින් 2004 වර්ෂයේදී ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සමස්ථ කාර්යමණ්ඩලය 52කින් යුක්තව මුතුරාජවෙල තොග ගබඩා පර්යන්තය ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, ඉන්ධන සඳහා වැඩි වූ ඉල්ලුම හේතුවෙන් ඉහත නිෂ්පාදන තුනට අමතරව, පෙට්‍රල් බෙදා හැරීම ආරම්භ කිරීමට සිදුවූ අතර වර්තමානයේ දෛනිකව ඉන්ධන මෙ.ටොන් 6000ක් පමණ මුතුරාජවෙලින් බෙදාහරිනු ලබන්නේ 306 කින් යුතු කාර්ය මණ්ඩලයක දායකත්වයෙනි. අනාගතයේදී රට තුල ඉන්ධන සඳහා ඇති ඉල්ලුම මේ ආකාරයෙන් පවත්වාගැනීම හෝ වැඩිකිරීම සඳහා දැනට මුතුරාජවෙල පර්යන්තයෙන් කෙරෙන සැපයුම් ප්‍රමාණය අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ.

කෙසේ වෙතත්, මුතුරාජවෙල පර්යන්තය සැළසුම් කිරීමේදී, සේවකයින් 52 ක් සඳහා පමණක් ලබා දී ඇති යටිතල පහසුකම් වත්මන් කාර්ය මණ්ඩලය සඳහා කිසිදු ලෙසකින් ප්‍රමාණවත් නොවේ.

වාහන නැවැත්වීමේ පහසුකම්, නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සඳහා ගබඩා පහසුකම් වැඩි කිරීම, ආරක්ෂක අංශ කාර්යාලය, සේවක විවේකාගාර සහ ආපනශාලා නවීකරණය යනාදිය ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩිදියුණු කිරීම් වන අතර තව ද, කාර්ය මණ්ඩල නිල නිවාස, ඉන්වොයිස් කාර්යාලයක් සහ සම්මන්ත්‍රණ ශාලාවක් මෙම නවීකරණ ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට තීරණය කර ඇත. හරිත ගොඩනැගිලි සහ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සංකල්පවලට අනුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

කොළොන්නාව පර්යන්තය සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අනෙකුත් තොග බෙදාහැරීමේ මධ්‍යස්ථාන හා සසඳන විට මුතුරාජවෙල යනු සමාග මට වැඩි කාර්යක්ෂමතාවකින් ප්‍රශස්ථ ප්‍රතිඵල ලබා දෙන අර්ධ ස්වයංක්‍රීය පර්යන්තයකි. පිරවුම් ගැන්ට්‍රියේ සියලුම මැදිරි මාර්ග ටැංකි 10ක් පැටවීමේ හැකියාව ඇති අතර මාර්ග ටැංකියක හැරවුම් කාලය අනෙකුත් ස්ථාපනයන්ට සාපේක්ෂව අඩුය. මීට අමතරව, SPBM -02 හිදී ගොඩබාන නිෂ්පාදන වරාය ගාස්තුවලට යටත් නොවී සෘජුවම මුතුරාජවෙල වෙත යවනු ලැබේ. තවත් සැලකිය යුතු වාසියක් වන්නේ පර්යන්තය 2019 වසරේ සිට ක්‍රියාත්මක පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ (OCE) පිහිටා තිබීමයි. කොළඹින් ආරම්භ වන අධිවේගී මාර්ග නිසා මුතුරාජවෙල පර්යන්තයේ සිට අවම මෙහෙයුම් පිරිවැයකින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ළඟා වීමට හැකිවේ. මුතුරාජවෙල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් භූගෝලීය ස්ථානගත කිරීමේ උපායමාර්ගික වාසිය ප්‍රශස්ත කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, වාස්තුවිද්‍යාත්මක හා ව්‍යුහාත්මක සේවා, මැනුම් සහ ස්ථාන පරීක්ෂණ කටයුතු සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මගින් උපදේශකයෙකුගේ සේවාව ලබා ගන්නා ලදි. පරිශීලක අංශය (MT) මගින් ප්‍රමුඛතා අයිතම හඳුනාගෙන ඇති අතර ලංසු ලේඛනය සහ ඇස්තමේන්තු, ඇඳීම් ඒ අනුව සංශෝධනය කෙරේ. පවතින අයවැය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය.





## 2. කලාප 6 හි නළ පද්ධතිය වැඩිදියුණු කිරීම



දිවයිනේ ඉන්ධන සඳහා ඇති ඉල්ලුම වාර්ෂිකව ක්‍රමයෙන් වර්ධනය වේ. ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මෙම ඉල්ලුම සපුරාලීම සඳහා ගැන්ට්‍රිවල පෙට්‍රල් පිරවුම් ධාරිතාව ඉහළ නැංවීමට සැළසුම් කර ඇත. නව ඉහළ ධාරිතාවකින් යුත් පොම්ප ස්ථාපනය කිරීම මගින් කලාප 07 හි ඇති පෙට්‍රල් පිරවීමේ ගැන්ට්‍රිය වැඩි දියුණු කෙරේ. කොළොන්නාව කලාප 06 හි නව නිපැයුම් පොම්පාගාරය ඉදිකරන ලදී.



සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 36 ක් වැය වූ අතර, පොම්පාගාර ඉදිකිරීම් කටයුතුවලට සමගාමීව නල මාර්ගයේ අගලක් ඉදිකිරීම ද සිදු කෙරිණ. අගල් ඉදිකිරීම සාර්ථකව නිමකර ඇති අතර, නල මාර්ග යේ සමස්ත ආයෝජනය රු. මිලියන 50කි. 2019 මූල්‍ය වර්ෂයට අදාළව පයිප්ප, කපාට සහ පීඩන මානයන් වැනි අනෙකුත් උපාංග මිලදී ගැනීම් සඳහා සැළසුම් කර ඇත. ප්‍රසම්පාදනයේ මුළු වටිනාකම රු. මිලියන 55.7 කි.

නල නිෂ්පාදනය පිරිවිතර API 54L - බී ශ්‍රේණිය දරණ රුමේනියාවේ වානේ කම්හලේ ප්‍රමිතියට අනුකූලව සිදු කරනු ලැබේ. තෙවන පාර්ශවීය පරීක්ෂණයකින් පයිප්ප සාර්ථකව පරීක්ෂා කර ඇත. 2022 වර්ෂය තුළ රුපියල් මිලියන 60 ක ආයෝජනයකින් නල ආධාරක ඉදිකිරීම ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය 2024 පළමු කාර්තුවේදී නිම කිරීමට නියමිතය.





# නිෂ්පාදිත ප්‍රාග්ධනය

### 3. කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා දැනට පවතින 14" නල මාර්ගය ප්‍රතිස්ථාපනය කිරීම

කොළඹ වරායේ Dolphin Tank Berth (DTB) සිට කොළොන්නාව පර්යන්තය වෙත ආනයනය කරන ලද කළු තෙල් මාරු කිරීම සඳහා 14" නල මාර්ගය භාවිතා කරයි. නල මාර්ගයේ සම්පූර්ණ දිග මීටර් 7200 ක් වන අතර උප මුහුද සහ වෙරළබඩ කොටස් වලින් සමන්විත විය. කොළඹ වරායේ DTB සිට Tunnel Gate දක්වා (මීටර් 1750) කොටස වසර 23 ක් පැරණි වන අතර කොළඹ වරායේ Tunnel Gate සිට කොළොන්නාව ස්ථාපනය දක්වා (මීටර් 5750) කොටස වසර 50 ක් පමණ පැරණි වේ. කොළඹ වරායේ Tunnel Gate සිට කොළොන්නාව දක්වා කොටසේ නිතර නිෂ්පාදන කාන්දුවීම් සිදුවී ඇති අතර තත්ත්වය තක්සේරු කිරීම සඳහා එම කොටස ඉංජිනේරු කාර්යාංශයේ පරීක්ෂණ ඒකකය විසින් පරීක්ෂා කරන ලදී. පරීක්ෂා කිරීමේ ප්‍රතිඵල අනුව නල මාර්ගයේ බිත්ති ඝණත්වය පිළිගත හැකි අතර දැනට පවතින ආලේපනය ප්‍රතිස්ථාපනය කිරීමෙන් සහ ප්‍රාදේශීය විඛාදන ඇති ප්‍රදේශ අලුත්වැඩියා කිරීමෙන් නල මාර්ගය වසර 10 කට වැඩි කාලයක් භාවිතා කළ හැකිය.

ඒ අනුව අවශ්‍යතාවය සලකා බලා ප්‍රතිස්ථාපන කටයුතු සිදු වෙමින් පවතී. ව්‍යාපෘතිය 90% ක් අවසන් කර ඇති අතර ඉතිරිය 2023.09.30 වන විට අවසන් කිරීමට නියමිතය.









### 4. ගාල්ල තොග ගබඩාවේ පිහිටි ටැංකි අංක 04 සහ 05 සඳහා අභ්‍යන්තර පාවෙන වහලවල් සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම සහ ටැංකි අලුත්වැඩියා කිරීම.

අභ්‍යන්තර පාවෙන වහලවල් (IFR) සවි කිරීම ඇමරිකානු පෙට්‍රෝලියම් ආයතනය (API) විසින් නිර්දේශ කරන ලද ක්‍රමවේදයකි. CPSTL විසින් පසුගිය කාලයේ කොළොන්නාව පර්යන්තය සහ ලංකා තොග ගබඩාවල පෙට්‍රල් ටැංකි සඳහා වාෂ්පීකරණ පාඩු අවම කිරීමට IFR හඳුන්වා දෙන ලදී. අදාළ ප්‍රමිති මගින් (API 650) වාෂ්පීකරණ පාඩු අවම කිරීම සඳහා IFR ස්ථාපනය කිරීම නිර්දේශ කරයි.

ටැංකි අංක 04, සිරස්, කේතු/ස්ථිර වෑල්ඩින් කරන ලද 425m$^3$ ක ගබඩා ධාරිතාවයකින් සමන්විත වන අතර ටැංකි අංක 05 මීට වසර 20 කට පෙර ඉදිකරන ලද ගාල්ල තොග ගබඩාවේ පිහිටි 335m$^3$ ක ගබඩා ධාරිතාවයකින් යුත් සිරස්, කේතු/ස්ථාවර වෑල්ඩින් කරන ලද ඉන්ධන ගබඩා ටැංකියකි.

වාෂ්පීකරණ පාඩු අවම කිරීම සඳහා අංක 04 සහ 05 ටැංකි පීඩන වැකුම් කපාට (PVV) සමඟ ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත්, ටැංකියට නිෂ්පාදන ලබා ගැනීමේදී සහ තාපය හේතුවෙන් පෙට්‍රල් වාෂ්ප ටැංකි වලින් පිටතට යන බැවින් PVV සමඟ ඇති පාඩු ඉතා ඉහළ ය.

ගාල්ල තොග ගබඩාවේ පිහිටි ටැංකි අංක 04 සහ ටැංකි අංක 05 හි අභ්‍යන්තර පාවෙන වහලවල් සවිකර අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2023 දෙසැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය.





### 5. කුරුණෑගල තොග ගබඩාවේ නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම

කුරුණෑගල තොග ගබඩාව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නව පිරවුම් ගැන්ට්‍රිය ඉදිකර ඇති අතර එම ව්‍යාපෘතිය යටතේම නිෂ්පාදන නල මාර්ග ස්ථාපනය කිරීම අවසන් කිරීමට නියමිතව ඇත.

මෙම නිෂ්පාදන නළ මාර්ග ප්‍රධාන පොම්පාගාරයේ සිට පොළවට ඉහළින් තැබීමට සහ ගැන්ට්‍රි නළ මාර්ගවලට සම්බන්ධ කිරීමට සැලසුම් කර ඇත. අභ්‍යන්තර පාවෙන වහල සහිත LS 92 ගබඩා ටැංකි වෙත ගිනි පෙණ පෝෂණය කරන නල මාර්ග හා ආරක්ෂිත ක්‍රියාකාරීත්වය සඳහා සුදුසු ස්ථානයක පෙන පෝෂක ස්ථාපනය කරන අතර ආරක්ෂිතව ක්‍රියාත්මක වීම සඳහා සුදුසු ස්ථානයක ටැංකි ඩ්‍රෙනේච් නල මාර්ග සහ පෝෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

අතහැර දමා ඇති සහ තාවකාලික නල මාර්ග ඉවත් කිරීම සහ නිෂ්පාදන පොම්ප ප්‍රධාන පොම්පාගාරය වෙත ගෙන යාම, අංගනය කොන්ක්‍රීට් කිරීම සහ අවශ්‍ය විදුලි සවිකිරීම් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ඇතුළත් විය යුතුය. අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මුළු අයවැය රු. මිලියන 29.9 ක් වෙන් කරන ලදී. දැනට, ව්‍යාපෘතිය 80% නිම කර ඇති අතර 2023 පෙබරවාරි වන විට අවසන් කිරීමට නියමිතය.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය









### 6. කොළොන්නාව පර්යන්තයේ CCTV කැමරා පද්ධතිය සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව නිමාව ආරක්ෂකමය වශයෙන් අවදානමට ලක්විය හැකි ස්ථානයක් වන අතර අන්තර්ජාලය ඔස්සේ නිරීක්ෂණය කිරීමට මෙන්ම අධිකරණමය අවශ්‍යතා සඳහා දත්ත ගබඩා කිරීමට CCTV කැමරා පද්ධතියක් තිබීම අත්‍යවශ්‍ය වේ. තවද, ටැංකි අංගන, පොම්පාගාර සහ අනෙකුත් වැදගත් ස්ථාන අන්තර්ජාලය හරහා සහ අධිකරණමය අවශ්‍යතා සඳහාද නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. එබැවින් මේ සඳහා විශ්වාසදායක සහ ඵලදායී CCTV පද්ධතියක් කොළොන්නාව පර්යන්තයේ ස්ථාපිත කිරීමට සිදුවේ.

CCTV කැමරා පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 125.0 කට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. විවෘත ලංසු කැඳවන ලද අතර, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් පසුව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගන්නා ලදී. ඒ අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව, 2021.11.01 වන දින ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පරිශ්‍රය භාර දෙන ලදී.

කොන්ත්‍රාත්කරු 34% ක් ක්ෂේත්‍ර වැඩ නිම කළ අතර, ගෝලීය ආර්ථික තත්ත්වය හේතුවෙන් විදේශ මුදල් හිඟය සහ ආනයන සීමා කිරීම් හේතුවෙන් කොන්ත්‍රාත්කරුට කැමරා මිලදී ගැනීම ඉදිරියට ගෙන යාමට නොහැකි විය. අර්බුද ප්‍රතිචාර සැලැස්මකට එකඟ වී ඇති අතර, ව්‍යාපෘතිය සංශෝධිත කාලසටහනක් සමගින් සිදුවෙමින් පවතී.

## 7. CPSTL මුතුරාජවෙල පර්යන්තයේ බවුසර් රථ නැවැත්වීමේ පහසුකම

රුපියල් මිලියන 66.62 ක අරමුදල් ප්‍රතිපාදන සහිතව වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට CPSTL මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලද අතර මුතුරාජවෙල පර්යන්තය අසල අක්කර 2 රූඩ් 3 පර්. 34.51 ක් වෙන් කිරීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) එකඟ විය. 2019.12.17 දින ඉඩම මිලදී ගැනීම සඳහා රුපියල් 272,622,128.00 ක මුදලක් ගෙවා ඔප්පුව අත්සන් කර ඉඩම අත්පත් කර ගන්නා ලද අතර සන්තකය CPSTL විසින් පවරා ගන්නා ලදී. ඒ අනුව, වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධනය සඳහා ලංසු ලේඛනයක් සකස් කරන ලදී.

මේ අතර, CPSTL ඉඩම පිටුපස ඉඩම SLLDC විසින් ගොඩ කර ඇති අතර, එබැවින් CPSTL ඉඩමද ගොඩ කිරීමට අවශ්‍ය විය. එබැවින්, SLLDC වෙතින් මිල කැඳවීමක් ලබාගෙන ඇති අතර එය රු. මිලියන 42.4 කි. තවද මෙම ගොඩකිරීම සඳහා රැඳවුම් බිත්තියක් සහිත වැටක් ද ඉදි කළ යුතුය. ඒ අනුව, මෙම ව්‍යාපෘති තුන එනම්, SLLDC මගින් ඉඩම ගොඩකිරීම, පරිමිතිය වැටවල් සහ බවුසර් නැවැත්වීමේ පහසුකම් සඳහා මිලියන 123.02 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

ඉඩම ගොඩකිරීමේ ව්‍යාපෘතිය දැනටමත් SLLDC වෙත ලබා දී අවසන් කර ඇත. ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා අනෙකුත් ව්‍යාපෘති දෙක සඳහා ලංසු කැඳවීමට නියමිතය. කෙසේ වෙතත්, RDA මාර්ගය මීටර් 0.8 කින් ඉහළ නැංවීමට කටයුතු කර ඇති අතර භූමිය තවදුරටත් ඉහළ නැංවීමට සිදුව ඇත. ඒ අනුව අවශ්‍ය මට්ටමට අමතර ගොඩ කිරීම් සිදුකරමින් බවුසර් රථ නැවැත්වීමේ පහසුකම සංවර්ධනය කිරීමට නියමිත අතර පොදු ලංසු තැබීමේ ක්‍රමයට ලංසු කැඳවීමට නියමිතය.

## 8. මුතුරාජවෙල ද්විත්ව මාර්ග බෝයාව

Dry Docking of SPBM - Muthurajawela

පිරිපහදු කළ නිමි නිෂ්පාදිත (ගෑස්තෙල්, පෙට්‍රල්) සහ දැවි තෙල් ගොඩබෑමේ අරමුණින්, 18" නල මාර්ගයක් හරහා මුතුරාජවෙල ටැංකි අංගනය දක්වා දිවෙන මුතුරාජවෙල ද්විත්ව මාර්ග බෝයාව 2010 වර්ෂයේදී ස්ථාපනය කරන ලදී. මේ සඳහා වෙනම හෝස් නුල් 2ක් ඇත. මුතුරාජවෙල SPBM යනු ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට පමණක් නොව, මුළු දිවයිනටම වැදගත්වන්නා වූ යටිතල පහසුකම්වලින් එකකි. නිමි නිෂ්පාදිත රටට ගොඩබෑමේ ප්‍රධාන ස්ථානයක් වන අතර මුතුරාජවෙල පර්යන්තයට නිෂ්පාදිත ගොඩබෑමේ එකම පහසුකම ද වේ.

SPBM මුතුරාජවෙල හරහා වාර්ෂිකව ඉන්ධන සාමාන්‍යයෙන් ටැංකි 40ක් පමණ මෙට්‍රික් ටොන් බිලියනයකට වඩා වැඩි තොගයක් මුදා හරිනු ලැබේ.

වසර 08 ක සාර්ථක ක්‍රියාකාරීත්වයකින් පසු, 2017 සැප්තැම්බර් මාසයේ බහු නිපැයුම් බෙදහැරීම් ඒකකයේ (MPDU) දැවි තෙල් පද්ධතියෙහි බෝයාවේ කාන්දුවක් මතු විය. එය අලුත්වැඩියාවෙන් පසුව ද, ප්‍රධාන නඩත්තුවක් සිදු කළ යුතු නිවැරදි කාල පරාසය හඳුනා ගැනීම සඳහා පද්ධතිය CPSTL විසින් සමීපව නිරීක්ෂණය කළේය.

ඉහත මුදා කාන්දුවට අමතරව 2019 දී තාක්ෂණික කණ්ඩායම් විසින් ගෑස් තෙල් පද්ධතියෙන් තවත් කුඩා MPDU මුදා කාන්දුවක් හඳුනා ගන්නා ලදී. නිෂ්පාදකයාගේ නිර්දේශය මත තාක්ෂණික කණ්ඩායම බෝයාවේ තත්ත්වය විශ්ලේෂණය කළේය. ඒ අනුව තවදුරටත් ප්‍රමාද නොකොට බෝයාව නිෂ්පාදකයාගේ අධීක්ෂණය යටතේ සමස්ත අලුත්වැඩියාවක් සිදු කිරීමට තීරණය විය. තවත් වසර 5 සිට 8 දක්වා කාලයක් මුහුදේ භාවිතා කිරීමට හැකිවන ලෙස මුතුරාජවෙල බෝයාව නැවත සකස් කිරීම වියළි තටාකය මගින් සිදු කෙරුණු අතර එසේ කෙරුණේ පළමු වරට ය.

01. බහු නිෂ්පාදන බෙදාහැරීමේ ඒකකය (MPDU) සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම,

02. බඳ සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පින්තාරු කිරීම,

03. භ්‍රමණය වන පද්ධතිය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම,

04. බෝයාවේ කැතෝඩික් ආරක්ෂණ පද්ධතිය සම්පූර්ණයෙන්ම ප්‍රතිස්ථාපනය කිරීම,

මෙහිදී සිදුකෙරුණු ප්‍රධාන අලුත්වැඩියාවන් ලෙස දැක්විය හැක.

ජාත්‍යන්තරව පිළිගත් තුන්වන පාර්ශ්වයේ මග පෙන්වීම සහ IMODCO සේවයේ බෝයා නිෂ්පාදකයා ගේ අධීක්ෂණය යටතේ මෙම අලුත්වැඩියාව සිදු කෙරේ.

වියළි තටාකයේ අලුත් වැඩියාවෙන් පසු SPBM හි ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය වසර 05ක කාලයකට සහතික කෙරේ. බෝයා මෙහෙයුම් සඳහා ද්විත්ව මාර්ග මගින් අනෙකුත් ප්‍රතිලාභ ද ලබා ගත හැකිය. කලින් එක් පේළියක් පමණක් ක්‍රියාත්මක බෝයා මෙහෙයුම් අලුත්වැඩියාවෙන් පසු වඩා කාර්යක්ෂම විය.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය







# මානව ප්‍රාග්ධනය




අපගේ සංවිධානය තුළ මානව ප්‍රාග්ධනය අපගේ වටිනාම වත්කම ලෙස පවතින අතර එය සාමූහික දැනුම, කුසලතා, පළපුරුද්ද මෙන්ම පුහුණුව සහ යහපැවැත්ම සඳහා ආයෝජනය කිරීම යනාදී වටිනාකම් වලින් සමන්විත වේ. ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, එනම් අපගේ ව්‍යාපාරය විශිෂ්ඨත්වය කරා ගෙන යාම සඳහා සාමූහිකව සහ තනි තනිව වැදගත් කාර්යභාරයක් ඉටු කරන අපගේ සේවකයින් අප ව්‍යවසායයේ තීරණාත්මක සාධකයක් බව අපි විශ්වාස කරමු. අපගේ මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ කැපවීමෙහි අපි ස්ථිරව සිටින අතර සේවකයින්ගේ වෘත්තීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සහ ඔවුන්ගේ කාර්ය සාධන දායකත්වය සාධාරණ ලෙස හඳුනා ගැනීම සඳහා වූ ශක්තිමත් මානව සම්පත් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කර ඇත.

අප ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ක්ෂේත්‍ර

- සේවක විවිධත්වය සහ සමාන අවස්ථා
- සාධාරණ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ
- ත්‍යාග සහ ඇගයීම
- පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය
- සෞඛ්‍යය සහ ආරක්ෂාව

ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, CPSTL හි සුවිශේෂී සේවා පරිසරයක් නිර්මාණය කිරීම මගින් සිය ශ්‍රම බලකාය සඳහා වටිනාකමක් උත්පාදනය කිරීම කෙරෙහි අතිශයින් අවධානය යොමු කරන අතර මෙම පරිසරය විශිෂ්ඨත්වය අත්කර ගැනීමට ඉහළ පෙළඹවීමක් ඇති කණ්ඩායම් සහ පුද්ගලයින්ගෙන් සමන්විත වේ. මෙම පරමාර්ථය සඳහා අපගේ කැපවීම ශක්තිමත් පාලන ව්‍යුහයන්, විස්තීරණ ප්‍රතිපත්ති රාමු සහ කාර්යක්ෂම පද්ධති සහ ක්‍රියාවලීන් පිහිටුවීම තුළින් පිළිබිඹු වන අතර මේවා ඉතා සූක්ෂම ලෙස සැලසුම් කර ඇත්තේ සේවක ඵලදායිතාව ඉහළ නැංවීමට සහ ආයතනය සිය කාර්ය මණ්ඩලය සඳහා වටිනාකම් පෝෂණය කරන ආකාරය අවධාරණය කිරීමට ය. සේවකයන් 2,474 දෙනෙකුගෙන් සමන්විත CPSTL හි ශ්‍රම බලකාය, අපගේ මූලික ආයතනික වටිනාකම් විදහා දක්වමින් අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ගාමක බලවේගය ලෙස සේවය කරයි.

### සේවක විවිධත්වය සහ සමාන අවස්ථා ලබාදීම

සමානාත්මතාවය පෙරදැරි කරගත් අපගේ මානව සම්පත් ක්‍රියාවලිය හරහා, බඳවා ගැනීමෙන් පසු ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ආගම, වයස, ජාතිකත්වය, සිවිල් තත්ත්වය හෝ දේශපාලන දැක්ම නොසලකා, වැටුප් හා උසස්වීම් සඳහා පුහුණු අවස්ථා සියල්ල ලබා දෙමු. විවිධ පසුබිම්, සමාජ තත්ත්වය, අධ්‍යාපනය, පළපුරුද්ද සහිත සේවකයින් සාදරයෙන් පිළිගන්නෙමු. විවිධත්වය ඔස්සේ සෑම පුද්ගලයෙකුටම

# මානව ප්‍රාග්ධනය

අද්විතීය, නිර්මාණාත්මක කුසලතා සහ අදහස් වඩා ගැනීමට සහ ආයතනයට වඩා උසස් සේවයක් ලබාදීමට මෙන්ම ආයතනයෙන් රටට ඉටුවන මෙහෙවර පුළුල් වීමට ද එයින් අවකාශ සැලසේ. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් 3 දෙනෙකු දැනට ආයතනයේ විවිධ කාර්යාංශ තුල සේවයේ යොදවා ඇත. එසේම සියලුම ජාතීන් සහ ආගම් ආවරණය වන පරිදි රටේ සියලූම දිස්ත්‍රික්කවලින් සේවකයින් බඳවා ගනු ලැබේ. කාන්තා සේවිකාවන් සමස්ත සේවක සංඛ්‍යාවෙන් 12%ක් නියෝජනය කරයි. අප නියැලී සිටින කර්මාන්තයේ ස්වභාවය අනුව විධායක නොවන ශ්‍රේණිවල කාන්තා නියෝජනය සාපේක්ෂව අඩු අතර විධායක ශ්‍රේණිවල කාන්තා නියෝජනය 30%කි.




### වරප්‍රසාද, ප්‍රතිලාභ සහ ඇගයීම්

පසුගිය අර්බුද සමයේ පවා 100%ක් සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය සහතික කරමින් වේතන ගෙවීම් පවත්වා ගෙන ගියේය.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි ප්‍රතිලාභ සහ ඇගයීම් ව්‍යුහයන් විනිවිදභාවය සහිතව සාධාරණ ලෙස සැළසුම් කර ඇත. එය කාන්තාවන් සහ පිරිමින් අතර කිසිදු විෂමතාවයක් නොමැතිව ව්‍යාපාරය පුරා ඒකාකාරී ප්‍රමිතීන් පවත්වාගෙන යන ශ්‍රේණිවලට එරෙහිව සාධාරණව සහ සාධාරණ ලෙස මිණුම් සලකුණු කර ඇත. නිර්වචනය කරන ලද නිපුණතා රාමුවක් මත පදනම්ව සියලූම සේවකයින්ගේ වාර්ෂික කාර්ය සාධනය ඇගයීම්වලට භාජනය වේ.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් එහි ස්ථිර ශ්‍රම බලකායට ලබාදෙන ප්‍රතිලාභ පහත පරිදි වේ.

| ස්ථිර සේවකයින් සඳහා හිමිවන ප්‍රතිලාභ | විස්තර |
|---|---|
| නිවාඩු | |
| ▪ වාර්ෂික නිවාඩු | දින 14 |
| ▪ අනියම් නිවාඩු | වැඩ කරන දින 7 |
| ▪ අසනීප නිවාඩු | වැඩ කරන දින 21 |
| ▪ මාතෘ නිවාඩු | ▪ වැඩකරන දින 84ක් සඳහා |
| | ▪ අර්ධ වැටුප් දින 84ක් සඳහා |
| | ▪ වැටුප් රහිත නිවාඩු දින 84ක් සඳහා |
| ▪ හදිසි අනතුරු නිවාඩු | රාජකාරියේ යෙදී සිටියදී සේවක අනතුරු |
| ▪ හිලව් නිවාඩු | මාසයේ සෙනසුරාදා දින 4 සේවය කරන සේවකයාට දින 2ක නිවාඩු සහ අතිකාල ලබා ගත හැක |
| ▪ විශේෂ නිවාඩු | විශේෂ සිදුවීම් අතරතුර (මැතිවරණය, ඇඳිරි නීතිය ආදිය) |
| ▪ රාජකාරි නිවාඩු | නිල රාජකාරි සඳහා විශේෂ අවස්ථා වලදී |
| ▪ වැටුප් රහිත නිවාඩු | විදේශ අධ්‍යයන, පුහුණුව, වැඩමුළු ආදිය සඳහා |
| වැටුප් වර්ධක | සේවක රාජකාරි, පැමිණීම සහ හැසිරීම ඇගයීම මත වැටුප් වැඩිවීම |
| දීමනා | ආහාර දීමනා, ගමන් දීමනා, පර්යන්ත දීමනා, පැමිණීමේ දිරි දීමනා, සේවා මුර දීමනා, වාර්ෂික නිවාඩු දිරි දීමනා, ජීවන වියදම් දීමනා, වෘත්තීය දීමනා, සති අන්ත දීමනා, නිල දුරකථන ප්‍රතිලාභ ආදිය |

| ස්ථිර සේවකයින් සඳහා හිමිවන ප්‍රතිලාභ | විස්තර |
|---|---|
| ප්‍රසාද දීමනා | වාර්ෂික ප්‍රසාද දීමනා |
| ණය | |
| ▪ ආපදා ණය | මාස 10 ක වැටුප, සරල සහනදායී පොලී අනුපාතය, මාසික වාරික 60 කින් අයකරගැනීම |
| ▪ නිවාස ණය | ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම හෝ නිවාස ඉදිකිරීම. සරල සහනදායී පොලී මාසික වාරික 300 කින් අයකරගැනීම හෝ සේවකයාගේ ඉතිරි සේවා කාලය අනුව අයකරගැනීම |
| ▪ නිවාස අලුත්වැඩියා ණය | නිවාස අලුත්වැඩියා කිරීම සඳහා, සරල සහනදායී පොලී අනුපාතය, මාසික වාරික 120 කින් ආපසු අයකරගැනීම |
| ▪ ගෘහ පහසුකම් ණය | ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට සරල සහනදායී පොලී අනුපාත. මාසික වාරික 60කින් අයකරගැනීම |
| ▪ සකසුරුවම් සමිති ණය | මාස 03 ක වැටුප. සරල සහනදායී පොලී අනුපාත, මාසික වාරික 60කින් අයකරගැනීම |
| ▪ මෝටර රථ ණය | මෝටර රථ ණය අදාල වන්නේ විධායකයින් සඳහා පමණි. සරල සහනදායී පොලී අනුපාත. මාස 60 කින් අයකරගැනීම |
| ▪ මෝටර් සයිකල් ණය | සරල සහනදායී පොලී අනුපාතය, මාසික වාරික 60කින් අයකරගැනීම |
| ▪ ත්‍රීරෝද රථ ණය | සහනදායී පොලී අනුපාතය, මාසික වාරික 60කින් අයකරගැනීම |
| අත්තිකාරම් | |
| ▪ උත්සව අත්තිකාරම් | පොලී නොමැත මාස 10කින් අයකරගැනීම |
| ▪ අලුත් අවුරුදු අත්තිකාරම් | පොලී නොමැත මාස 10කින් අයකරගැනීම |
| ▪ පාසල් පොත් අත්තිකාරම් | පොලී නොමැත මාස 10කින් අයකරගැනීම |
| සම්මාන පිරිනැමීම | සම්මාන පිරිනැමීම සේවකයින්ගේ සේවා කාලය මත රඳා පවත |
| සුබසාධන සම්බන්ධ ප්‍රතිලාභ | - සෑම සේවකයෙකුටම ඕනෑම CPSTL / CPC සංචාරක බංගලාවක දින 3 ක් / රාත්‍රී 2 ක් පවුලේ අය සමඟ රැඳී සිටීමට අයිතියක් ඇත<br>- CPSTL ක්‍රීඩා සමාජ කටයුතුවලට සහභාගී වීම<br>- වාර්ෂික විනෝද චාරිකාව<br>- ලේ දන්දීමේ ව්‍යාපාරය<br>- CPSTL පරිශ්‍රයේ සමුපකාර වෙළෙඳ සල<br>- CPSTL පරිශ්‍රයේ පවත්වාගෙන යන ආපනශාලාව |
| වෛද්‍ය ප්‍රතිලාභ | - CPSTL හි නේවාසික වෛද්‍ය නිලධාරියා සහ නොමිලේ ඖෂධ ලබා දීම සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය ද ලබා දීම<br>- රෝහල්ගත කිරීම සඳහා වෛද්‍ය රක්ෂණය<br>- රසායනාගාර පරීක්ෂණ ප්‍රතිපූර්ණය<br>- විශේෂ පරීක්ෂණ වියදම් ප්‍රතිපූර්ණය (CT ස්කෑන්, MRI ආදිය) |
| මරණ ප්‍රතිලාභ | මරණ වන්දි |
| සකසුරුවම් සමිති ප්‍රතිලාභ | - මරණ පාරිතෝෂිකයට සේවකයින්ගේ සහ ආසන්නතම පවුලේ සාමාජිකයින්ගේ මරණ ඇතුලත්ය<br>- ව්‍යවස්ථාපිත පාරිතෝෂිකයට සමාන පාරිතෝෂක දීමනාවක් ලබා දෙනු ලැබේ |
| විශ්‍රාමික ප්‍රතිපාදන | ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය |
| අනෙකුත් පහසුකම් | විශේෂ රාජකාරි සඳහා නිල ඇඳුම් සැපයීම, රාත්‍රී රාජකාරී සේවකයින් සඳහා ආහාර සැපයීම |

# මානව ප්‍රාග්ධනය

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සිය සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් උසස් අධ්‍යාපනය සඳහා ඔවුන්ව දිරිමත් කරයි. වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍රවල උපාධි අපේක්ෂකයින් 129 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.




**සේවකයින්ගේ දරුවන් සඳහා ලබා දෙන ශිෂ්‍යත්ව - 2022**

නිශ්චිත සේවා වසර ආවරණය කළ සේවකයින්ව සමාගම විසින් වාර්ෂිකව ඇගයීමට ලක්කරනු ලැබේ.

| සම්පූර්ණ කරන ලද සේවා කාලය | සේවක සංඛ්‍යාව |
|---|---|
| අවුරුදු 20 | 14 |
| අවුරුදු 30 | 01 |
| අවුරුදු 35 | 21 |
| අවුරුදු 40 | 01 |

### පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය

වත්මන් ගතික සහ සංකීර්ණ මෙහෙයුම් පරිසරය තුළ, අනාගත ව්‍යාපාරික ඉල්ලීම් සමඟ පෙළගැස්වීම සඳහා මූලික අවශ්‍යතාවයක් ලෙස ඉදිරි දැක්මක් සහිත ඉගෙනුම් උපාය මාර්ග යක් අනුගමනය කිරීම අතිශය වැදගත්කමක් ගනී. තම දැක්ම සාක්ෂාත් කර ගැනීමේදී සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ අරමුණු හඹා යාමේදී අප ශ්‍රම බලකායේ දක්ෂතාවය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන බව සංවිධානය පිළිගනී. ඒ අනුව, තරඟකාරී කුසලතා සංචිතයක් නිර්මාණය කිරීම සහ රඳවා තබා ගැනීම, සමාගමේ උපාය මාර්ගික මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ සහ එහි වර්ධන සන්ධිස්ථාන කරා ළඟා වීමේ ප්‍රධාන සක්‍රියකාරකයන් වේ. මේ සඳහා, CPSTL හි පුහුණු සහ මානව සම්පත් සංවර්ධන කාර්යාංශය සියළුම සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා සුපරීක්ෂාකාරීව තක්සේරු කිරීම සහ ආමන්ත්‍රණය කිරීම මඟින් සිය ශ්‍රම බලකායේ දිගුකාලීන පුද්ගලික වැඩිදියුණු කිරීම් සඳහා සම්පූර්ණයෙන්ම කැපවී සිටී.

සමාගම විසින්, කාර්යසාධන ඇගයීම් සහ හැකියා ප්‍රවර්ධන සාකච්ඡා හරහා සේවකයන්ගේ පුහුණුවීමේ අවශ්‍යතා සොයා බලනු ලැබේ. ඒ අනුව සේවකයින්ගේ අභ්‍යන්තර පුහුණු වැඩසටහන්වලට අමතරව වෘත්තීය ආයතන සහ පුහුණු සංවිධාන ලෙස තෙවන පාර්ශවයන් විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සේවකයින් සහභාගී කරවීමට උනන්දු කරවනු ලැබේ.

තාක්ෂණික දැනුම, මෘදු කුසලතා සහ නායකත්ව කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ගණනාවක් සේවකයින් වෙනුවෙන් පවත්වන ලද අතර ඒ වෙනුවෙන් පුහුණු පැය 5,006 ක් 2022 වසර ඇතුළත වෙන් කරන ලදී.

| වැඩසටහන් / වැඩමුළු / සම්මන්ත්‍රණ | කාලසීමාව | සහභාගිවන්නන් ගණන | පුහුණු පැය |
|---|---|---|---|
| සේවක විනය සංවර්ධනය - ආරක්ෂක කාර්යාංශය | පැය 7 | 31 | පැය 217 |
| ටැංකි මිනුම්කරුවන් සඳහා පුහුණුව | පැය 21 | 8 | පැය 168 |
| සංගීත චිකිත්සාව | පැය 3 | 25 | පැය 75 |
| සේවක විනය සංවර්ධනය - ඉංජිනේරු කාර්යාංශය | පැය 7 | 17 | පැය 119 |
| අවදානම් කළමනාකරණය | පැය 7 | 37 | පැය 259 |
| මිල වැඩිකිරීමේ වැඩමුළුව | පැය 7 | 88 | පැය 616 |
| කම්කරු නීතිය | පැය 7 | 127 | පැය 889 |
| සේවක විනය සංවර්ධනය | පැය 7 | 80 | පැය 560 |
| පුද්ගලික හැඩගැන්වීම පිළිබඳ වැඩමුළුව | පැය 7 | 52 | පැය 364 |
| ටැංකි පිරවුම්කරුවන් සඳහා පුහුණුව | පැය 21 | 11 | පැය 231 |
| පුද්ගලික කුසලතා, වටිනාකම් සහ රැකියා ජීවිත තුලනය | පැය 7 | 37 | පැය 259 |
| සේවක විනය සංවර්ධනය | පැය 3 | 12 | පැය 36 |
| CIA (සහතිකලත් අභ්‍යන්තර විගණක) වැඩමුළුව | පැය 32 | 25 | පැය 800 |
| චිත්තවේගීය බුද්ධිය පිළිබඳ වැඩමුළුව | පැය 7 | 59 | පැය 413 |
| එකතුව | | | පැය 5006 |

සමාගම සැමවිටම සේවක වෘත්තිය සංවර්ධනය ගැන උනන්දු වෙයි. දැනුම ලබාගැනීම සඳහා පිළිගත් වෘත්තීය ආයතනවලට සම්බන්ධ වීමට කැමති සේවකයින්ට ඒ සඳහා සහයෝගය ලබා දෙයි. MBA සහ වෙනත් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මූල්‍ය ආධාර සපයයි. වෘත්තිකයන් විසින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වන පිරිවැය දරණ අතර සේවකයින් සිය අධ්‍යයන කටයුතු සඳහා ගෙවන මුදල් ප්‍රතිපූර්ණය කරමින් සමාගම අපේක්ෂා කරන්නේ සිය ශ්‍රම බලකායේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයයි.





# මානව ප්‍රාග්ධනය

### වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව

සියලුම සේවකයින් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ඉහළම ප්‍රමිතීන් සහිත සේවා පරිසරයක් පවත්වා ගැනීමටත් එහි සේවා මෙහෙයුම්වලදී, ආරක්ෂිත සහ අනතුරු රහිත පරිසරයක් පවත්වාගැනීමටත් සමාගම වගකීමෙන් කටයුතු කරයි.

ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඛනිජතෙල් පර්යන්ත ක්‍රියාකරු වන අතර, අධික ලෙස ගිනි ගන්නා ඛනිජ තෙල් නිෂ්පාදන කළමනාකරණය සහ බෙදා හැරීම සිදු කරනු ලබයි. මෙම මෙහෙයුම් හා සම්බන්ධව පවතින ආවේනික අවදානම් නිසා ඒවා අධි අවදානම් කාණ්ඩයට අයත් වේ. ප්‍රධාන ආර්ථික කේන්ද්‍රස්ථානයක් වන, CPSTL හි පහසුකම් තුළ සිදුවන ඕනෑම මහා පරිමාණ ගිනිගැනීමක් මඟින් රටේ ආර්ථිකය අඩපණ කළ හැකිය. එබැවින්, CPSTL හි මෙහෙයුම් රාමුව තුළ කාර්මික සහ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව ඉතා වැදගත් වේ. CPSTL සතුව ඒ සඳහා වෙන්වූ;

- පැය 24 × දින 7 ගිනි ආරක්ෂාව ලබාදීමට සූදානම් ගෘහස්ථ, ගිනි නිවන රථ.
- සේවකයින්ගේ වෛද්‍ය හදිසි අවශ්‍යතා වෙනුවෙන් පැය 24×7 දින, අභ්‍යන්තර ගිලන් රථය සමඟ, සෞඛ්‍යය නිරීක්ෂණය කිරීමට සහ සහභාගී වීමට, ආයතනික වෛද්‍ය මධ්‍යස්ථානය සූදානම්ව සිටියි.




සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ අවදානම් තුරන් කිරීම සඳහා පහත කරුණු කෙරෙහි සමාගම විශේෂ අවධානයක් යොමු කරයි:

- යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වැඩ පද්ධති සැපයීම සහ නඩත්තු කිරීම
- ඉන්ධන හැසිරවීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය
- අදාල තොරතුරු සැපයීම, පුහුණුව සහ අධීක්ෂණය
- සේවාවන්හි ගුණාත්මක භාවය පවත්වාගෙන යාම
- රැකියා ස්ථානයේ සෞඛ්‍ය සහ ආරක්ෂණ උවදුරු වැළැක්වීම
- සියලුම සේවකයින් විසින් සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ උපදෙස් දැඩි ලෙස පිළිපැදීම

## සේවක සිදුවීම්

### ලේ දන්දීමේ ව්‍යාපාරය

මුතුරාජවෙල පර්යන්තයේ වාර්ෂික ලේ දන්දීමේ ව්‍යාපාරය 2022 වර්ෂයේදී අඛණ්ඩව 8 වැනි වරටත් ආයතනයේ සේවක සේවිකාවන්ගේ පූර්ණ සහ ක්‍රියාකාරී සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.





### ශ්‍රමදාන ව්‍යාපාරය

සේවකයින් විසින් සියලුම තොග ගබඩා ඇතුළු CPSTL කාර්යාල පරිශ්‍රයන්හි ශ්‍රමදාන ව්‍යාපාර පවත්වන ලදී.





# මානව ප්‍රාග්ධනය

### බෞද්ධ ධර්ම දේශනා

CPSTL හි බෞද්ධ සංගමය කාර්යාල පරිශ්‍රයේදී පොහෝ දින බෞද්ධ ධර්ම දේශනා පවත්වනු ලබන අතර ඊට සහභාගි වන ලෙස සියලුම සේවකයන්ට ආරාධනා කරයි.





### සංගීත චිකිත්සාව පිළිබඳ වැඩමුළුව

වචන රහිත සංගීතය, තනු, රිද්මය, සුසංයෝගය, සංගීත ප්‍රතිකාරයේ තාක්ෂණික හා ප්‍රායෝගික අංශ ආදියෙන් සංගීතය අවබෝධ කර ගන්නා ආකාරය ආවරණය වන පරිදි රැකියාව සහ ජීවිතය අතර සමබරතාවයක් ඇති කර ගැනීමේ අරමුණින් සංගීත චිකිත්සාව පිළිබඳ වැඩමුළුව පුහුණු කිරීම් සහ මානව සම්පත් සංවර්ධන කාර්යාංශය මගින් පවත්වන ලදී.






# පාලනය
# සහ අනුකූලතාව



# ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය

**CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම පුරා ආයතනික පාලන මූලධර්ම අනුගමනය කිරීමට දැඩි ලෙස කැපවී සිටින බවත්, ආයතනික පාලන භාවිතයන් පිළිබඳ ආයතනික පාලන වාර්තාව සාධාරණ ගිණුම් ප්‍රකාශනයක් සපයන බවත් තහවුරු කිරීමට කැමැත්තෙමි.**

**ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම පිරිස් අදාල නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර ඇති බව ද ප්‍රකාශ කරමි.**

**එම්. උවයිස් මොහොමඩ්**
**සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය ශක්තිමත් කරන, ආයතනය පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීමට උපකාරී වන ලෙස සියලුම ගනුදෙනු පිළිබඳ වගවීම, විනිවිදභාවය, සාධාරණත්වය සහතික කරන යහපත් සහ ඵලදායී ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීම අරමුණු කොටගෙන CPSTL හි ආයතනික පාලනය සැළසුම් කර ඇත. සමාගමක දීර්ඝකාලීන සාර්ථකත්වය හා ජයග්‍රහණයන් සාක්ෂාත් කරනු ලබන ඵලදායී වූ ව්‍යවසායකත්ව හා විචක්ෂණ කළමනාකරණය ස්ථාපිත කිරීම ආයතනික පාලනය මගින් ඉටුකරනු ලබයි.

- දැක්ම, මෙහෙවර, අරමුණු සහ උපාය මාර්ග සැළසුම් කර සන්නිවේදනය කරන ආකාරය,
- සාරධර්ම සමඟ මනාව අනුකූලවන ආකාරය,
- අවදානම් කළමනාකරණය කරන ආකාරය,
- විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ආකාරය,
- තිරසාරව මෙහෙයුම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- අනාගත නායකයින් දිරිමත් සහ සංවර්ධනය කරන ආකාරය,
- ආයතනයට ලැදි පාර්ශවකරුවන්ගේ වටිනාකම් ඉහළ නැංවීම සඳහා ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ආකාරය යන පුළුල් අර්ථයන් ද එය ට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව තුල ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ ප්‍රධාන පහසුකම් සපයන්නා ලෙස රටේ නියාමන ආයතන විසින් සකස් කරන ලද නීති රෙගුලාසි සහ සංග්‍රහවලට අනුගතව ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට සහතික වන අතර, එය සමාගම විසින් සකසන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලට ද අනුකූල වේ.

### ආයතනික පාලන ව්‍යුහය

CPSTL පාලන ව්‍යුහය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අතර මූලික සබඳතා, එහි අනු කමිටු, ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය, කොටස් හිමියන්, නියාමකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් මෙහෙයවනු ලැබේ.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ආයතනික පාලන ව්‍යුහය

1. අනුකූලතාව
2. අභ්‍යන්තර පාලන ව්‍යුහය
3. සහතික වීම සහ පාලනය

යන ප්‍රධාන කරුණු තුන මත රඳා පවතී.

## අනුකූලතාව

**නියාමන මිණුම් සලකුණු**

2007 අංක 7 දරණ සමාගම් පනත

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කල ආයතනික පාලනය මනා පරිච සංග්‍රහය

2021 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන සහ වෙනත් ව්‍යවස්ථාවන්

**අභ්‍යන්තර මිණුම් සලකුණු**

සමාගම් ව්‍යවස්ථාව
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති
සමාගමේ රෙගුලාසි
ව්‍යාපාර හැසිරවීමේ සංග්‍රහය
අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල නිදර්ශන නියමයන්

## අභ්‍යන්තර පාලනය

**කොටස් හිමියන්**

**සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා, සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ වගකිව යුතු ය.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

කොටස් හිමියන් විසින් වාර්ෂික මහ සභා රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගනී. සමාගමේ සාර්ථක ක්‍රියාකාරීත්වය සඳහා උපාය මාර්ගික වැඩපිළිවෙල සැකසීමට හා සාර්ථක පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නායකත්වය ලබා දෙයි.

- විගණන කමිටුව
- තොග සමාලෝචන කමිටුව
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

## සහතික වීම සහ පාලනය

**බාහිර විගණකවරු**

බාහිර විගණකවරුන් ස්වාධීන ආයතනයක් වන අතර ඔවුන්ගේ වගකීම වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සාධාරණ සහතිකයක් ලබා දීමයි.

**අභ්‍යන්තර විගණකවරු**

සමස්ථ අවධානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලන රාමුවේ ප්‍රමාණාත්මක භාවය සහ ඵලදායීභාවය පිළිබඳ ස්වාධීන තක්සේරුවක් සිදුකර විගණන කමිටුවවෙත වාර්තා කිරීම අභ්‍යන්තර විගණකවරු විසින් සිදුකරනු ලබයි.

# ආයතනික පාලනය

### 01. අනුකූලතාව

සමාගමේ ආයතනික පාලන භාවිතයන් පහත සඳහන් නීති, ප්‍රඥප්ති සහ ස්වේච්ඡා භාවිතයන්ට අනුකූල වේ.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය.
- 2021 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ.
- 2007 අංක 7 දරණ සමාගම් පනත.
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත, එහි සංශෝධන සහ අනෙකුත් ප්‍රඥප්ති.
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය.
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති.
- සමාගම් රෙගුලාසි.
- ව්‍යාපාර චර්යා සංග්‍රහය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ කළමනාකරණ කමිටු නිදර්ශන නියමයන්.

### 02. අභ්‍යන්තර පාලන ව්‍යුහය

#### අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් හරහා සමාගමේ සියලුම ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. පාලනයේ අරමුණ වන්නේ ඵලදායී සහ විචක්ෂණශීලී කළමනාකරණය තුළින් දිගුකාලීන තිරසාර කොටස්හිමියන්ගේ වටිනාකමක් නිර්මාණය කිරීමයි.

#### අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්

- ආයතනයේ දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් උපාය මාර්ග සැකසීම සහ මඟ පෙන්වීම.
- උපාය මාර්ගික මාර්ගෝපදේශ සැපයීම සහ ආයතනික උපාය මාර්ග සහ සමාගමේ කාර්ය සාධන අරමුණු ඇගයීම, සමාලෝචනය සහ අනුමත කිරීම.
- වාර්ෂික සැළසුම් සහ දිගුකාලීන ව්‍යාපාර සැළසුම් සමාලෝචනය සහ අනුමත කිරීම.
- යහපාලන පද්ධති සහ ඊට අනුකූලවීම අධීක්ෂණය කිරීම.
- මූල්‍ය සහ අනෙකුත් වාර්තාකරණ භාවිතයන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ප්‍රධාන අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් සහ ප්‍රාග්ධන වියදම් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- විධායක මට්ටම් දක්වා පවරන ලද අභිමතයන්/අධිකාරියන් සඳහා වෙනස්කම් තීරණය කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම.

#### අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය

2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පහත පරිදි විය.

| නම | තනතුර |
|---|---|
| එම්. උවයිස් මොහොමඩ් මහතා | සභාපති |
| එල්.ඊ. සුසන්ත සිල්වා මහතා | කළමනාකාර අධ්‍යක්ෂ |
| ඊ.ඒ. රත්නසීල මහතා | අධ්‍යක්ෂ |
| මනෝජ් ගුප්තා මහතා | අධ්‍යක්ෂ |
| අසීම් භාර්ගවා මහතා | අධ්‍යක්ෂ |
| රාජේෂ් කුමාර් භගත් මහතා | අධ්‍යක්ෂ |
| ධර්මදාස පණ්ඩිතරත්න මහතා | අධ්‍යක්ෂ |
| මනෝජ් ගමගේ මහතා | අධ්‍යක්ෂ |

2022 වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ වෙනස්වීම්

| | **අධ්‍යක්ෂවරයාගේ නම** | **අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ දිනය** | **අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස් වූ දිනය** | **තනතුර** |
|---|---|---|---|---|
| 01 | නාලක පෙරේරා මහතා | 21/12/2021 | 07/03/2022 | සභාපති |
| 02 | විශ්‍රාමික මේජර් ජෙනරල් එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා | 09/03/2022 | 02/08/2022 | සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ |
| 03 | එම්. උවයිස් මොහොමඩ් මහතා | 05/08/2022 | | සභාපති |
| 04 | සමින්ද්‍ර අබේසේකර මහතා | 21/12/2021 | 07/03/2022 | MD |
| 05 | එල්.ඊ. සුසන්ත සිල්වා මහතා | 05/08/2022 | | MD |
| 06 | බුද්ධික රුවන් මඩිහහේවා මහතා | 27/01/2020 | 13/07/2022 | NED |
| 07 | ඊ. ඩී. රත්නසීල මහතා | 27/01/2020 | | NED |
| 08 | මනෝජ් කුමාර් ගුප්තා මහතා | 20/05/2019 | | NED |
| 09 | තිළිණ පීරිස් මහතා | 15/03/2021 | 07/03/2022 | NED |
| 10 | අසීම් භාර්ගවා මහතා | 18/08/2021 | | NED |
| 11 | රාජේෂ් භගත් මහතා | 18/08/2021 | | NED |
| 12 | ප්‍රසන්න අමරතුංග මහතා | 28/12/2021 | 07/03/2022 | NED |
| 13 | එච්.ඩී. බන්දුල සමන් කුමාර මහතා | 09/03/2022 | 18/10/2022 | NED |
| 14 | ධර්මදාස පණ්ඩිතරත්න මහතා | 09/03/2022 | | NED |
| 15 | මනෝජ් ගමගේ මහතා | 13/12/2022 | | NED |

NED විධායක නොවන අධ්‍යක්ෂ ED විධායක අධ්‍යක්ෂ MD කළමනාකාර අධ්‍යක්ෂ

වාර්ෂික වාර්තාවේ පිටු 20 සිට 25 දක්වා වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පළපුරුද්ද, උපාය මාර්ග පිළිබඳ ගැටළු පිළිබඳ ස්වාධීන විනිශ්චයක් සැපයීමට ප්‍රමාණවත් හැකියාව, කාර්ය සාධනය මෙන් ම සමාගමට වැදගත්වන සම්පත් සහ ව්‍යාපාරික භාවිතයන් ආදිය දැක්වෙයි.

- **අධ්‍යක්ෂ මණ්ඩල විවිධත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල තුලනය**

අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික පාලන රාමුවෙහි ප්‍රධානම සංරචකය වේ. මණ්ඩලය සතු කුසලතා, දැනුම, අත්දැකීම්, වෘත්තීය සුදුසුකම්, වයස, ජාතිකත්වය ආදියෙහි පවතින විවිධත්වය, කුසලතා සංචිතය සහ සම්පත් භාවිතා කිරීම පිළිබඳ වඩා එලදායී තීරණ ගැනීම මෙන් ම එමගින් වඩා හොඳ ප්‍රතිලාභ ලබාගැනීමට ඉවහල් වෙයි.

සමාලෝචිත වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය සහ පළපුරුද්ද සහිත ප්‍රශස්ත කුසලතා සම්මිශ්‍රණයක් ඇති අධ්‍යක්ෂවරුන් අට දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය.

- **අධ්‍යක්ෂවරුන් පත් කිරීම**

සාංගමික ව්‍යවස්ථාවලියේ කොන්දේසි මත, අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ය. ඒ සඳහා අපේක්ෂකයින් සලකා බැලීමේදී ඔවුන් සතු අත්දැකීම්වල පරාසය, ව්‍යාපාරයේ මූලය ගැටළු පිළිබඳ අවබෝධය, නිවැරදි විනිශ්චයන් ලබාදීමේ හැකියාව, විවිධත්වය, නායකත්වය, සහ අත්දැකීම් මෙන් ම ව්‍යාපාරයට සහ කර්මාන්තයට බලපාන කාරණාවල දී ලබා ඇති ජයග්‍රහණ යනාදිය සැලකිල්ලට ගනු ලැබේ.

- **වගකීම් බෙදීයාම**

නාලක පෙරේරා මහතා සභාපතිවරයා ලෙසද සමින්ද්‍ර අබේසේකර මහතා කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද 2022 මාර්තු 07 වන දින දක්වා කටයුතු කළේය.

නාලක පෙරේරා මහතා සහ සමින්ද්‍ර අබේසේකර මහතා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීමෙන් පසු විශ්‍රාමික මේජර් ජෙනරල් එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා 2022 මාර්තු 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදි. 2022 අගෝස්තු 02 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම මෙන්ම ව්‍යාපාරික කටයුතු අධීක්ෂණය කිරීමේ විධායක වගකීම ද ඔහු විසින් දරණ ලද අතර එය තීරණ ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහ ආරවුල් මගහරවා ගැනීමට උපකාර විය. පාර්ශවකරුවන්ගේ අරමුණු සපුරාලීම සහ වේගවත් හා කඩිසර

# ආයතනික පාලනය

නායකත්වයක අවශ්‍යතාවය මත එම අවස්ථාවේදී භූමිකාවන් දෙකේ සංයෝජනය වඩාත් යෝග්‍ය බව සමාගමේ ස්ථාවරය විය.

විශ්‍රාමික මේජර් ජෙනරල් එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීමෙන් පසු සභාපතිවරයාගේ සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවන් පැහැදිලි වගකීම් වෙනසක් සහිතව වෙන් කරන ලද අතර එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සහ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ විධායක වගකීම පිළිබඳ වගවීමේ සහ අධිකාරියේ තුලනය සහතික කරන ලදී. ඒ අනුව 2022 අගෝස්තු 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ සභාපතිවරයා ලෙස එම්. උවයිස් මොහොමඩ් මහතා ද කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස එල්.ඊ. සුසන්ත සිල්වා මහතා ද පත් කරන ලදී.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මෙහෙයුම් උප කාණ්ඩ ලෙස එනම්, කොළොන්නාව පර්යන්තයේ මෙහෙයුම් , මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ මෙහෙයුම් සහ දිවයින පුරා පිහිටි ලංකා තොග ගබඩාවල මෙහෙයුම් ලෙස වර්ග කළ හැකි ය. මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම් කටයුතු පර්යන්ත කළමනාකාර (මුතුරාජවෙල) ගේ ප්‍රධානත්වයෙන් සිදුවෙයි. කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ ප්‍රධානියා මෙහෙයුම් කළමනාකාර (අක්වෙරළ) වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ ලංකා තොග ගබඩාවල ප්‍රධානත්වය දරන්නේ ගබඩා අධිකාරීවරුන් විසිනි.

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍යතා මත කැඳවනු ලැබෙයි. ජ්‍යේෂ්ඨ කළමනාකරුවෝ ද ආරාධනා මත රැස්වීම්වලට සහභාගි වෙති. න්‍යාය පත්‍රයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් ලෙස පවත්වනු ලබන අතර රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂවරුන්ට, ආයතනික කළමනාකරණය විසින් විස්තීරණ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වනු ලැබිණි.

මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත වගුවේ දක්වා ඇත;

| නම | 27/ ජන | 23/ පෙබ | 16/ මාර් | 9/ අප්‍රේ | 25/ මැයි | 20/ ජූනි | 28/ ජූලි | 19/ අගෝ | 12/ සැප් | 14/ ඔක් | 24/ නොවැ | 14/ දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නාලක පෙරේරා මහතා | P | P | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A |
| විශ්‍රාමික මේජර් ජෙනරල් එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා | N/A | N/A | P | P | P | P | P | N/A | N/A | N/A | N/A | N/A |
| එම්. උවයිස් මොහොමඩ් මහතා | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | P | P | P | P | P |
| සමින්ද්‍ර අබේසේකර මහතා | P | P | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A |
| එල්.ඊ. සුසන්ත සිල්වා මහතා | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | P | P | P | P | P |
| බුද්ධික රුවන් මඩිහහේවා මහතා | P | P | P | P | P | AB | N/A | N/A | N/A | N/A | N/A | N/A |
| ඊ. ඒ. රත්නසීල මහතා | P | P | P | P | P | P | P | P | P | P | P | P |
| මනෝජ් කුමාර් ගුප්තා මහතා | P | P | P | P | P | P | P | P | P | P | P | P |
| තිළිණ පීරිස් මහතා | P | P | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A |
| අසීම් භාර්ගවා මහතා | P | P | P | P | P | P | P | P | P | P | P | P |
| රාජේෂ් භගත් මහතා | P | AB | P | AB | P | P | P | P | P | P | P | P |
| ප්‍රසන්න අමරතුංග මහතා | P | P | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A |
| එච්.ඩී. බන්දුල සමන් කුමාර මහතා | N/A | N/A | P | P | P | P | P | P | P | P | N/A | N/A |
| ධර්මදාස පණ්ඩිතරත්න මහතා | N/A | N/A | P | P | AB | AB | P | P | P | P | AB | P |
| මනෝජ් ගමගේ මහතා | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | P |

P - පැමිණීම / AB – නොපැමිණීම

- **බලය බෙදීම සහ කමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු හැර, වෙනත් කරුණු සඳහා උප කමිටුවෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට නිශ්චිත වගකීම් පවරා ඇති පහත සඳහන් කමිටුවල සහාය ලැබේ.

### ආ) විගණන කමිටුව

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත් කරනු ලැබේ. විගණන කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත සමස්ත පාලන ක්‍රියාවලිය තුළ ක්‍රියා කරන අතර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

CPSTL විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටු සංයුතිය සහ සිදු කරනු ලබන කාර්යයන් මෙම වාර්ෂික වාර්තාවේ 92 පිටුවේ ඉදිරිපත් කර ඇත.

### ආ) තොග සමාලෝචන කමිටුව

CPSTL කාර්ය මණ්ඩලයේ සහ CPC/LIOC නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ඉන්ධන තොග සමාලෝචන කමිටුව සතිපතා පවත්වනු ලැබේ. පවතින ඉන්ධන තොග සමාලෝචනය කරන අතර, ඉදිරි මාස තුන සඳහා අවශ්‍යතාවය කල් ඇතිව සැළසුම් කෙරෙයි. රටේ ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන ශක්‍යතාව සහ ගබඩා ධාරිතාව සැලකිල්ලට ගැනීමෙන් පසු ආනයනය කළ යුතු ප්‍රමාණය හඳුනා ගැනේ. දෛනිකව සිදු කෙරෙන සමීප නිරීක්ෂණ රට තුළ ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සමාගමට හැකියාව ලබා දෙයි.

### ඇ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

TEC (තාක්ෂණික ඇගයීම් කමිටුව) සහ DPC (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව) ප්‍රසම්පාදන කාර්යයේ විනිවිදභාවය සහතික කිරීම සඳහාත්, සැපයුම් ප්‍රමාදයන් අවම කිරීම සහ ගුණාත්මකව හොඳම සේවාවන් ලබාගැනීම සඳහාත්, මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසි ලබා ගැනීමටත්, පත්කර ඇති අතර සමාගම විසින් නිෂ්පාදන, භාණ්ඩ, වැඩ සහ සේවා, මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කරයි.

මෙම කමිටුවේ ප්‍රධානත්වය දරන්නේ CPSTL හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) සහ බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

- තොරතුරු සහ සම්පත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවේශය

අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රාජකාරි සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය කළමනාකරණ සහ සංවිධාන තොරතුරු ලබාගැනීමටත් සම්පත් පරිහරණයටත් අසීමිත අවසරයක් ඇත.

විධායක කළමනාකරණය විසින් මෙහෙයුම් සැළසුම් කාර්ය සාධනය, උපාය මාර්ග, මූල්‍ය කළමනාකරණය, පිරිවැය, වත්කම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ නියාමන වෙනස්කම් ඇතුළු කරුණු සම්බන්ධයෙන් විවිධ ඉදිරිපත් කිරීම් කරයි. මෙහිදී අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය අවස්ථාවලදී ස්වාධීන වෘත්තීය උපදෙස් සහ තොරතුරු ලබා ගත හැකි අතර වියදම සමාගම විසින් දරණු ලැබේ.

- **සමාගම් ලේකම්වරු**

අධ්‍යක්ෂ මණ්ඩලයට එහි රාජකාරි ඉටු කිරීම සහ වගකීම් සම්බන්ධයෙන් මග පෙන්වීම සහ ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කරමින්, ගිණුම්කරණ පද්ධති ලේකම් සේවා (පුද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස කටයුතු කරයි. සමාගම් ලේකම් සමඟ සියලුම අධ්‍යක්ෂවරුන්ට කටයුතු කළ හැක. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනෙකුත් උප කමිටු රැස්වීම් සංවිධානය කිරීම සහ අදාල වාර්තා සටහන් පවත්වා ගැනීම සමාගම් ලේකම් විසින් සිදුකරනු ලබයි.

## 03. සහතික කිරීම සහ පාලනය

- **මූල්‍ය වාර්තාකරණය**

මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ දැක්මක් සහිතව ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) එනම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) සහ LKAS වලට අනුවය. විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත්කිරීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ඇති අනුකූලතාව, යෝග්‍යතාවය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ වැදගත් තීන්දුමය කරුණු පිළිබඳව කළමනාකරණය සහ බාහිර විගණකවරුන් සමග සමාලෝචනය කර සාකච්ඡා කර ඇත.

# ආයතනික පාලනය

- **විනිවිදභාවය සහ අනුකූලතාවය**

  සියලුම ගනුදෙනුවලදී නීති සහ රෙගුලාසි සමඟ දැඩි අනුකූලතාව සහතික කරමින්, සදාචාරාත්මක ප්‍රමිතීන්, කම්කරු හා මානව හිමිකම් සහ සමාගමේ ප්‍රතිපත්ති ආරක්ෂා කරමින්, විනිවිදභාවය පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

  - 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනතෙහි විධිවිධානවලට අනුව සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිර්මාණය කර ඇත.
  - 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව විගණකාධිපති විසින් ආයතනයේ බාහිර විගණනය සිදු කරන ලදුව, මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
  - වගවීම සහතික කිරීම සඳහා, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) සහ අනෙකුත් අදාල රෙගුලාසිවලට, සමාගම අනුගත වේ.

- **අභ්‍යන්තර පාලනය**

  මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහාත්, මූල්‍ය වාර්තාවල විශ්වාසනීයත්වය සහ අදාල නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහ අවදානම් කළමනාකරණය සඳහාත් අභ්‍යන්තර පාලන පද්ධතියක් නිවැරදිව ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙය මූල්‍ය හා ගිණුම්කරණයේ තොරතුරුවල අඛණ්ඩතාව තහවුරු කරන අතර මෙහෙයුම් සහ ලාභදායීතාවය පිළිබඳ ඉලක්ක සපුරාලීම සඳහාත්, කළමනාකරණ ප්‍රතිපත්ති සංවිධානය පුරා සම්ප්‍රේෂණය කිරීමටත් ඉතා වැදගත් වේ. ඕනෑම අභ්‍යන්තර පාලන පද්ධතියකට සහතික කළ හැක්කේ සාධාරණ කාල සීමාවක් තුළ දෝෂ සහ අක්‍රමිකතා ඇති බව හෝ ඉදිරිපත් කරනු ඇති බව පිළිබඳ සාධාරණ සහතිකයක් මිස නිරපේක්ෂ සහතිකයක් නොවේ.

  CPSTL හි ස්ථාපිත අභ්‍යන්තර පාලන පද්ධතිය තුල ආයතනය කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව අභ්‍යන්තර විගණන කාර්යාංශය සහතික කරයි.

- **අභ්‍යන්තර විගණනය**

  අභ්‍යන්තර විගණනය, ස්වාධීන කළමනාකරණයක් සහිත අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණනයක පරමාර්ථය වන්නේ සංවිධානයක සියලුම ක්‍රියාකාරකම් පාලනය කිරීම දැඩිව තබා ගැනීමයි. කළමනාකරණයට මූල්‍ය වාර්තාවල අව්‍යාජභාවය පිළිබඳ සහ සංවිධානයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සහතිකයක් අවශ්‍ය වේ. විගණනය මේ අවශ්‍යතා දෙකම තහවුරු කිරීමට උපකාරී වේ. නීති රෙගුලාසිවලට හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවට එය නිසියාකාරව සහතික කරයි.

අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය පහත පරිදි වේ.

- සියලුම ව්‍යාපාරික ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට පෙර පවතින නීති හා රෙගුලාසිවලට අනුකූලව නිසි ලෙස පූර්ව අනුමත කර ඇතිබව සහතික කිරීම.
- සියලුම ගිණුම් තොරතුරු නිසි පරිදි SAP හි නිසි ලෙස වාර්තා කර ඇති බවටත්, ප්‍රාථමික වාර්තා නිවැරදිව නඩත්තු කෙරෙන බවටත්, කාර්යක්ෂම කළමනාකරණය සහතික කිරීම සඳහා අදාල සංඛ්‍යා ලේඛන සහ පාලන දත්ත නිසි ලෙස නිර්මාණය කර ඇති බවත් තහවුරු කිරීම.
- මූල්‍ය ගිණුම්කරණ ප්‍රකාශයන් සංවිධානයේ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ නිරූපණයක් කරන බව සහතික කිරීම.
- ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම.
- පද්ධති පදනම් ප්‍රවේශය යොදාගනිමින් පහත කරුණු සමාලෝචනය සහ ඇගයීම.
  - දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීම මැනීමට කළමනාකරණය විසින් භාවිත කරන සියලුම පද්ධති සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
  - කළමනාකරණ සැළසුම්, ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති සහ අනෙකුත් අවශ්‍යතා නීති සම්පාදනයට අනුකූල වීමේ මට්ටම.
  - වත්කම් අත්පත් කර ගැනීම, බැහැර කිරීම සහ ආරක්ෂා කිරීම වංචා අක්‍රමිකතා සහ අක්‍රමිකතාවලින් පැන නගින පාඩු ඇතුළු පොළිය.

- ආර්ථික සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ නාස්තිය වළක්වා ගැනීම.
- තීරණගැනීම සහ වගවීම සඳහා සපයනු ලැබෙන තොරතුරුවල ප්‍රමාණවත් බව, විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාව මෙන් ම භාවිතා කරන තොරතුරු ප්‍රමාණය.

- **බාහිර විගණනය**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සාධාරණ හා සත්‍ය නියෝජනය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා බාහිර විගණකවරුන් වගකිව යුතුය. 1971 අංක 38 දරණ මූල්‍ය පනත සහ 2018 ජාතික විගණන පනතට අනුව, ආයතනයේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සභාගතකළ යුතු ය.

2017 වසරේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයට අනුකූලතාව.

| අංකය | ආයතනික පාලන ප්‍රතිපත්ති | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතාවයේ තත්ත්වය |
|---|---|---|---|
| **A** | **අධ්‍යක්ෂකවරු** | | |
| A.1 | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩලය උපාය මාර්ගික දිශානතිය සැකසීමේදී සහ සාර්ථක පාලන රාමුවක් ස්ථාපිත කිරීමේදී නායකත්වය ලබා දෙයි. | අනුකූල වේ |
| A1.1 | නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්. | ▪ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලැබේ.<br>▪ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණීම 70 වන පිටුවෙහි ඇති වගුවේ විස්තර කර ඇත. | අනුකූල වේ |
| A1.2 | අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරයන් සහ වගකීම්. | අධ්‍යක්ෂ මණ්ඩලය පහත වගකීම් භාරගනිමින් ව්‍යවසායකත්වමය නායකත්වය ලබාදිය යුතුය.<br>▪ උපාය මාර්ග සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.<br>▪ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කුසලතා සහ අනුප්‍රාප්තිය.<br>▪ තොරතුරුවල අඛණ්ඩතාව, අභ්‍යන්තර පාලන, ව්‍යාපාර අඛණ්ඩතාව සහ අවදානම් කළමනාකරණය.<br>▪ නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම.<br>▪ තීරණ ගැනීමේ දී සියලු පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සලකා බැලීම.<br>▪ තිරසාර ව්‍යාපාර සංවර්ධනය.<br>▪ සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ මූල්‍ය රෙගුලාසි සමඟ, අනුකූලතාවය. | අනුකූල වේ |
| A1.3 | රටේ නීතිවලට අනුකූලව කටයුතු කිරීම. | සමාගම අදාල නියමයන්, නීති සහ රෙගුලාසි සියල්ලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. | අනුකූල වේ |

# ආයතනික පාලනය

| අංකය | ආයතනික පාලන ප්‍රතිපත්ති | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතාවයේ තත්ත්වය |
|---|---|---|---|
| A1.4 | සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය. | ▪ ගිණුම්කරණ පද්ධති ලේකම් සේවා (පුද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම සහ ආයතනික පාලනයේ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට මඟ පෙන්වයි.<br>▪ ඕනෑම නව නීති සහ පිළිපැදිය යුතු රෙගුලාසි පිළිබඳව ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙයි. | අනුකූල වේ |
| A1.5 | ස්වාධීන විනිශ්චය. | අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල කාරණා සම්බන්ධයෙන් ස්වාධීනව අදහස් ප්‍රකාශ කිරීමට සමාන අවස්ථා තිබේ. | අනුකූල වේ |
| A1.6 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සමාගමේ කරුණු සඳහා ප්‍රමාණවත් කාලයක් කැප කිරීම. | සෑම රැස්වීමකටම පෙර දැන්වීම, න්‍යාය පත්‍රය සහ ලිපි ලේඛන සියලුම අධ්‍යක්ෂවරුන්ට සපයනු ඇත. එසේ කරනුයේ එය සමාලෝචනය කිරීමට සහ අතිරේක තොරතුරු විමසීමට හෝ පැහැදිලි කරගැනීම් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීමටය. | අනුකූල වේ |
| A1.7 | අවශ්‍ය නම්, සමාගමේ අවශ්‍යතාව සඳහා, අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3 පිරිසකට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට විසඳුමක් ඉල්ලා සිටිය හැක. | | අදාල නොවේ |
| A1.8 | අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය සහ පුහුණුව. | සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය විසින්, අභ්‍යන්තර හා බාහිර පරිසරය සම්බන්ධ අදාල තොරතුරු ගැන, අධ්‍යක්ෂවරුන් නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ. | අනුකූල වේ |
| A.2 | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාවල වගකීම් බෙදීම. | සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ භූමිකාවල වගකීම් ඒකාබද්ධ කිරීම සාධාරණීකරණය සඳහා A.2.1 බලන්න. | A.2.1 බලන්න |
| A.2.1 | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාවන් ඒකාබද්ධ කිරීම සාධාරණීකරණය කිරීම (එක් පුද්ගලයෙකු තුළ). | විශ්‍රාමික මේජර් ජෙනරල් එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා 2022 මාර්තු 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර 2022 අගෝස්තු 02 දක්වා ආයතනයේ සභාපතිධුරයට අමතරව කළමනාකාර අධ්‍යක්ෂ ලෙසද කටයුතු කරන ලදි. පාර්ශ්වකරුවන්ගේ අරමුණු සපුරාලීම සහ වේගවත් හා කඩිසර නායකත්වයක අවශ්‍යතාවය මත එම අවස්ථාවේදී මෙම භූමිකාවන් දෙකේ සංයෝජනය වඩාත් යෝග්‍ය බව සමාගමේ ස්ථාවරය විය. | අනුකූල වේ |

| අංකය | ආයතනික පාලන ප්‍රතිපත්ති | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතාවයේ තත්ත්වය |
|---|---|---|---|
| A.3 | යහපත් ආයතනික පාලනයක් පවත්වාගැනීමේදී සභාපතිවරයාගේ වගකීම. | සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයන අතර<br>▪ අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී සහභාගීත්වය සහ දායකත්වය තහවුරු කරයි.<br>▪ සලකා බලනු ලබන ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරයි.<br>▪ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කටයුතු සම්පූර්ණයෙන්ම පාලනය කරන අතර සියලූම පාර්ශවකරුවන් වෙත එහි බැඳීම පිළිබඳ අනතුරු අඟවයි. | අනුකූල වේ |
| A.4 | ආයතනය සතු මූල්‍ය ඥානය. | සමාගමේ මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමේදී, අවශ්‍ය මූල්‍ය දැනුම සහ ප්‍රවීණත්වය ඔස්සේ මග පෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූල්‍ය වෘත්තිකයන් දෙදෙනෙකු ඇත.<br>▪ එම්. උවයිස් මොහොමඩ් මහතා එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියක් දරණ අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අවසන් අදියරේ විද්‍යාර්ථයෙකි.<br>▪ එල්.ඊ. සුසන්ත සිල්වා මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (FCA) ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (FCMA) ඕස්ට්‍රේලියාවේ සහතිකලත් ප්‍රායෝගික ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CPA Australia)සාමාජිකත්වය, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ ආශ්‍රිත සාමාජිකත්වය (APFASL) වැනි මූල්‍ය සම්බන්ධ වෘත්තීය සුදුසුකම් රාශියක් දරයි. | අනුකූල වේ |
| A.5 | අධ්‍යක්ෂ මණ්ඩල තුලනය | | අනුකූල වේ |
| A.6 | සුදුසු විධිවිධාන සහ කාලෝචිත තොරතුරු. | | අනුකූල වේ |
| A.7 | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම්. | | අනුකූල වේ |
| B | අධ්‍යක්ෂවරුන්ගේ වේතනය | | |
| B.1 | විධායක සහ අධ්‍යක්ෂ වේතන පිළිබඳ ප්‍රතිපත්තිය සංවර්ධනය සඳහා ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම. | | අනුකූල වේ |
| B.2 | වේතන මට්ටම සහ සැකැස්ම. | | අනුකූල වේ |
| B.3 | ගෙවන ලද අධ්‍යක්ෂ මණ්ඩල වේතන අනාවරණය කිරීම. | මූල්‍ය තොරතුරු-විස්තරාත්මක ආදායම් ප්‍රකාශය. | අනුකූල වේ |

# ආයතනික පාලනය

| අංකය | ආයතනික පාලන ප්‍රතිපත්ති | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතාවයේ තත්ත්වය |
|---|---|---|---|
| **C** | **කොටස් හිමියන් සමඟ සබඳතා** | | |
| C.1 | වාර්ෂික මහා සභා රැස්වීම (AGM) සහ මහා සභා රැස්වීම් පැවැත්වීම ඵලදායී ලෙස භාවිතා කිරීම. | | අනුකූල වේ |
| C.3 | සම්බන්ධිත පාර්ශවවල ගනුදෙනු ඇතුළු ප්‍රමාණාත්මක ගනුදෙනු අධ්‍යක්ෂවරුන් විසින් කොටස් හිමියන්ට අනාවරණය කළ යුතුය. | | අනුකූල වේ |
| **D** | **වගවීම සහ විගණනය** | | |
| D.1 | මූල්‍ය වාර්තාකරණය | ▪ වාර්ෂික වාර්තාව මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කරන බව සහතික කිරීම සඳහා සියලු උත්සාහයන් ගනු ලැබේ.<br>▪ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් අතුරු වාර්තා සකස් කිරීමේදී සමාගමට අදාල නීති සහ රෙගුලාසි වලට අනුකූල විය.<br>▪ පහත සඳහන් අනාවරණයන් සංග්‍රහය මගින් උපදෙස් ලබාදී ඇති පරිදි වාර්ෂික වාර්තාවේ ඇතුලත් වේ.<br>i. කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය 31 - 62 පිටු.<br>ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 89-91 පිටු.<br>iii. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය 111 පිටුව.<br>iv. පවතින සැලකිල්ල පිළිබඳ ප්‍රකාශය 115 පිටුව.<br>v. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 89 පිටුව.<br>vi. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 98 - 110 දක්වා පිටු.<br>vii. සභාපතිගේ සහ කළමනාකාර අධ්‍යක්ෂගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 16-19 පිටු.<br>viii. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 19 හි අනාවරණය කර ඇති සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු.<br>ix. කැඳවීමට බරපතල ප්‍රාග්ධන අලාභ නොමැත.<br>▪ රජයේ චක්‍රලේඛවලට අනුව සමාගම විසින් අමාත්‍යාංශය ඉල්ලා සිටි අවශ්‍ය අනෙකුත් අතුරු වාර්තා ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ |

| අංකය | ආයතනික පාලන ප්‍රතිපත්ති | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතාවයේ තත්ත්වය |
|---|---|---|---|
| D.2 | අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය. | විගණන කමිටුවේ මගපෙන්වීමෙන් සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන්, ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලන සහ කාලීන නියාමන වලින් සමන්විත ඉතා ඉහළ අවදානම් කළමනාකරණ රාමුවක් සමාගම විසින් ස්ථාපිත කර ඇත. 78 - 88 පිටුවල අවදානම් කළමනාකරණ කොටසේ සහ 92 - 95 පිටුවල විගණන කමිටු වාර්තාවේ මේවා විස්තර කර ඇත. | අනුකූල වේ |
| D.3 | විගණන කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වෙයි. එයට අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලැබේ. එහි සංයුතිය සහ විගණන කමිටුව විසින් සිදු කරනු ලබන කාර්යයන් වාර්ෂික වාර්තාවේ 92 - 95 පිටුවල සඳහන් වෙයි. | අනුකූල වේ |
| **E** | **ආයතනික ආයෝජකයින්** | | |
| | කොටස් හිමියන්ගේ ඡන්දය. | කොටස් හිමියන්ගේ රැස්වීම්වලට සහභාගී වීමට සියලුම ආයතනික කොටස් හිමියන් දිරිගන්වනු ලබන අතර ඔවුන්ගේ අදහස් අදාළ සියල්ලන්ටම දැනුම් දෙනු ලැබේ. | අනුකූල වේ |
| | පාලනය හෙළිදරව් කිරීම් ඇගයීම. | වාර්ෂික වාර්තාව ආයතනික පාලන ක්‍රියාවලිය විස්තර කරයි. | අනුකූල වේ |
| **G** | **අන්තර් ජාලය සහ සයිබර් ආරක්ෂාව** | | |
| | සයිබර් අවදානම් කළමනාකරණයට හා සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරු තාක්ෂණ උපාංග ආයතන ජාලයට සම්බන්ධ කරන ආකාරය පිළිබඳ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට තිබිය යුතුයි. | ■ ආපදා ප්‍රතිසාධන කළමනාකරණ මධ්‍යස්ථාන (DRMC) ව්‍යාපෘතිය ක්‍රියාකාරීව ඇත.<br>■ සැක සහිත ජාල ක්‍රියාකාරකම් නිතිපතා පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය සමඟ ජාල පරාමිති ආරක්ෂා කිරීම, දත්ත නැතිවීම, සයිබර් වංචා කිරීම, බෙදා හැරීමේ සේවා ප්‍රතික්ෂේප කිරීම, ජංගම දුරකථන උපාංග සහ සැක සහිත සයිබර් ක්‍රියාකාරකම් නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා ජාල ආරක්ෂණ තාක්ෂණය ක්‍රියාත්මක කිරීම.<br>■ උපස්ථ සේවාදායකය (Backup server) සහ ප්‍රතිසාධන සේවාදායකය (recovery server)'<br>■ වැඩිදුර විස්තර වාර්තාවේ 78 - 88 පිටුවල අවදානම් කළමනාකරණ කොටසේ විස්තර කර ඇත. | අනුකූල වේ |
| **H** | **පාරිසරික හා සමාජීය සාධක පාලන පිළිබඳ වාර්තාකරණය (ESG)** | | |
| H.1 | ESG කාර්ය සාධනයේ ප්‍රමාණවත් අනාවරණය. | වාර්ෂික වාර්තාව කාර්ය සාධනය පිළිබඳ පරිපූර්ණ සමාලෝචනයක් සපයයි. සමූහය විසින් භාවිතා කරන විවිධ අංශවල කාර්ය සාධනය වාර්තාවේ වෙනම කොටස්වල විස්තර කර ඇත. | අනුකූල වේ |

# අවදානම් කළමනාකරණය

දිගුකාලීන වර්ධනය සඳහා උසස් අවදානම් කළමනාකරණ භාවිතයන් අත්‍යවශ්‍ය බව ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තරයේ විශ්වාස කරයි. සමාගමේ ඉලක්කය වන්නේ සංවිධානයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා තිරසාර වටිනාකමක් ඇති විය හැකි සියලු සාධක බලගන්වමින් මෙහෙයුම්වලට සෘණාත්මකව බලපෑ හැකි අවාසි නිෂේධනය කිරීමයි. අවදානම් කළමනාකරණය යනු අඛණ්ඩව සහ විකාශනය වන ක්‍රියාවලියක් වන අතර ආයතනික උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි එය තීරණාත්මක වේ.

සමාගමේ අවදානම සඳහා සාධක ගණනාවක් බලපාන අතර ඒ සියල්ල සමාගමේ පාලනයට නතු කර ගැනීම අසීරු ය. ආයතනික කීර්තිය, ආරක්ෂාව, පරිසරය, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු, නිෂ්පාදන ගුණාත්මකභාවය සහ තොරතුරු තාක්ෂණය වැනි බාහිර අභියෝග නිසා ගොඩනැගෙන තත්ත්වයන් නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කොටසකි.

### සමාජ-ආර්ථික හු දර්ශනයේ අවිනිශ්චිතතාවය

2022 වර්ෂයේදී, ශ්‍රී ලංකාව COVID-19 වසංගතයෙන් යම් ප්‍රමාණයකට යථා තත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්නුම් කල ද, ව්‍යාපාරවලට සහ ජනතාවට වඩා විශාල බලපෑමක් ඇති කළ නව අභියෝග සමූහයකට රට ඉක්මනින්ම මුහුණ දුන්නේය. 2022 මුළුල්ලේම, ශ්‍රී ලංකාව උද්ධමනය, ඉහළ යන භාණ්ඩ මිල, විදුලි හිඟය සහ උග්‍ර ඉන්ධන හිඟය මගින් ඇති වූ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් සමග පොරබදමින් සිටියේ ය. අසාර්ථක කෘෂිකාර්මික සංක්‍රාන්තියක් හේතුවෙන් මෙම අර්බුදය තවදුරටත් උත්සන්න වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික නිෂ්පාදනයේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. මෙම භයානක තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, ආහාර, ඉන්ධන සහ ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල උග්‍ර හිඟය හේතුවෙන් 2022 මාර්තු මාසයේදී මහජන විරෝධතා පැන නැගුණු අතර ජුලි 13 වැනි දින ජනාධිපතිවරයා රටින් පිටව යාමෙන් පසු අගමැතිවරයා විසින් රට තුළ හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම දක්වා තත්ත්වය උග්‍ර විය.

බලශක්ති ක්ෂේත්‍රයට ද පහත සඳහන් අභියෝග සෘජුවම බලපෑවේ රටේ ආර්ථික දුෂ්කරතා උග්‍ර කරමිනි.

- ගෝලීය ඉන්ධන මිල ඉහළ යාම සහ 2022 වර්ෂයේදී රුපියල අවප්‍රමාණය වීම මත ශ්‍රී ලංකාවේ ආනයන වියදම් ඉහළ ගියේය.
- ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ මුදල් ලබාගැනීමට අභියෝග කරමින් රට දැඩි විදේශ විනිමය අර්බුදයකට මුහුණ දුන්නේය.
- රට තුළ පවතින ආර්ථික දුෂ්කරතා නිසා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම අභියෝගාත්මක විය.
- ඉන්ධන හිඟය හේතුවෙන් සීමිත ඉන්ධන ප්‍රමාණයක් ජනතාව අතර බෙදා හැරීම දුෂ්කර වූ අතර දිගු පෝලිම්වලට සහ සාධාරණ බෙදාහැරීමේ ක්‍රමයක් පවත්වාගෙන යාමේ අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

මෙම නොයෙකුත් සාර්ව හා සූක්ෂ්ම පාරිසරික අභියෝග මධ්‍යයේ, සමාගම රටේ ජනතාවට අඛණ්ඩ සේවාවක් සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමේ අවදානම් අවම කිරීමේ උපායමාර්ගය ශක්තිමත් ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙයි. මෙම සැලසුම් මගින් සමාගමේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් විකල්ප වැඩ විධිවිධාන හරහා බාධාවකින් තොරව අඛණ්ඩව කරගෙන යාමට හැකි වන අතර, ඒ සියල්ල රජයේ නියෝගවලට අනුගතව සිදු කරනු ලබයි.

### ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) ප්‍රතිපත්තිය

අවදානම් කළමනාකරණ උපායමාර්ගය ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි ආයතනික පාලනයේ, කළමනාකරණ තීරණ ගැනීමෙහි සහ ව්‍යාපාරික ක්‍රියාවලියෙහි අත්‍යාවශ්‍ය අංගයකි. ආයතනයෙහි ඉහළ සිට පහළ දක්වා එලදායී මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණයක් අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාර සැළසුම් කිරීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ආරම්භයේ සිට ම අවදානම් කළමනාකරණය පිළිබඳ අවධානය යොමුකරන්නේ නම්, සැළසුම් කිරීම, වාර්තා කිරීම මෙන් ම තොරතුරු පද්ධති විගණනය සහ කළමනාකරණය අතර ද එලදායී ඒකාබද්ධතාවයක් දැකගත හැකිවනු ඇත. ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අවදානම් කළමනාකරණ පිළිවෙත් අනුගමනය කළ ද, ආයතනය සතු විධිමත් ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් (ERM) නොවී ය. ඒ අනුව ස්වභාවයෙන්ම අස්ථාවර සහ කැලඹිලි සහිත අවදානම් ව්‍යාපාරික පරිසරයකට මුහුණ දෙන ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සඳහා 01/11/2021 සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවසාය අවදානම දුරුකිරීම සඳහා වෘත්තීය රාමුවක් ස්ථාපිත කිරීමට සභාපති උවයිස් මොහොමඩ් මහතා ඉතා විචක්ෂණශීලීව තීරණය කළේ ය. එය ආයතනික පාලන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමකි.

සිපෙට්කෝ සහ LIOC සමාගම්වල තොග නිෂ්පාදනවල භාරකරු ලෙස වගකීම ඉටුකිරීමේදී ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම දිගු

කාලයක් බලා සිටි ප්‍රතිපත්තිමය මුලපිරීමක් විය. CPSTL හි වගකීම් ඉටුකිරීමේදී, අවදානම් නිවැරදිව හඳුනාගැනීම ඉතා වැදගත් වේ. මන්ද ඵලදායී අවදානම් අවම කිරීමේ උපාය මාර්ග ස්ථාපනය කිරීමෙන් එහි අරමුණු අනපේක්ෂිත සිදුවීමකින් බාධා නොවන බව සහතික කරයි. තවද මෙසේ අධික ලෙස ගිනි ගන්නා ස්ථානයක ක්‍රියාත්මක ආයතනික වෘත්තීය රාමුව තුළ අවදානම් කළමනාකරණය කිරීම ඕනෑම සංවිධානයකට, විශේෂයෙන් බොහෝ ප්‍රතිලාභ හිමිකර දෙනු ඇත. CPSTL හි සන්දර්භය තුල අලුතින් සකස් කරන ලද අවදානම් ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලයේ, ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වයේ සහ එක් එක් සේවකයාගේ වගකීම් පැහැදිලිව නිර්වචනය කරනු ඇති අතර, එමඟින් සංවිධානයේ සංස්කෘතිය වෙනසක් සඳහා මග පාදනු ඇත. අවදානම පිළිබඳ දැනුවත්භාවය සහ අවදානම් සංස්කෘතිය එහි සාර්ථකත්වයේ වේදිකාව වනු ඇත. එසේ වුව ද අවදානම් අවම කිරීම සඳහා සහභාගීත්ව ප්‍රවේශයක් නිර්මාණය කිරීමට කළමනාකාරිත්වයේ කැපවීම පමණක් නොව පහළ මට්ටමේ කාර්ය මණ්ඩල දායකත්වය ද වැදගත් වනු ඇත.

## අවදානම් පාලනය

අවදානම් කළමනාකරණය කිරීම සහ උපායමාර්ගික දිශානතිය පිළිබඳව අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. කාලෝචිත අවදානම් හඳුනා ගැනීමට සහ වගවීමේ ක්‍රියාවලිය සඳහා ඔවුහු අවදානම් පාලන ව්‍යුහයක් ක්‍රියාත්මක කර ඇත. අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දී කළමනාකරුවන්ට සහ සේවකයින්ට මඟ පෙන්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සැදී පැහැදී සිටියි.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

අවදානම් රුචිය සැකසීම, අවදානම් උපායමාර්ග සන්නිවේදනය කිරීම සහ අවදානම් ඵලදායී කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සැකසීම සහ අනුමත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.

**විගණන කමිටුව**

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන වාර්තා ඇගයීම මගින් කමිටුව අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සමාලෝචනය කරයි. එසේම බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්ය සාධනය තක්සේරු කරයි. එමෙන්ම කමිටුව විසින් එක් එක් දෙපාර්තමේන්තු විසින් වාර්තා කරන ලද අවදානම් සමාලෝචනය කිරීමෙන් අනතුරුව එවැනි අවදානම් වලින් පැන නගින බලපෑම් අවම කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සමාගම විසින් ගත යුතු ක්‍රියාමාර්ග අනුමත කිරීම ද සිදුකරයි.

**කාර්ය ප්‍රධානීන්**

එක් එක් දෙපාර්තමේන්තුව තුළ අවදානම කළමනාකරණය කිරීම සඳහාත්, සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රමිතීන්ට සහ අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූල, සුදුසු අවදානම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරවීමටත් කාර්ය ප්‍රධානීන් මූලික වශයෙන් වගකිව යුතු ය.

**අභ්‍යන්තර හා බාහිර විගණනය**

අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය වන්නේ සංවිධානයක අවදානම් කළමනාකරණය, පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ දැයි ස්වාධීනව සහතික කිරීමයි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම, සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සාධාරණ සහ සත්‍ය නියෝජනයක්දැයි යන්න සහතිකයක් සැපයීම සඳහා බාහිර විගණකවරුන් වගකිව යුතුය.

# අවදානම් කළමනාකරණය

### අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් කළමනාකරණය යනු කාර්ය සාධන සමාලෝචනයට සහ සමාගමේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අනුබද්ධ, අඛණ්ඩව සිදුවිය යුතු ක්‍රියාවලියකි. එම අවදානම් කළමනාකරණයේ අරමුණ ගැටලු ඇතිවීමට පෙර, එසේ ඇතිවීමට තුඩුදෙන විභවයන් හඳුනා ගැනීමයි. එහිදී අවශ්‍ය පරිදි අවදානම් හැසිරවීම සැළසුම් කර අහිතකර බලපෑම් අවම කරගැනීමට අවස්ථාව ලැබේ.

### අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පියවර හතරකින් සමන්විත වේ:

#### 01. අවදානම් තක්සේරුව

වයාපාරයේ අභ්‍යන්තර හා බාහිර පරිසරයට අදළ, වත්මන්, අනාගත සහ මතුවිය හැකි අවදානම් තක්සේරු කිරීම, හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම පිළිබඳ ක්‍රමානුකූල ක්‍රියාවලියකි.

#### 02. අවදානම් සඳහා පිළියම් / අවදානම් අවම කිරීම

අවදානම් සඳහා පිළියම් යනු අවදානම් කළමනාකරණය සඳහා ගනු ලබන ක්‍රියාවකි. අවදානමෙහි ස්වභාවය මත පදනම්ව සමාගම අවදානම පිළිගැනීම හෝ මඟ හැරීම සිදු කළ යුතු වෙයි.

#### 03. අධීක්ෂණය සහ සමාලෝචනය

අවදානම් අධීක්ෂණය යනු, අවදානම් කළමනාකරණ උපාය මාර්ග ගැලපෙයි ද, වෙනස් කළ යුතු ද යන්න හඳුනා ගන්නා අඛණ්ඩ ක්‍රියාවලියකි.

#### 04. සන්නිවේදනය සහ උපදේශනය

සන්නිවේදනය සහ උපදේශනය, සුවිශේෂී අදියරක දී නොව අවදානම් කළමනාකරණයේ, සමස්ත ක්‍රියාවලිය හරහා දිව යයි. සංවිධානයක කාර්ය මණ්ඩලය තුළ සිටින සෑම කෙනෙකුම ඔවුන්ගේ කාර්යභාරය අනුව උපාය මාර්ග, අවදානම් ප්‍රමුඛතා සහ අදාල වගවීම් ආදිය සහතික කළ යුතුය.

අනෙකුත් කරුණු අතර, උසස් අභ්‍යන්තර තොරතුරු හුවමාරු සහ සන්නිවේදන ක්‍රියාවලීන් සහතික කිරීම සහ අවදානම් කළමනාකරණය අභ්‍යන්තර පාලනය පිළිබඳ බාහිර වයාප්තිය සඳහා වගකීම භාර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්වලට ඇතුලත් වෙයි.



### අවදානම් කළමනාකරණය සඳහා සමාගම් ප්‍රවේශය

සමාගම අවදානම් හඳුනා ගැනීමට, කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට ආරක්ෂක ක්‍රමවේද දෙකක් අනුගමනය කරයි. එය පහත සාරාංශගත කර ඇත.

| 01 වන මට්ටමේ ආරක්ෂක උපක්‍රමය |
|---|
| **කාර්ය ප්‍රධානීන්** |
| කාර්ය ප්‍රධානීන් ඔවුන්ගේ කාර්යයට අදාල අවදානම් හඳුනා ගැනීම, තක්සේරුව, අධීක්ෂණය, වාර්තා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතුය.<br>අංශ ප්‍රධානීන්ට ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ වැළැක්වීම පහසු වනු පිණිස, සමාගම විසින්, සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ආවරණය වන පරිදි පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් නිර්මාණය කර ඇත. |

| 02 වන මට්ටමේ ආරක්ෂක උපක්‍රමය |
|---|
| **අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණනය** |
| අභ්‍යන්තර විගණනය මගින් සමස්ත අවදානම් කළමනාකරණයේ හා අභ්‍යන්තර පාලන රාමුවේ ප්‍රමාණවත් බව හා ඵලදායී බව පිළිබඳ ස්වාධීන තක්සේරුවක් ලබාදෙන අතර ස්වාධීනව විගණන කමිටුවට වාර්තා කරනු ලබයි.<br>බාහිර විගණකවරුන් ස්වාධීන ආයතනයක් වන අතර ඔවුන්ගේ වගකීම වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සාධාරණ සහතිකයක් ලබාදීමයි. |

**සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය**

| අවදානම | ප්‍රධාන මෙහෙයවන්නන් | අවම කිරීමේ උපාය මාර්ග |
|---|---|---|
| **වසංගත අවදානම** | | |
| 2022 වර්ෂයේදී, ශ්‍රී ලංකාව COVID-19 වසංගතයෙන් වඩාත් පුළුල් ලෙස ප්‍රකෘතිමත් වීමේ සලකුණු ප්‍රදර්ශනය කළේය. කෙසේ වෙතත්, සමාගම ඒ ආශ්‍රිත අවදානම් සාධක සම්පූර්ණයෙන්ම ඉවත් නොකර සෞඛ්‍ය සහ ආරක්ෂිත පියවර කෙරෙහි අවධානය යොමු කළේය.<br> | | සමාගම සිය සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා පහත පියවර අනුගමනය කරන ලදි.<br>• අවශ්‍ය ආරක්ෂක උපකරණ සහ ආම්පන්න සැපයීම.<br>• රැකියා ස්ථානයේ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම.<br>• සනීපාරක්ෂාව පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම.<br>• සේවකයින්ට සහ පරිශ්‍රයට එන අනෙකුත් අමුත්තන්ට සඳහා අවශ්‍ය PPE සහ විෂබීජ නාශක ලබා දීම.<br>• කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ උෂ්ණත්වය පරීක්ෂා කිරීම සහ ප්‍රදර්ශනය කිරීම.<br>• ප්‍රධාන රැකියා සඳහා උපස්ථ කණ්ඩායමක් සංරක්ෂණය කිරීම.<br> |

# අවදානම් කළමනාකරණය

| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| **අවදානම** | **ප්‍රධාන මෙහෙයවන්නන්** | **අවම කිරීමේ උපාය මාර්ග** |
| **තරගකරුවන්ගේ අවදානම** | | |
| අනෙකුත් පර්යන්ත සමාගම්වලින් අපගේ පාරිභෝගිකයින්ට අඩු මිලකට, ඉතා හොඳ ගබඩා පහසුකම් ලබාදිය හැකිනම් ඉන් ඇතිවන තරගය අපගේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵල කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීමත් සමඟ 2022 ඔක්තෝබර් 21 දින සම්මත කරන ලද පනත් කෙටුම්පත හරහා පුද්ගලික අංශයට ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය හා බෙදා හැරීම සඳහා බලපත්‍ර ලබා දෙනු ඇති අතර එමගින් අනාගතයේදී තරඟකරුවන්ගේ අවදානමක් නිර්මාණය විය හැක. | • අප තරග කරන CPC සහ LIOC පර්යන්ත සමාගම් CPSTL හි කොටස් හිමියන් වෙති.<br>• පුද්ගලික සමාගම්වලට ඛනිජ තෙල් කර්මාන්තයට ඇතුළුවීමට අවස්ථාව ලබා දීම තුලින් අනාගතයේදී තරඟකාරිත්වයේ අවදානම වැඩි විය හැක. | • ගබඩා ධාරිතාව වැඩි කිරීම හෝ වෙනත් ආකාරයකින් දැනට පවතින පර්යන්ත පුළුල් කිරීම.<br>• ටැංකිරථ සංචිතය පුළුල් කිරීම.<br>• සුදුසුකම් ඇති සේවකයින් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ උසස් සේවා ප්‍රමිතීන් පවත්වා ගෙන යාම.<br>• වෙනස්වන පාරිභෝගික මනාපයන්ට ගැලපෙන නව තාක්ෂණයෙන් පිරිපුන් සේවාවන් සැපයීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය හරහා නවෝත්පාදන මත අඛණ්ඩව රැඳෙමින් අපගේ තරගකරුවන්ට වඩා ඉදිරියෙන් සිටීමට අපි අවධානය යොමු කරමු. |
| **සේවක රඳවා තබා ගැනීමේ අවදානම** | | |
| අපගේ අනාගත සාර්ථකත්වය රඳා පවතින්නේ අපගේ විධායක නිලධාරීන්ගේ සේවය සහ අනෙකුත් ප්‍රධාන සේවකයන්ගේ අඛණ්ඩ පැවැත්ම මතය. අපගේ විධායක නිලධාරීන්ගෙන් හෝ ප්‍රධාන සේවකයින් එක් අයෙකුගේ හෝ වැඩි ගණනක සේවය අහිමි වුවහොත් අපගේ ව්‍යාපාරයට, මෙහෙයුම් ප්‍රතිඵලයට සහ මූල්‍ය තත්ත්වයට හානියක් විය හැකිය.<br><br>රට තුළ දැනට පවතින අවිනිශ්චිතතාවය මත, වෘත්තිකයන් වෙනත් රටවලට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් පවතින අතර ඒ හේතුවෙන්, පළපුරුදු සේවකයින් අහිමි වීම හරහා සමාගමට බලපෑම් ඇති විය හැක. | • රට තුළ පවතින ආර්ථික හා දේශපාලන අවිනිශ්චිතභාවය<br>• පවතින උසස්වීම් යෝජනා ක්‍රමය සහ ක්‍රියා පටිපාටි පිළිබඳ සේවක බලාපොරොත්තු සුන්වීම.<br>• වෘත්තියේ සංවර්ධන අවස්ථා නොමැතිකම.<br>• අගය නොකිරීමේ හැඟීම.<br>• දුර්වල නායකත්වය.<br>• නම්‍යශීලී බවක් නොමැති වීම. | • ප්‍රධාන භූමිකාවන් සඳහා අනුප්‍රාප්තික සැලසුම්.<br>• උසස් තත්ත්වයේ දක්ෂතා සඳහා "Skill Fit" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>• සේවක පිළිගැනීමට ලක්කිරීම සහ උසස්වීම් ඔස්සේ ශක්තිමත් සේවක වටිනාකම් ඇගයීම් හරහා සේවක අභිප්‍රේරණය පවත්වා ගැනීම.<br>• වෘත්තීය දියුණුව සඳහා අවස්ථා.<br>• සමාජ සහ සුබසාධන සත්කාරකත්වය සඳහා අඛණ්ඩ නියැලීම්.<br>• සියලුම සේවකයින් ආවරණය වන ලෙස පුහුණු, සංවර්ධන සහ ව්‍යුහගත පුහුණු වැඩසටහන් සඳහා අඛණ්ඩ ආයෝජනය. |

| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| **අවදානම** | **ප්‍රධාන මෙහෙයවන්නන්** | **අවම කිරීමේ උපාය මාර්ග** |
| **ආර්ථික අවදානම** | | |
| සැහැල්ලු පිරිපහදු නිෂ්පාදන, අධි පිරිපහදු නිෂ්පාදන, බොරතෙල් සහ අනෙකුත් ආශ්‍රිත සේවාවන් කෙරෙහි පවතින ඉල්ලුම මත අපගේ මූල්‍ය ප්‍රතිඵල රඳා පවතී.<br><br>COVID-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ විදේශ විනිමය අර්බුදය හේතුවෙන් රට තුළ පවතින අයහපත් ආර්ථික තත්ත්වය මත අඛණ්ඩ ඉන්ධන සැපයුමක් පවත්වාගෙන යාමේ අභියෝගයට ජාතිය මුහුණ දී සිටී. මෙම තත්ත්වය අපගේ පර්යන්තවල ගබඩා භාවිතය සහ බෙදා හැරීමේ සේවාව සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය හැකි අතර, එය අපගේ මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපෑ හැකිය. | • COVID-19 පාලනය කිරීමට රජය ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සඳහා ශ්‍රී ලංකාවේ සියලූම පුරවැසියන්ගේ උනන්දුව යොමු විය. රජය ඇඳිරි නීතිය පැනවීමෙන් පසු නිවසේ සිට වැඩ වැඩකිරීමට සැලැස්වීම දක්වා පියවර රැසක් ගෙන සමාජ දුරස්ථභාවය සහතික කරන්නට කටයුතු කළේ ය.<br>• COVID-19 හි බලපෑමෙන් ඇති වූ ආර්ථික බිඳවැටීමෙන් 2020 මාර්තු සිට ශ්‍රී ලංකා රුපියල තියුණු ක්ෂයවීමක් පෙන්නුම් කළේ ය.<br>• ගෝලීය වෙළෙඳපොළ බොරතෙල් බැරලයක මිල අනුව ඉන්ධන මිල සූත්‍රය නිරන්තරයෙන් වෙනස් කිරීමට සිදු විය.<br>• තීරුබදු / බදු, පොලී අනුපාත, උද්ධමනය, බලශක්තිය මිල පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ඉන්ධන නිෂ්පාදන සඳහා පවතින ඉල්ලූමට සෘජුවම බලපායි. | • අහිතකර ආර්ථික සාධක හරහා පැන නගින අවිනිශ්චිත මූල්‍ය අර්බුදවලට විකල්ප ලෙස කෙටි කාලීන  සහ දිගු කාලීන මූල්‍ය ආයෝජන ඉදිරිපත් කෙරෙයි.<br>• රසායනාගාර පරීක්ෂණ ගාස්තු, පුද්ගලික බවුසර් පුහුණුව / පෝටර් ගාස්තු, ගිනි නිවීමේ සේවා, ක්‍රමාංකන ගාස්තු, කුලියට දීම් ආදී වෙනත් මූලාශ්‍රවලින් ආදායම වැඩි දියුණු කිරීම.<br><br>ඛනිජතෙල් කර්මාන්තය ලිහිල් කිරීම මගින් විදේශ මුදල් අර්බුදය හේතුවෙන් ඉන්ධන සැපයුම අඩාල වීමේ අවදානම අවම කිරීමට රජය පියවර ගෙන ඇත. මෙම පියවර පුද්ගලික අංශයට වෙළඳපොළට ඇතුළු වීමට ඉඩ සලසන අතර එමඟින් අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීමට සහ විදේශ මුදල් සංචිතවල පීඩනය සමනය කිරීමට උපකාරී වේ. |
| **දේශපාලන අවදානම** | | |
| දේශපාලනික සහ නියාමන සාධක ව්‍යාපාරික පරිසරයට සැලකිය යුතු ලෙස බලපෑ හැකි අතර අප සමාගම ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ ක්‍රියාත්මක වන බැවින් දේශපාලන අවදානම් කිහිපයකට මුහුණ දීමට සිදු විය හැක. එම දේශපාලන අවදානම් වලට ඇතුළත් වන්නේ: | • නියාමන වෙනස්කම්: ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් කර්මාන්තය ලිහිල් කිරීම සඳහා 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම.<br>• ඉන්ධන මිල පාලනය | • මෙම දේශපාලන අවදානම් අවම කිරීම සඳහා, ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට ක්‍රියාශීලී අවදානම් කළමනාකරණය සහ රාජ්‍ය සම්බන්ධතා පවත්වා ගැනීම යන ප්‍රයත්නවල නිරත විය හැක. මෙයට රාජ්‍ය නිලධාරීන් සමඟ අඛණ්ඩ සංවාදයන්, රෙගුලාසි පිළිපැදීම සහ අනුකූලතා ප්‍රමිතීන් ඇතුළත් විය හැකිය.<br>• ව්‍යාපාර මෙහෙයුම් විවිධාංගීකරණය කිරීම. |

# අවදානම් කළමනාකරණය

| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| අවදානම | ප්‍රධාන මෙහෙයවන්නන් | අවම කිරීමේ උපාය මාර්ග |
| **ආර්ථික අවදානම** | | |
| | • රජයේ ප්‍රතිපත්ති වෙනස් කිරීම්: මිල නියම කිරීම්, බදුකරණය සහ ආනයන/අපනයන ප්‍රතිපත්ති ඇතුළුව ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම් CPSTL හි මෙහෙයුම් සහ ලාභදායිත්වයට සෘජුවම බලපෑ හැකිය.<br>• විදේශ විනිමය පාලනය: මුදල් අර්බුද හෝ ආර්ථික අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ආනයන සහ ගෙවීම් සඳහා විදේශ මුදල් ප්‍රවේශ කිරීමට CPSTL සතු හැකියාව කෙරෙහි බලපාන විදේශ විනිමය පාලනයන් රජය විසින් පැනවිය හැක.<br>• භූ දේශපාලන ආතතීන්: අසල්වැසි රටවල් සහ ගෝලීය බලවතුන් සමඟ ශ්‍රී ලංකාවේ භූ දේශපාලනික සබඳතා ඛනිජ තෙල් කර්මාන්තයට බලපෑම් කළ හැකි අතර අවිනිශ්චිතභාවයක් ඇති කළ හැකිය. | |
| **සේවක සබඳතා අවදානම** | | |
| අපගේ සේවකයින්ගෙන් 99% ක් පමණ වෘත්තීය සමිති සාමාජිකයන් වන අතර ආයතනය ඒ නිදහසේ අයිතිය පිළිගෙන ඇත.<br><br>උදාහරණයක් ලෙස, රජයේ ආයතන පෞද්ගලීකරණය කිරීමට සහ ඛනිජ තෙල් පනත සංශෝධනය කිරීමට එරෙහිව වසර තුළ විරෝධතා කිහිපයක් පැවැත්විණි. | • වෘත්තීය සමිති කම්කරු වැඩ වර්ජන අනවශ්‍ය බාධා ඇති කරයි. | • වෘත්තීය සමිති සමඟ සබඳතා ශක්තිමත් කිරීමට සහ දුක්ගැනවිලි තර්ජනීය අවදානමක් දක්වා වර්ධනය වීමට පෙර ඒවා විසඳීමට වේදිකාවක් ලෙස භාවිතා කෙරෙයි.<br>• සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ විධිමත් ව්‍යුහගත සංවාදයන්.<br>• සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කිරීමට සේවකයින් සඳහා විවෘත ප්‍රතිපත්තියක්. |

| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| **අවදානම** | **ප්‍රධාන මෙහෙයවන්නන්** | **අවම කිරීමේ උපාය මාර්ග** |
| **ස්වාභාවික උපද්‍රව සහ අවිනිශ්චිතතා** | | |
| ස්වාභාවික විපත් සහ අපගේ පාලනයෙන් තොර වෙනත් සිදුවීම් නිසා අපගේ මෙහෙයුම්වලට බලපෑම් ඇති විය හැක.  | • ගංවතුරෙන් බාධා, නායයෑම්, දරුණු කුණාටු.<br>• ත්‍රස්ත ක්‍රියා. | • ඇතැම් අවදානම් හඳුනාගෙන ඒවාට පිළියමක් ලෙස රක්ෂණ ආවරණ ලබා ගෙන ඇත.<br>• සමාගම ආර්ථික මර්මස්ථානයක් බැවින් අධි ආරක්ෂිත පියවර සහ පාලනයන් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| **මෙහෙයුම් අවදානම** | | |
| සමාගමට මෙහෙයුම් ආශ්‍රිත උපද්‍රව බලපෑ හැකිය. | • අනපේක්ෂිත කාන්දුවීම් /නල මාර්ගවලට හානි වීම් මෙහෙයුම් ප්‍රමාදයක් ඇති කරයි.<br>• යටිතල පහසුකම් හෝ පහසුකම් සැපයුමේ බාධා<br>• අනතුරු<br>• මහා පරිමාණ ගිනි | • කාන්දුවීම් හා හානි අවම කිරීම සඳහා නල මාර්ග නිතිපතා සේවා සැපයීම සහ නඩත්තු කිරීම.<br>• ඕනෑම හානිකර බලපෑමක් අවම කිරීම සඳහා සේවකයන් ප්‍රමාණවත් ලෙස පුහුණු කර ඇත.<br>• CPSTL විසින් ගෘහස්ථ ගිනි නිවන ඒකකයක් රඳවා ඇත.  |
| **නෛතික අවදානම** | | |
| අපගේ මෙහෙයුම් නිෂ්පාදන තත්ත්ව පිරිවිතරයන්ට අදාල ශ්‍රී ලංකා නීති සහ රෙගුලාසිවලට යටත් වේ. එසේ ම අපගේ අලෙවිකරුවන් විසින් බෙදා හරින අපේ නිෂ්පාදනවල ප්‍රමිතිය පිළිබඳ වගකීම අප සතු ය. | • වාෂ්ප පීඩනය, සල්ෆර් අන්තර්ගතය, එතනෝල් අන්තර්ගතය සහ ජෛව ඩීසල් සාන්ද්‍රණය යනාදි නිෂ්පාදන තත්ත්ව පිරිවිතර සුරැකීම හෝ මිශ්‍ර කිරීම පිළිබඳ නෛතික අවශ්‍යතා<br>• මෙහෙයුම් වලට සම්බන්ධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය උල්ලංඝනය කිරීම මත අපට ආරෝපණය කළ හැකි නීති මගින් සැලකිය යුතු දඩ සහ දඬුවම් මෙන් ම ඍණාත්මක ප්‍රචාරයන්වලට ද මුහුණ දීමට සිදුවිය හැක. | • CPSTL සතුව, ඕනෑ ම ආකාරයක ඉන්ධන විශේෂයක් පිළිබඳ පරීක්ෂණ සියුම් ලෙස සිදුකිරීම සඳහා තත්ත්ව පාලන යාන්ත්‍රණ සහ අනුකූලතාවය සහ නියාමනය පිළිබඳ සහතික ලත් නවීන රසායනාගාරයක් ඇත. |

# අවදානම් කළමනාකරණය

| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| **අවදානම** | **ප්‍රධාන මෙහෙයවන්නන්** | **අවම කිරීමේ උපාය මාර්ග** |
| **ශෛතික අවදානම** | | |
| | • බෙදා හරින ලද ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන නිසා එන්ජින් කාර්ය සාධනය දුර්වල වී හෝ එන්ජින් හානියක් සිදුවී ඇත්නම් ඒ සඳහා වගකිව යුතු මෙන් ම සෘණාත්මක ප්‍රචාරයන්වලට ද මුහුණ දීමට සිදුවිය හැක. |  |
| **සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික අවදානම** | | |
| සංකීර්ණ සහ නිතර වෙනස් වන පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂාව, නීති සහ රෙගුලාසිවලට, අනුකූල වීමේදී අපට සැලකිය යුතු පිරිවැයක් සහ වගකීම් දැරීමට සිදු විය හැකිය. | • වහා ගිනි ඇවිලෙන සුළු නිෂ්පාදන හැසිරවීමේ මෙහෙයුම් කටයුතු අධි අවදානම් කාණ්ඩයට අයත් වේ. සුළු අත් වැරැද්දකින් වුව ද මහා පරිමාණ ගින්නක් ඇතිවිය හැකි නිසා එවැනි සිදුවීමක් වුව ද සමාගමේ මෙහෙයුම් මෙන්ම රටේ ආර්ථිකය අඩපණ කිරීමට හේතු වනු ඇත.<br>• ගබඩා කිරීම, හැසිරවීම සහ ඛනිජ තෙල් ප්‍රවාහනය ක්‍රියාවලියේදී හානිකර වායු, ගෑස් සහ ද්‍රව්‍ය වායු ගෝලයට සහ පරිසරයට විමෝචනය කිරීම.<br>• අපගේ ව්‍යාපාරය තුළ අහඹු කාන්දුවීම්, විසර්ජන හෝ වෙනත් ඛනිජ තෙල් නිකුත් වීම් සහ අනතුරුදායක සිදුවීම් නෛසර්ගිකව විය හැකිය. පරිසරයට සහ අසල්වැසි ප්‍රදේශයන්ට එවැනි අවදානමක් ඇත්නම් වගකීම් සහගතව පිළියම් යෙදීමට සිදුවේ.<br>• අදාල පාරිසරික, සෞඛ්‍යය සහ ආරක්ෂක නීති සහ රෙගුලාසිවලට අනුකූල වීමට අපොහොසත් වුවහොත් අපගේ සියලුම මෙහෙයුම් අවලංගු කිරීම් සහ වාරණ නියෝග පැනවීමටත් සමහරක් සීමා කිරීම හෝ තහනම් කිරීම සිදු විය හැක. | • CPSTL විසින් ප්‍රථමාධාර පුහුණුව, ගිනි ආරක්ෂක පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරු ක්‍රියාත්මක කරයි. යොදවා ඇති ගිනි ආරක්ෂණ උපකරණ නිරතුරුව පරීක්ෂා කර උපරිම ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව සහතික කරනු ලැබේ. එනම් නිතිපතා ගිනි සයිරන් ක්‍රියාකාරීදැයි පරීක්ෂා කිරීම, කාර්යාලීය උපකරණවලට ලිහිසි තෙල් දැමීම සහ නළ මාර්ග නිතිපතා පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.<br>• CPSTL වරින් වර විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් මඟින් අපවිත්‍ර තෙල් බැහැර කරන අතර, අපද්‍රව්‍ය පරිසරයට හානි නොකරන බවට සහතික වෙයි.<br>• අපජලයේ ගුණාත්මකභාවය අවශ්‍ය ප්‍රමිතිය රඳවා ගැනීමට අපජල බැහැර කිරීමේ පද්ධතිය නියාමනය කර ඇත.<br>• නිසි ලෙස කසළ වෙන් කිරීම සහ බැහැර කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කර ඇත.<br>• නළ මාර්ග/ අක්වෙරළ කාන්දුවීම් හැසිරවීම සඳහා මනා පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් යොදවා ඇත. |

**සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය**

| අවදානම | ප්‍රධාන මෙහෙයවන්නන් | අවම කිරීමේ උපාය මාර්ග |
|---|---|---|
| **සයිබර් අවදානම** | | |
| අපගේ වත්කම් ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යාපාර කළමනාකරණය කිරීමට තාක්ෂණික පද්ධති භාවිතා කරන අතර සයිබර් ප්‍රහාරයක් හෝ වෙනත් ආරක්ෂක බිඳවැටීමක් නිසා අපගේ තොරතුරු තාක්ෂණික පද්ධති වල කඩාවැටීමක්, තීරණාත්මක මෙහෙයුම් හෝ මූල්‍ය පාලනයන් බිඳ වැටීමට මෙන් ම වාණිජ ක්‍රියාකාරකම් හෝ මූල්‍ය ක්‍රියාවලීන් ඇණහිටීමට හේතු විය හැකිය.  | • COVID-19 පැතිරීම හේතුවෙන්, නිවාසවල සිට අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වී වැඩ කරන සේවකයින්ගේ උපාංග මෙන් ම ආයතනික තොරතුරු ආරක්ෂක අවදානම් වලට නිරාවරණය වේ.<br>• සයිබර් සිදුවීම්වල බලපෑම, හැකර්වරුන්ගේ ඉලක්කගත ප්‍රහාරයක්, ඉලක්කගත නොවන ප්‍රහාරයක්, අභ්‍යන්තරික ප්‍රහාරයක්, අහඹු සයිබර් ප්‍රහාරයක් හෝ ඒ අතුරින් කිහිපයකින් එල්ල විය හැකිය. | • ජාල පරිමිතිය ආරක්ෂාව කළමනාකරණය කිරීමේ තාක්ෂණය, දත්ත නැතිවීම, සයිබර් වංචා කිරීම, බෙදා හරින ලද සේවා ප්‍රහාරය ප්‍රතික්ෂේප කිරීම, ජංගම උපාංග සහ සැක සහිත සයිබර් ක්‍රියාකාරකම් නිරීක්ෂණය, පාලනයන් නිතිපතා පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය යනාදී ජාල ආරක්ෂණයන් ක්‍රියාත්මක කිරීම.<br>• සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක ආපදා ප්‍රතිසාධන කළමනාකරණ මධ්‍යස්ථානය (DRMC)<br>• උපස්ථ සේවාදායකය සහ ප්‍රතිසාධන සේවාදායකය |
| **තොග, දේපළ සහ උපකරණ පිළිබඳ අවදානම** | | |
| ගබඩා කළ නිෂ්පාදනවල ගිනිගැනීමේ ස්වභාවය හේතුකොටගෙන, රක්ෂණ ආවරණයේ කිසියම් ප්‍රමාණවත් නොවන/ අපැහැදිලි බවක් මගින් රක්ෂණ සමාගම විසින් රක්ෂණ හිමිකම් අගරු කිරීමකට හේතු විය හැක. | | • IBSL යටතේ ලියාපදිංචි වී ඇති කීර්තිමත් සමාගම්වලින් ලබාගත් රක්ෂණය<br>• CPSTL විසින් ගිනි සහ වාණිජ රක්ෂණය, නැව්කඳ ඔප්පුව (අක් වෙරළ නළ මාර්ග), නිෂ්පාදන රක්ෂණය, රථවාහන රක්ෂණය, ගබඩා ටැංකි සහ උපකරණ රක්ෂණ ආදී ප්‍රමාණවත් රක්ෂණ ආවරණ ලබා ගෙන ඇත. |
| **ඉන්ධන පර්යන්ත කර්මාන්තය සබැඳි නිශ්චිත වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් නොමැතිවීම/ සීමිතකම** | | |
| කාර්යය ක්‍රියාත්මක කිරීමේ වේගය සහ ඉහළ වැඩ පිරිවැය | | • කාර්යයන් භාර දීමෙන් දේශීය සේවක පිරිස් සංවර්ධනය කිරීම.<br>හැකියාව ඇති විදේශීය පාර්ශවයන් සමඟ ඔවුන් සක්‍රීයව සහභාගී කරවීම. |
| **ප්‍රාදේශීය ප්‍රජා සම්බන්ධතා පිළිබඳ අවදානම** | | |
| සමාගමේ ප්‍රතිරූපය ගොඩනැගීමේ දී ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික ප්‍රගතිය බලගැන්වීම සහ දායක වීම සඳහා අපේ ක්‍රියාත්මක වීම ඉතා වැදගත් වේ.<br>උදා. කොළඹ සිට කොළොන්නාව දක්වා අලුත් නළ මාර්ග ව්‍යාපෘතිය ගැන ගම්වැසියන්/නිවැසියන් අතර ආරවුලක්. | | • ඉහළ මට්ටමේ ප්‍රජා සහභාගීත්වය සහ අපේ ප්‍රජාවන් සමඟ අර්ථවත් සබඳතා පෝෂණය කිරීම<br>උදා. COVID 19 පාලනය කිරීම සඳහා රට තුළ පොදු ස්ථාන විෂබීජහරණය කිරීම සහ මහජනතාවට සනීපාරක්ෂක ද්‍රව්‍ය බෙදා හැරීම |

# අවදානම් කළමනාකරණය

| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| **අවදානම** | **ප්‍රධාන මෙහෙයවන්නන්** | **අවම කිරීමේ උපාය මාර්ග** |
| **ප්‍රාදේශීය ප්‍රජා සම්බන්ධතා පිළිබඳ අවදානම** | | |
|  | | • දැනට පවතින ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම.<br>උදා. කොළඹ කොටුවේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන නළය අසල අනවසරයෙන් පදිංචිව සිටි පැල්පත්වාසීන්ට නව නිවාස ලබාදීම. |
| **වංචා සහ නීති විරෝධී ක්‍රියා** | | |
| කළමනාකරණ වංචා, සේවක වංචා සහ වෙනත් නීති විරෝධී ක්‍රියා පිළිබඳ අවදානම | | • අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීමේ ක්‍රියාවලිය සඳහා CPSTL සමාගමට වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ඇත.<br>• සෑම ක්‍රියාවලියක් සඳහාම අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය සහ අභ්‍යන්තර විගණන අංශයේ මගපෙන්වීම යටතේ බලය පැවරීම.<br>• බාහිර විගණකවරුන් විසින් ඇගයීමට ලක් කරන ලද මූල්‍ය ප්‍රකාශයේ අඛණ්ඩතාව. |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව පිළියෙල කළ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා, සමාගමේ කටයුතු පිළිබඳ වූ වාර්ෂික වාර්තාව පිළිගැන්වීමට ලැබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සතුට ප්‍රකාශ කරමු.

මෙම වාර්තාව අධ්‍යක්ෂවරුන් විසින් 2023 අගෝස්තු 31 වන දින අනුමත කර ඇත.

### ප්‍රමුඛ ක්‍රියාකාරීත්වය

සමාගමේ ප්‍රමුඛ ක්‍රියාකාරීත්වය වන්නේ ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් තොග ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවා ඇති පොදු පරිශීලක පහසුකම සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310 - 8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග, බවුසර් ඇණියෙන් සමන්විත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරීත්වය සමග ක්‍රියාත්මක කිරීමත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භුක්තිවිඳින කොළොන්නාව සහ මුතුරාජවෙල පර්යන්තයන්, දිවයින පුරා පිහිටි තොග ගබඩා හා ඒ ආශ්‍රිත පහසුකම්, කොළඹ වරායේ තෙල් පහසුකම් භාවිත කිරීමට අයිතිය සහ/හෝ බදු අයිතිය, ඒකස්ථාන පාවෙන බෝයාවේ සිට මුතුරාජවෙල පර්යන්තය දක්වා වූ කොළඹ වරායේ සිට කොළොන්නාව පර්යන්තය දක්වා නළ මාර්ගයේ සිට පාරිභෝගිකයින්ගේ සීමා දක්වා ගාලු වරායේ සිට මාගල්ල තොග ගබඩාව දක්වා නළ මාර්ගය ඉහත සඳහන් කළ පර්යන්ත සහ තොග ගබඩා තුල පිහිටි නළ මාර්ග සහ / හෝ කාර්යයන් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත්ය.

මෙහෙයුම් සහ මූල්‍යමය විශේෂතා සමාලෝචනය
රු. (704,084,743/-) ක බදු පෙර අලාභයක් සමග රු. 9,433,316,086/- ක ආදායමක් මෙහෙයුම්වලින් පෙන්වා ඇත.

| විස්තර | 31.12.2022<br>රු. | 31-12-2021<br>රු. |
|---|---|---|
| ආදායම | 9,433,316,086 | 14,276,189,292 |
| බදුවලට පෙර ලාභය | (704,084,743) | 1,578,247,372 |
| බදුවලට පසු ලාභ/(අලාභ) (PAT) | (1,058,696,799) | 1,169,211,614 |

### ප්‍රකාශිත ප්‍රාග්ධනය

2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 7,500,000,000/-කි. කොටස් හිමිකාරීත්වයේ බෙදීයාම පහත පරිදි වේ.

| | සාමාන්‍ය කොටස් |
|---|---|
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 500,000,000 |
| ලංකා IOC සමාගම | 250,000,000 |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

### දේපළ, පිරියත සහ උපකරණ

වසර තුල දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් පිළිබඳ දත්ත මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන - 10 යටතේ දක්වා ඇත.

### ලාභාංශ

අධ්‍යක්ෂවරු 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වසරට සමාගමේ ලාභාංශ නිර්දේශ කොට නැත.

### ආයතනික පරිත්‍යාග

වසර තුළ සමාගම රු. 317,000/- ක පරිත්‍යාග සහ අනුග්‍රාහක ගෙවීම් සිදුකර ඇත.

### 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරු

2022 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය:

මොහොමඩ් උවයිස් මොහොමඩ් මහතා
එල්.ඊ. සුසන්ත සිල්වා මහතා
ඊ.ඒ. රත්නසීල මහතා
මනෝජ් කුමාර් ගුප්තා මහතා
අසීම් භාර්ගවා මහතා
රාජේෂ් භගත් මහතා
ධර්මදාස පණ්ඩිතරත්න මහතා
ඩී.ජී. රවීන්ද්‍ර මනෝජ් කුමාර් මහතා

### අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප්

අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප්, මූල්‍ය ප්‍රකාශනයේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

### සම්බන්ධතා ලේඛනය

2007 අංක. 07 දරණ සමාගම් පනත අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වා ගනියි. 2007 අංක. 07 දරණ සමාගම් පනතෙහි 192(2) දරණ වගන්තිය අනුව සියලු අධ්‍යක්ෂවරු ප්‍රකාශ නිකුත් කොට ඇත. අදළ දත්ත සමාලෝචිත වර්ෂය තුල සම්බන්ධතා ලේඛනයට ඇතුළත් කොට ඇත.

### ව්‍යවස්ථාපිත ගෙවීම

සමාගම රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලු ව්‍යවස්ථානුකූල ගෙවීම් තම අවබෝධයට අනුව මේ දක්වා ගෙවා ඇති බවට හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව ඇත.

### අඛණ්ඩ පැවැත්ම

සිය ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. අඛණ්ඩ පැවැත්මේ පදනම මූල්‍ය වාර්තා සැකසීමට යොදාගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරයි.

**ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇතිකරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 30 යටතේ දක්වා ඇති ඒවා හැර ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවූ වැදගත් සිදුවීම් නොමැත.

**විගණකවරු**

19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව, සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු විසින් නම්කළ අයෙකු සමාගමට පත්කිරීම අවශ්‍ය වේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයේ විගණන කටයුතු ජාතික විගණන කාර්යාලය විසින් සිදුකරන ලදී. විගණකවරුන්ට සිදුකළ ගෙවීම් මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

විගණකවරුන්ට සමාගම හෝ සමාගම් සමූහය සමඟ කිසිදු සම්බන්ධයක් (විගණකවරයෙක් වශයෙන් හැර) නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවබෝධයයි. ඔවුන් වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආචාර ධර්ම මාලාවට අනුකූල බවත්, ස්වාධීන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කරයි.

**සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම**

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2023 සැප්තැම්බර් 11 වන දින ප.ව. 3 ට සමාගමේ ලියාපදිංචි කාර්යාලයේදී පැවැත්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්,

**එම් යූ මොහොමඩ්**
**සභාපති**

**අධ්‍යක්ෂ**

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**

**ගිණුම්කරණ පද්ධති ලේකම් සේවා**
**(පුද්ගලික) සමාගමේ ලේකම්වරු**

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### සංයුතිය

CPSTL හි විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් සාමාජිකයින් 03 දෙනෙකුගෙන් සමන්විත වේ.

- ඊ.ඒ. රත්නසීල මහතා - සභාපති
- බුද්ධික මඩිහහේවා මහතා (2022.05.19 දින දක්වා සේවය කරන ලදි.) - සාමාජික
- අසීම් භාර්ගවා මහතා - සාමාජික

රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව වගකීම්, අධිකාරීන් සහ නිශ්චිත රාජකාරි විෂය පථය ආවරණය කරමින් කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කර ඇත.

### විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන්

ක්‍රියාවලීන්ගේ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා වාර්ෂික මූල්‍ය වාර්තාකරණයේ හෙළිදරව් කිරීම් සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් බව, සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයන්හි අනුකූලතාව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට සමපාත වන බවත් කමිටුව සමාලෝචනය කරයි. එමෙන්ම සමාගමේ මූල්‍ය වාර්තාකරණයට අනුකූල වීමේ අවශ්‍යතාව, සමාගම් පනතට අදළ තොරතුරු අවශ්‍යතා සහ අනෙකුත් අදාල මූල්‍ය වාර්තාකරණයට අදාල රෙගුලාසි සහ අවශ්‍යතා කමිටුව සමාලෝචනය කරයි. තවද කමිටුව අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව ද, ස්වාධීනත්වය සහ බාහිර විගණකවරුන්ගේ කාර්ය සාධනය ද තක්සේරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම ද කමිටුව සමාලෝචනය කරයි. එසේම සමාගම  අවදානමකට නිරාවරණය වි ඇත්නම් ඒවා කළමනාකරණය කිරීම සහ එවැනි අවදානම් වලින් පැන නගින බලපෑම අවම කිරීම සඳහා සමාගම විසින් ගත යුතු ක්‍රියාකරකම් ද යෝජනා කරයි.

### අභ්‍යන්තර විගණනය

වත්කම් සුරක්ෂිත බවට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මෙන් ම පද්ධතිය මත විශ්වාසය තැබිය හැකි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂවරුන් ට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ගිණුම්කරණ ක්‍රම සහ මූල්‍ය පාලනයේ සඵලතාවය තක්සේරු කිරීමට අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ විෂය පථය සහ ආවරණය කමිටුව සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන කාර්යය සමාගම තුළ ස්ථාපිත කර ඇත . ක්‍රියාත්මක වෙමින් පවතින එම  විගණන නිර්දේශ තහවුරු කර ගැනීමට වරින් වර පසු විපරම් සමාලෝචන සැළසුම් කර ඇත. අවදානම් පාදක අභ්‍යන්තර විගණනය යනු 2018 දී අභ්‍යන්තර විගණනයේ විෂය පථය පුළුල් කිරීම සඳහා අලුතින් හඳුන්වා දුන් ප්‍රවේශයකි. අවදානම් ශ්‍රේණිගත කිරීම තුලින් එවැනි ගැටළු කෙරෙහි  ක්ෂණික පිළියම් ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය තුළ වැඩි අවධානයක් යොමු කරවයි. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මඟින් අභ්‍යන්තර විගණන විෂය පථය පාලනය කෙරෙයි.

### ව්‍යවස්ථාපිත විගණනය

කමිටුව, 2018 ජාතික විගණන පනතට අනුකූලව විගණනයේ ස්වභාවය, ප්‍රවේශය සහ විෂය පථය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ විගණකවරුන් සමඟ ද සාකච්ඡා කරයි. මතුවන ලද ගැටළුවලට සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සඵලතාවයට කළමනාකාරීත්වය ගනු ලබන පියවර ද සාකච්ඡා කෙරෙයි.

## රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ ඔවුන් වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හයක් (06) පවත්වා ඇත.

වසර තුළ විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් පහතින් සටහන් වේ.

| අනු අංකය | දිනය | කමිටුවේ ශක්තිය | සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව | සාමාජිකයින්ගේ/ නිරීක්ෂකයින්ගේ නම් |
|---|---|---|---|---|
| 01. | 21.01.2022 | 03 | 03 | ඊ.ඒ. රත්නසීල මහතා<br>බුද්ධික මඩිහහේවා මහතා<br>අසීම් භාර්ගවා මහතා<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක) |
| 02. | 22.02.2022 | 03 | 03 | ඊ.ඒ. රත්නසීල මහතා<br>බුද්ධික මඩිහහේවා මහතා<br>අසීම් භාර්ගවා මහතා<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක) |
| 03. | 19.05.2022 | 03 | 03 | ඊ.ඒ. රත්නසීල මහතා<br>බුද්ධික මඩිහහේවා මහතා<br>අසීම් භාර්ගවා මහතා<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක) |
| 04. | 25.08.2022 | 03 | 02 | ඊ.ඒ. රත්නසීල මහතා<br>අසීම් භාර්ගවා මහතා<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක) |
| 05. | 12.10.2022 | 03 | 02 | ඊ.ඒ. රත්නසීල මහතා<br>අසීම් භාර්ගවා මහතා<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක) |
| 06. | 28.12.2022 | 03 | 02 | ඊ.ඒ. රත්නසීල මහතා<br>අසීම් භාර්ගවා මහතා<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක) |

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාවට නැගිය හැකි උපායමාර්ගික කරුණු හා සබැඳි තීරණ ගණනාවක් සහ නිර්දේශ කිහිපයක් විගණන හා කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කර ඇත.

- කළමනාකාරීත්වය සමඟ, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් සමඟ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම
- මූල්‍ය ප්‍රකාශනයන්හි විනිවිදභාවය, අවබෝධය සහ විශ්වාසනීයත්වය සහතික කිරීම මගින් මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම
- සිදු කරන ලද සහ සවිස්තරාත්මක විශ්ලේෂණය සහ අධ්‍යනයන්වලින් අලාභය සඳහා හේතු සහ බලපෑම් හඳුනා ගැනීම සහ වහාම අදාළ අංශයන්හි අලාභ මඟහැරවීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීම හෝ නිර්දේශ කිරීම
- වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන, සැලකිය යුතු විගණන සොයාගැනීම් සහ ක්‍රියාකාරී සැළැස්ම සමාලෝචනය කිරීම
- විස්තීරණ සහ අඛණ්ඩ ලෙස අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහතික කිරීමෙන් පිළිගත හැකි මට්ටමට අවදානම අවම කිරීම
- ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහිත පුළුල් කැපවීමක් ඇති සංවිධානයක් ඉහළ ස්ථරයෙහි නිර්මාණය කිරීම
- නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, ආචාර ධර්ම, විෂමාචාර හෝ වංචා විමර්ශනය සම්බන්ධ ආයතනික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම
- පවත්නා තත්ත්වය, ප්‍රගතිය සහ නව ප්‍රවණතා මෙන් ම ගැටළු සහිත කරුණු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ අඛණ්ඩව සන්නිවේදනය කිරීම

**ආයතනික කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුවේ නිර්දේශ**

- ඉන්ධන නාස්තිය සහ අනෙකුත් අක්‍රමිකතා මැඩලීමේ අරමුණින් CPSTL බවුසර් ඇණියට GPS ලුහුබැඳීමේ පද්ධතිය හඳුන්වාදීම - පිරිවැය ඉතිරි කිරීම දළ වශයෙන් රු. මිලියන 225 වසරකට.
- වංචා අවදානම අවම කිරීම සඳහා නව වැටුප් පද්ධතියක් හඳුන්වාදීම.
- පාලන ක්‍රියාවලියේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා අවදානම් කමිටුව සහ අවදානම් නිලධාරියාගේ භූමිකාව හඳුන්වා දීමට කමිටුව නිර්දේශ කිරීම.
- ශේෂ පත්‍රයේ මූල්‍ය සංඛ්‍යාවල සාධාරණ වටිනාකම පිළිබිඹු කිරීම සඳහා සමාගමේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට නිර්දේශ කිරීම.

**නිගමනය**

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) අනුව ය. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. සමාගම එහි ප්‍රතිපත්තිවලට අනුකූලව කළමනාකරණය කර ඇති බවටත්, සමාගමේ වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර ඇති බවටත්, සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අභ්‍යන්තර පාලනයන් සාධාරණ ලෙස තහවුරු කරන බවටත් විගණන කමිටුව සෑහීමකට පත්වේ.



**ඊ ඒ රත්නසීල**
**සභාපති**
විගණන හා කළමනාකරණ කමිටුව

# මූල්‍ය ප්‍රකාශන



# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඊඑන්ආර්/සී/සීපීඑස්ටීඑල්/1/22/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2023 අගෝස්තු 16 |

සභාපති
ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශය සහ අනෙකුත් නෛතික සහ නියාමන නිර්දේශ හා බැඳි විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශය

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.2 කරුණු අවධාරණය කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 791 ක ආදායම් බදු සහ උපයන විට ගෙවන බදු දිගුකාලීන හිඟ ශේෂයන් සම්බන්ධයෙන් සමාගම වෙත ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවන්ට අදාලව අවිනිශ්චිතතාවය විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශනවල 20.1 (ආ) සටහන වෙත මාගේ අවධානය යොමු කරමි. මෙම කරුණු සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාගම විසින් LKAS 12 (ආදායම් බදු) හි 34 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 915.3 ක භාවිතයට නොගත් බදු අලාභයට අදාළව රු. මිලියන 274.7 ක විලම්භිත බදු වත්කම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු. මිලියන 8,000.3 කි. කෙසේ වෙතත් CPC විසින් තහවුරු කරන ලද ශේෂය රු. මිලියන 7,458 කි. ඒ අනුව එම ශේෂ දෙක අතර රු. මිලියන 542.3 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එහි රු. මිලියන 110.2 ක දිගුකාලීන හිඟ ලැබිය යුතු ශේෂයක් නිරීක්ෂණය විය.

(ඇ) සමාගමේ 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු මුදල රු. මිලියන 836.2 කි. කෙසේ වෙතත්, CPC හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව CPSTL වෙතින් ලැබිය යුතු මුදල රු. මිලියන 1,247 කි. ඒ අනුව එම ශේෂ දෙක අතර රු. මිලියන 410.8 ක සැසඳිය නොහැකි වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) LKAS 01 හි 32 ඡේදයට අනුව, ආයතනයක් වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල රු. මිලියන 3 ක බැර ශේෂයන් 03ක් අනෙකුත් ලැබිය යුතු මුදල් වලට එරෙහිව හිලව් කර තිබූ අතර අනෙකුත් ගෙවිය යුතු ගිණුම්වල රු. මිලියන 111.3 ක හර ශේෂයන් 50 ක් අනෙකුත් ගෙවිය යුතු දෑ වලට එරෙහිව හිලව් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී වෙනත් ලැබිය යුතු ශේෂයන් (සම්බන්ධිත පාර්ශව හැර) රු. මිලියන 97.3 ක් වූ අතර, එයින් වෙනත් ලැබිය යුතු ගිණුම් 12 කට අදාළ රු. මිලියන 7.6 ක මුදලක් වසර 05 කට වැඩි කාලයක් තිස්සේ ආපසු අයකරගෙන නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව

(ඊ) රු. මිලියන 8,391.6 ක වටිනාකමකින් සමන්විත සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් අයිතම 24,175 ක් එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සමාගම විසින් භාවිතා කරනු ලබන අතර ඒවා LKAS 16 හි 51 ඡේදයට පටහැනිව ගිණුම්ගත කර ඇත. තවද, සමාගම විසින් 2003 වර්ෂයේ සමාගම ආරම්භයේ සිට එහි වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබූ අතර ඒ සඳහා නිසි ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.

(උ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කර භාවිතයට සුදුසු තත්ත්වයට පත් කර තිබූ, රු. මිලියන 36.8 ක වටිනාකමින් යුත් දේපළ පිරියත සහ උපකරණ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ (WIP) ලෙස පෙන්වා තිබූ අතර LKAS 16 හි 55 ඡේදය අනුව එම වත්කම්වල ක්ෂය කිරීම් ආරම්භ කර නොතිබුණි.

(ඌ) පෙර වර්ෂයට අදාළ රුපියල් මිලියන 4.1 ක් වූ ඉන්ධන ටැංකි ඉවත් කිරීමේ ලාභය සමාලෝචිත වර්ෂය සඳහා වැරදි ලෙස හඳුනාගෙන ඇති අතර, වැරදි ජර්නල් සටහන් නිසා පෙර වර්ෂයේ සංසන්දනාත්මක ශේෂයන් හි මෙහෙයුම් වියදම් සහ විවිධ ණය හිමියන් අධිතක්සේරු වී ඇත. තවද, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන් එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී ඇත.

(එ) සමාගම විසින් රු. මිලියන 12.8 ක් වූ 2021 වර්ෂය සඳහා වාර්තා නොකළ ඉන්ධන පරිභෝජනය 2021 සංසන්දනාත්මක තොරතුරු සඳහා නැවත සටහන් කර ඇත. කෙසේ වෙතත්, සමාගම සෘජු වියදම් නැවත සටහන් කිරීම වෙනුවට වෙනත් මෙහෙයුම් වියදම් වැරදි ලෙස නැවත සටහන් කර ඇත. ඒ අනුව 2021 වර්ෂය සඳහා දළ ලාභය එම වටිනාකමින් අධිතක්සේරු වී තිබුණි.

(ඒ) LKAS 01 හි 32 ඡේදයට අනුව, ප්‍රමිතියකින් අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් මිස ආයතනයක් ආදායම් සහ වියදම් පියවීම සිදු නොකළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සේවක ණය හානිකරණ ලාභය රු. මිලියන 9.5ක් සමාලෝචිත වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායමක් ලෙස ඉදිරිපත් කිරීම වෙනුවට පරිපාලන වියදම් වලින් අඩුකර පෙන්වා ඇත.

මෙම විගණනය මා සිදු කළේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලවය. එය යටතේ වන මාගේ වගකීම් සහ අදාල ප්‍රමිතින් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් අංශයේ තවදුරටත් මා විස්තර කර ඇත්තෙමි. තවද මාගේ 'තත්ත්වාගණනය කළ මතය' සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මම තරයේ විශ්වාස කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.4 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් කර ඇති අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට 2022 වාර්ෂික වාර්තාවේ අන්තර්ගත තොරතුරු ඇතුළත් වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මගේ විගණක වාර්තාව එහි ඇතුළත් නොවේ. එය මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව මට ලැබෙන්නට සලස්වනු ඇත යැයි අපේක්ෂිතය. අනෙකුත් තොරතුරු සැපයීම කළමනාකරණයේ වගකීමකි. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ඉදිරිපත් නොකරමි.

මූල්‍ය ප්‍රකාශනයට අදාලව විගණනය සම්බන්ධයෙන් මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු මට ලැබෙන්නට සැලැස්වූ විට ඒවා කියවා බැලීම හා එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රමාණාත්මක ලෙසින් නොගැලපෙනවාද යන්න හෝ විගණනයේදී ලබාගත් මාගේ දැනුම හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මක වැරදි ලෙස ප්‍රකාශ කර ඇති බවක් පෙනෙන්නට තිබේද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා පත් කර ඇති පාර්ශවයන් හට ඒ බව මා දැනුම් දිය යුතුය. එයින් පසුවද නිවැරුදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශ තිබේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුට මා ඉදිරිපත් කරනු ඇති මාගේ වාර්තාවට ඒවා ඇතුලත් වනු ඇත.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීමට හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

# විගණකාධිපති වාර්තාව

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරණු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙහි විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවසථානෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්ථාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද ,අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පදනම් වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

වෙනත් කරුණුද සමග, මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලන දුර්වලතා ඇතුලත්ව, විගණනයේදී සොයා ගනු ලබන සුවිශේෂී කරුණු පාලනයට සම්බන්ධ පාර්ශව වෙත සන්නිවේදනය කරන ලදී.

## 2. අනෙකුත් නෛතික හා නියාමන නිර්දේශ මත වන වාර්තාව

2.1 පහත අවශ්‍යතා සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනත, සහ 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1. මගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසෙහි විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබා ගත්තෙමි. මගේ නිරීක්ෂණයට පෙනෙන ආකාරයට, වර්ෂ 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ නිර්දේශවලට අනුව සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

# විගණකාධිපති වාර්තාව

2.1.2 වර්ෂ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (d) (iii) වගන්තියේ නිර්දේශවලට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පෙර වසරට අනුරූප වේ.

2.1.3 වර්ෂ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (d) (iv) වගන්තියේ නිර්දේශවලට අනුව 1.3. (b), 1.3 (c), සහ 1.3 (f) වගන්තිවල සඳහන් කරුණු හැර මා විසින් පෙර වර්ෂයේ කරන ලද සියලුම නිර්දේශ ඇතුලත් වේ.

2.2 ලබා ගත් ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වු සාක්ෂි සහ අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව.

2.2.1. වර්ෂ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (d) වගන්තියේ නිර්දේශවලට අනුව ව්‍යාපාරයේ සාමාන්‍ය හේතුවෙන් බැහැර වන සමාගම විසින් ඇති කර ගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාගමේ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර බැඳියාවක් ඇත යැයි සඳහන් කළ හැකි කිසිවක් මගේ අවධානයට ලක් වුයේ නැත.

2.2.2. පහත සඳහන් කරුණු හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (l) වගන්තියේ නිර්දේශවලට අනුව සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද ආදේශ වන ලිඛිත නීතිවලට අදාලව සාමාන්‍ය සහ විශේෂ උපදෙස් කිසිවක් සමාගම විසින් අනුගමනය කර නොමැත යැයි නිගමනය කළ හැකි කිසිවක් මගේ අවධානයට ලක් වුයේ නැත.

| **නීතිය / නිර්දේශය සඳහා වන යොමුව** | **විස්තර කිරීම** |
| --- | --- |
| රජය සතු ව්‍යවසායන් සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය. | |
| (i) මාර්ගෝපදේශය 2.3 | ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම සමාගම විසින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට (මව් සමාගමට) ඉදිරිපත් කර නොතිබුණි. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2.3. පහත කරුණු හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (g) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගම එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නැත:

(අ) පෙර වර්ෂවල විගණන වාර්තාවල නැවත අවධාරණය කළ පරිදි, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර සාමාන්‍ය පොදු පරිශීලක පහසුකම් සඳහා කොටස් හිමිකරු ගිවිසුම හා කොටස් විකිණුම් මිලදී ගැනීමේ ගිවිසුම 2008 දෙසැම්බර් 31 දින අවසන්ව ඇත. මේ සම්බන්ධව දිගුවක් ලබාගැනීම හෝ අදාල සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන්, නිසි ඇගයීමකින් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නව ගිවිසුමකට ඇතුළත් වී නොමැත. එබැවින් 2011 වර්ෂයේ සිට නිමා ගාස්තු හා ස්ලැබ් (slab) ගාස්තු ද ඇතුළුව ප්‍රවාහන ගාස්තු අයකර ගැනීම තීරණය කිරීම සඳහා අදාල සියලු පාර්ශවයන්ගේ එකඟතාවයෙන් යුතුව භාවිතා කළ මිල සූත්‍රය සංශෝධනය කර නොමැත.

(ආ) සමාගම ලිඛිත ක්‍රියා පටිපාටි සංග්‍රහයක් සම්පාදනය කර නොමැති බව නිරීක්ෂණය විය. මෙය අභ්‍යන්තර දුර්වලතා හඳුනාගෙන ඒවා වළක්වා ගැනීමට ඇති පාලන පද්ධති මෙන්ම සමාගමේ මෙහෙයුම්වල ඇති විය හැකි දෝෂ සහ අක්‍රමිකතා අවදානයට ගෙනෙන්නකි. එසේම සමාගමේ එක් එක් ක්‍රියාවලිය සඳහා පූර්ව පාලන වාර්තා තබා ගැනීමට මෙන්ම කළමනාකරණය විසින් නියම කරන ලද/සැළසුම් කරන ලද ක්‍රියාවලිය ව්‍යතිරේක කිසිවක් නොමැති ක්‍රියාත්මක වන බව සහතික කිරීමට බෙහෙවින්ම උපකාරී වෙයි. තවද, ක්‍රියාපටිපාටි සංග්‍රහයක් නිර්මාණය කළ පසු එහි අදාලත්වය සහතික කිරීම සඳහා එය නිශ්චිත කාල පරාසයකට වරක් ඇගයීමට ලක් කළ යුතුය.

(ඇ) සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වන්නේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ LIOC සතු ඉන්ධන තොග ප්‍රධාන පර්යන්ත දෙකක සහ තොග ගබඩා 11ක ගබඩා කර තබා එම සමාගම් දෙකෙහි උපදෙස් අනුව දිවයින පුරා සිටින බලයලත් අළෙවි නියෝජිතයන් සහ පාරිභෝගිකයන්ට ඒවා බෙදාහැරීමයි.

ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන අලෙවි නියෝජිතයින්ගෙන් සහ පාරිභෝගිකයින්ගෙන් ඉන්ධන ඇණවුම් භාර ගැනීම, ණය සීමාවන් සත්‍යාපනය සහ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම, ඉන්වොයිසි නිකුත් කිරීම, අලෙවි නියෝජිතයින්ගෙන් මුදල් එකතු කිරීම අලෙවිකරණ ආයතන (විශේෂයෙන් CPC) විසින් හැසිරවිය යුතු වුවත් එම ක්‍රියාකාරකම් සමාගම විසින් සිදුකර තිබුණි. එබැවින්, සමාගම ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ ප්‍රධාන විෂය පථයට පරිබාහිර කාර්යයන්හි නිරතව සිටින බව නිරීක්ෂණය විය. තවද,

# විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා රජය (GOSL), CPC සහ LIOC අතර ඇතිකරගත් 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුමෙන්ද එවැනි ක්‍රියාකරකම් ආවරණය නොවීය.

2.2.4. පහත සඳහන් කරුණු හැර, අදාල කාලරාමු තුල 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 12 (ය) වගන්තියේ නිර්දේශවලට අනුව වන නීතිවලට අනුකූලව හෝ ආර්ථික නැණවත් බවක් සහිතව හෝ ඵලදායිතාවයෙන් යුතුව හෝ කාර්යක්‍ෂමව සිය ප්‍රසම්පාදන කටයුතු කිරීම උදෙසා සිය සම්පත් යොදා ගන්නටද සමාගම කටයුතු නොකළ බව නිරීක්‍ෂණය විය.

(අ) සමාගම විසින් 2018 වර්ෂයේදී කොළොන්නාව තෙල් පර්යන්තයේ කලාප අංක 06 හි නව පොම්පාගාරයක් ඉදිකිරීම ආරම්භ කර ඇත. තනි ඉදිකිරීම් පැකේජයක් ලෙස පොම්පාගාරයක් ඉදි කිරීම වෙනුවට, සමාගම මුලින් මෙම කාර්යය වෙනම ඉදිකිරීම් 05 කට වෙන් කර ඇති අතර පොම්පාගාර ගොඩනැගිල්ල, නල ආධාරක ඉදිකිරීම, විදුලි සවිකිරීම්, අංගන සංවර්ධනය සහ සිම්ප්ලෙක්ස් බාස්කට් පෙරනයක් සෑදීම යන මෙම ඉදිකිරීම් 05 වෙනම කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට ලබා දී ඇත. 2019 සහ 2020 වසර තුළ පොම්පාගාර ගොඩනැගිල්ල, විදුලි සවි කිරීම් සහ අංගන සංවර්ධනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. කෙසේ වෙතත්, නල ආධාරක ඉදිකිරීම අවසන් වී නොමැති බව ක්ෂේත්‍ර චාරිකාවේදී නිරීක්ෂණය වූ අතර පොම්පාගාරය සම්බන්ධ කරන නල මාර්ගය, පිරවුම් ගැන්ට්‍රි සහ ටැංකි අංගනය ඉදිකිරීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු 2023 මැයි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පොම්පාගාරය අපේක්ෂිත භාවිතය සඳහා සුදුසු තත්ත්වයේ නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කරන ලද රු. මිලියන 115.2 ක මුදල නිෂ්ක්‍රීය වත්කමක් බවට පත් වී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් පැකේජ ක්‍රියාත්මක කිරීම අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය.

(ආ) සමාගම විසින් කොළොන්නාව පර්යන්තයේ ඝන මීටර් 15,000 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකියක් සහ ඝන මීටර් 7,000 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි 02 ක් මිලදී ගැනීම, ඉදිකිරීම සහ ආරම්භ කිරීම සඳහා ටෙන්ඩරයක් දේශීය සමාගමකට ලබා දී ඇත. තෝරාගත් ලංසුකරුට සිමෙන්ති, වැලි, කම්කරුවන් ආදී බොහෝ අමුද්‍රව්‍ය (මූලික අමුද්‍රව්‍ය හැර) දේශීයව මිලදී ගැනීමටත්, කාර්මික කාර්ය මණ්ඩලය දේශීයව බඳවා ගැනීමටත් හැකියාව තිබුණද, ලංසුකරු විදේශ මුදලින් (ඇ.ඩො.) මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සවිස්තරාත්මක ලංසු ඇගැයීමේදී ඉහත කරුණු සලකා බලා තිබේද යන්න තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් විදේශ මුදලින් (ඇ.ඩො.) අතුරු බිල්පත් ඉදිරිපත් කර

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඇති අතර සමාගම අතුරු බිල්පත් ගෙවීමේ දිනයේ පැවති විනිමය අනුපාතිකයට අනුව රුපියල් වලින් අතුරු බිල්පත් පියවා ඇත. ඒ අනුව, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම නිසා සමාගමට අමතර පිරිවැයක් දැරීමට සිදු විය. විදේශ විනිමය අලාභය අවම කර ගැනීම සඳහා ලංසු තැබීමේ ලියකියවිලි සකස් නොකිරීම, තාක්ෂණික සහ මූල්‍ය ඉදිරිදර්ශනය යන දෙකෙන්ම ලංසුව නිසි පරිදි ඇගයීමට ලක් නොවීම සහ දුර්වල කොන්ත්‍රාත්තු පරිපාලනය හේතුවෙන් ප්‍රධාන වශයෙන් මෙම අතිරේක ගෙවීම දැරීමට සමාගමට සිදු විය. එසේම, විදේශ මුදලින් ලංසුව උපුටා දැක්වීමට එක් හේතුවක් වූයේ කොන්ත්‍රාත්තුව මිල විචලනයට යටත් නොවීම බව කොන්ත්‍රාත්කරු ප්‍රකාශ කර තිබුණි.

### 2.3 වෙනත් කරුණු

(අ) 2007 ජනවාරි 05 වන දින ශ්‍රී ලංකා රජය හා ලංකා ඉන්දියන් ඔයිල් සමාගම අතර ගිවිසගත් බේරුම්කරණ ගිවිසුමේ 03 වන වගන්තියට අනුව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සඳහා චීන වරාය පර්යන්තයේ සිට ඉන්ධන බෙදාහැරීම රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 5% උපරිමයකට සීමාකර ඇති අතර, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ද සපුගස්කන්ද පිරිපහදුවේ සිට ඉන්ධන බෙදාහැරීම 5%ක උපරිමයකට සීමාකර ඇත. කෙසේ වුවද, ඉහත කොන්දේසිවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රමවත් ක්‍රියාවලියක් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමට නිමා ගාස්තු ආදායම අහිමි වීමේ හැකියාවක් ඇත.

(ආ) 2019 මැයි 21 වන දින ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර ඇති කර ගත් ගිවිසුමට අනුව, ඛනිජතෙල් නීතිගත සංස්ථාවට විඳීමට සිදු වන ප්‍රමාද ගාස්තු සහ කාන්දුවීම් අලාභ CPSTL වෙතින් අය කිරීමට ගිවිසුමේ ප්‍රතිපාදන ඇතුළත් නොවේ. කෙසේ වෙතත්, රු. මිලියන 486.3 ක ප්‍රමාද ගාස්තු සහ රු. මිලියන 115.3 ක කාන්දුවීම් අලාභ CPC විසින් අන්‍යෝන්‍ය එකඟතාවයකින් තොරව CPSTL වෙතින් 2022 වර්ෂයේදී අය කර තිබුණි.

(ඇ) තොග ගබඩා ඉඩම් 09ක අයිතිය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර සමාගම මෙම ඉඩම් බදු පදනම යටතේ භාවිතා කරයි. මෙම ඉඩම් පරිහරණය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමග ඇති බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ අතර සමාගම කල්බදු ගිවිසුම අවසන් වූ පසුවත් නව ගිවිසුමකට එළඹීම හෝ පැවති ගිවිසුම අලුත් කිරීමකින් තොරව අඛණ්ඩව මෙම ඉඩම් භාවිත කරයි. කෙසේ වෙතත්, සමාගම මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව

(ඈ) සමාගම සතු සහ කුලියට ගත් බවුසර් භාවිතා කිරීම

ඛනිජතෙල් නිෂ්පාදන එහි තොග ගබඩාවලට සහ CPC සහ LIOC හි ලියාපදිංචි අලෙවිකරුවන්ට සහ පාරිභෝගිකයින්ට බෙදා හැරීම සමාගමේ ප්‍රධාන ව්‍යාපාරයයි. මේ සඳහා 2022 දෙසැම්බර් මස අවසන් වන විට සමාගම් සතු බවුසර් 130 ක සංචිතයක් හා කුලියට ගත් බවුසර් 581 ක සංචිතයක් ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(i) 2022 දෙසැම්බර් මාසය සඳහා SAP (ERP පද්ධතියේ) වාහන කාර්ය සාධන වාර්තාවට අනුව, සමාගම සතු බවුසර් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රශස්ත ලෙස භාවිත කර නොතිබුණි. මාසයට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව සමාගම සතු බවුසර් 130 න් බවුසර් 68 ක් මාසය තුළ එක ගමනක් හෝ භාවිත කර / බෙදාහැර නොතිබූ අතර භාවිත කළ බවුසර්වලින් බවුසර් 18 ක් මාසය තුළ එක් දිනක් පමණක් භාවිත කර ඇති බව නිරීක්ෂණය විය.

(ii) සමාගම සතු බවුසර් ප්‍රශස්ථ ලෙස භාවිතා කර නොතිබුණද, එම බවුසර් ඇණිය නඩත්තු කිරීම සඳහා ස්ථාවර පොදු කාර්ය පිරිවැය සහ එහි රියදුරන් සහ රිය සහයකවරුන් සඳහා වන වැටුප්, වේතන හා අනෙකුත් දීමනාද, වාහන බලපත්‍ර ගාස්තු ආදි වියදම් සමාගම විසින් පූර්ණ ලෙසින් දරණ ලදී. ඒ අනුව සමාගමට හිමි බවුසර් අඩුවෙන් උපයෝගි කර ගැනීම හේතුවෙන් සමාගම විසින් දරණ ලද ස්ථාවර පිරිවැය පවා අයකර ගැනීමට සමාගමට නොහැකි විය.

(iii) මීට අමතරව, සමාගම බාහිර ප්‍රවාහන කරුවන් (බවුසර්) තෝරාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශද අනුගමනය කර නොතිබුණි. ඒ අනුව, කුලියට ගත් බවුසර් සඳහා භාවිතා කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය අතිශය ගැටළු සහගත විය.

(iv) 2022 දෙසැම්බර් මාසය සඳහා කුලි බවුසර් කාර්ය සාධන වාර්තාවට අනුව, අදාල මාසය තුළදී බවුසර් 182 ක් එනම් ලියාපදිංචි බවුසර්වලින් 31% ක් කිසිදු ඉන්ධන බෙදා හැරීමේ ගමන් වාරයකට යොදා නොතිබුණු අතර බවුසර් 138 ක් එනම් ලියාපදිංචි බවුසර්වලින් 24% කට දින 11 කට අඩු කාලයකට ගමන් වාර පවරා ඇත. කෙසේ වෙතත්, බවුසර් 55 ක් එනම් ලියාපදිංචි බවුසර්වලින් 9.5% ක් එම මාසය තුළ 20 කට වැඩි දින ගණනක් ගමන් වාර සඳහා යොදා ඇති අතර, එම මාසය තුළ 24 කට වැඩි දින ගණනක් සේවයේ යෙදු

තෝරාගත් බවුසර් 6 ක්ද ඇතුළත් විය. මේ සියල්ල අනුව පුද්ගලික බවුසර් සඳහා ඉන්ධන බෙදා හරින ගමන් වාර ලබා දෙන රටාව හෝ පදනම පැහැදිලිව හඳුනා ගැනීම විගණන කෝණයෙන් ව්‍යාකූල විය.

(ඉ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී, වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂය රු. මිලියන 2,041.2 ක් වූ අතර, එයින් ගෙවිය යුතු ගිණුම් 182 කට අදාළ රු. මිලියන 24 ක් වසර 05 කට වැඩි කාලයක් තිස්සේ නොවිසඳී තිබුණි.

**(ඊ) කාර්ය මණ්ඩල ණය**

මෝටර් වාහන ණය, නිවාස ණය, ආපදා ණය, සකසුරුවම් සමිති ණය, විශේෂ ණය, බාධක ණය, අත්තිකාරම් ආදි ලෙසින් සමාගම සිය සේවා නියුක්තිකයන්ට විවධ ණය යෝජනා ක්‍රම ගණනාවක්ම හඳුන්වා දී ඒවා පවත්වා ගෙන ගොස් ඇත. 2022 දෙසැම්බර් 31 අවසන් වන විට අය විය යුතු මුළු හිඟ ණය ශේෂය රු. මිලියන 3,148 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(i) ලබා දී ඇති තොරතුරුවලට අනුව කාර්ය මණ්ඩලයට ණය පහසුකම් සැපයීම සඳහා නිසි ප්‍රතිපත්තියක් සහ ආපසු අයකර ගැනීමේ ක්‍රියා පටිපාටියක් සමාගමේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කර පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයේ දී පැහැර හරින ලද ණය ශේෂය රු. මිලියන 32 කි.

(ii) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල (AMC) වාර්තාවන්ට අනුව, සේවකයින්ට හානියක් නොවන පරිදි ඉහත ගැටළු මඟහරවා ගැනීම සඳහා ණය යෝජනා ක්‍රමය බාහිර වාණිජ බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට ලබා දීමේ වැදගත්කම සාකච්ඡා කරන ලදී. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් AMC විසින් ලබා දී ඇති නිර්දේශය පිළිබඳව සමාගම ඔවුන්ගේ කඩිනම් අවධානය යොමු කර තිබේද යන්න සහතික කර ගැනීමට විගණනයට නොහැකි විය.

**(උ) වාහන කළමනාකරණය**

(i) එක් එක් වාහනය සඳහා වාහන ධාවන පත්‍රයක් භාවිතා කිරීම වෙනුවට සමාගම විසින් දෛනික වාහන ගමන් වාර පත්‍රයක් පමණක් භාවිතා කර ඇත. මේ නිසා ලිපිගොනුවට අමුණන ගමන් වාර සටහන් වංචනික ලෙස වෙනස් කිරීමේ හැකියාව පවතින බව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නිරීක්ෂණය විය. තවද, ඉන්ධන පරිභෝජනය පිළිබඳ විස්තර, ඉන්ධන ඇතුළු කිරීම, ඉන්ධන තුලනය සහ වාහනයේ ධාවන තත්ත්වය පිළිබඳ රියදුරුගේ අදහස් එම සටහන්වලට ඇතුළත් කර නොතිබුණි. එසේම, රියදුරන්ගේ රාජකාරි වේලා සහ එයට පරිබාහිර වේලාවන් බලයලත් නිලධාරියෙකු විසින් නිරීක්ෂණය කර නොතිබුණි.

(ii) සමාගමේ ඔටෝමොබයිල් කාර්යාංශය මඟින් වාහනවල ඉන්ධන පරිභෝජනය නිරන්තරයෙන් පරීක්ෂා කර අධීක්ෂණය කර නොතිබූ අතර, වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව වාර්තා කිරීම සඳහා වාහන සටහන් පොතක්ද නොතිබුණි. ඒ අනුව, වාහන පරිපාලනයට අදාල අභ්‍යන්තර පාලනය සහ වාහන නඩත්තුව හා ඉන්ධන පරිභෝජනය පිළිබඳ අධීක්ෂණයද සතුටුදායක මට්ටමක නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයන් 15 දෙනෙකු බඳවා ගෙන ඇත.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**

**විගණකාධිපති**

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට

| වත්කම් | සටහන් | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 10 | 16,582,140,151 | 16,516,996,810 |
| වත්කම් භාවිතයේ අයිතිය | 10.6 | - | 2,408,512 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 36,898,958 | 66,674,599 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.1 | 1,434,856,012 | 1,560,844,565 |
| | | 18,053,895,122 | 18,146,924,485 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 12 | 862,523,461 | 682,055,187 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 13 | 10,596,319,671 | 11,089,317,954 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.2 | 1,681,713,979 | 1,757,378,627 |
| ලැබිය යුතු ආදායම් බදු | | 280,560,047 | 66,195,469 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 2,006,109,225 | 2,256,929,658 |
| | | 15,427,226,383 | 15,851,876,895 |
| **මුළු වත්කම්** | | 33,481,121,505 | 33,998,801,381 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 7,500,000,000 | 7,500,000,000 |
| ප්‍රාග්ධන සංචිතය | 16.1 | 979,000,000 | 979,000,000 |
| රඳවාගත් ඉපැයීම් | | 18,749,877,607 | 19,520,691,240 |
| **මුළු හිමිකම්** | | 27,228,877,607 | 27,999,691,240 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් | 17 | 1,283,872,850 | 1,609,324,160 |
| විලම්භිත බදු වගකීම් | 8.1 | 2,090,996,061 | 1,609,811,239 |
| භාවිතයේ අයිතිය කල් බදු වගකීම | | - | - |
| | | 3,374,868,911 | 3,219,135,398 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 18 | 2,877,374,987 | 2,066,274,173 |
| භාවිතයේ අයිතිය කල් බදු වගකීම | | - | 2,665,004 |
| ගෙවිය යුතු ආදායම් බදු | | - | 711,035,566 |
| **මුළු වගකීම්** | | 2,877,374,987 | 2,779,974,743 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 33,481,121,505 | 33,998,801,381 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූල වන බව මම සහතික කරමි.

**මූල්‍ය අංශයේ ප්‍රධානී**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

**අධ්‍යක්ෂ** **සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ**

පිටු 08 සිට 36 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

2023 පෙබරවාරි 28
කොළඹ

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | සටහන් | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| ආදායම | 3 | 9,433,316,086 | 14,276,189,292 |
| සෑජු වියදම් | | (6,806,068,685) | (8,369,310,193) |
| **දළ ලාභය** | | 2,627,247,401 | 5,906,879,099 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 4 | 1,308,502,495 | 705,511,809 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 4.1 | - | (174,338,317) |
| පරිපාලන වියදම් | | (4,925,116,033) | (5,061,376,456) |
| **මෙහෙයුම් ලාභය** | | (989,366,137) | 1,376,676,135 |
| මූල්‍ය ආදායම | 5 | 285,281,394 | 201,571,237 |
| **බදු පෙර ලාභය** | 6 | (704,084,743) | 1,578,247,372 |
| ආදායම් බදු වියදම් | 7.1 | (354,612,056) | (409,035,758) |
| **වසර සඳහා ලාභය** | | (1,058,696,799) | 1,169,211,614 |
| **පසුකාලීන කාල පරිච්ඡේදවල ලාභ අලාභවලට නැවත** | | | |
| **වර්ගීකරණය නොකළ යුතු අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය/අලාභය | 17 | 411,261,666 | 428,606,379 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් මත බදු | 8.1 | (123,378,500) | (102,865,531) |
| වර්ෂය සඳහා බදු අඩු කළ වෙනත් විස්තීර්ණ ආදායම | | 287,883,166 | 325,740,848 |
| **වර්ෂය සඳහා සම්පූර්ණ බදු අඩු කළ විස්තීර්ණ ආදායම** | | (770,813,633) | 1,494,952,462 |
| **කොටසකට ඉපැයීම්** | 9.2 | (1.41) | 1.56 |

පිටු 08 සිට 36 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | ප්‍රාග්ධන සංචිත රු. | රඳවා ගත් ඉපැයීම් රු. නැවත ප්‍රකාශිත | එකතුව රු. |
|---|---|---|---|---|
| **2021 ජනවාරි 01 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 18,739,200,294 | 27,218,200,294 |
| වසර සඳහා ලාභය | | | 1,169,211,614 | 1,169,211,614 |
| පෙර කාලපරිච්ඡේදයේ වෙනස්කම් සඳහා ගිණුම් ඇස්තමේන්තු ගැලපීම | | | (2,425,950) | (2,425,950) |
| අධිභාර බද්ද සඳහා ගැලපීම | | | (711,035,566) | (711,035,566) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 325,740,848 | 325,740,848 |
| සම්පූර්ණ විස්තීරණ ආදායම | - | - | 781,490,946 | 781,490,946 |
| **2021 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 19,520,691,240 | 27,999,691,240 |
| වසර සඳහා ලාභය | | | (1,058,696,799) | (1,058,696,799) |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | 287,883,166 | 287,883,166 |
| සම්පූර්ණ විස්තීරණ ආදායම් | - | - | (770,813,633) | (770,813,633) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 18,749,877,607 | 27,228,877,607 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | සටහන් | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහයන්** | | | |
| ආදායම් බදු වියදමට පෙර ලාභය | | (704,084,743) | 1,595,321,623 |
| **ගැලපීම්** | | | |
| මූල්‍ය ආදායම | 5 | (285,281,394) | (201,571,237) |
| මූල්‍ය වියදම් | 5.2 | - | - |
| සේවක ණය හානිකරණය සඳහා දීමනාව | | (9,483,126) | 33,641,168 |
| තොග සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා වෙන්කිරීම් | | 324,325 | 157,894,565 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමේදී අලාභය/ (ලාභය) | 4 | (3,808,632) | 69,236 |
| නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සඳහා ප්‍රතිපාදන | | 270,587,099 | 242,758,885 |
| ක්ෂයවීම් | 10.2 | 846,452,285 | 893,144,073 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 11.2 | 29,775,640 | 28,186,363 |
| වත්කම් භාවිතයේ අයිතිය ක්‍රමක්ෂය | 10.5 | 2,408,512 | 8,461,853 |
| වත්කම් භාවිතයේ අයිතිය - කල්බදු පොලිය | 10.6 | - | 335,753 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 146,889,965 | 2,758,242,283 |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (180,792,599) | (21,580,466) |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩි වීම)/අඩුවීම | | 492,998,283 | (2,383,015,907) |
| අනෙකුත් මූල්‍ය වත්කමවල වැඩිවීම/(අඩුවීම) | | 211,136,327 | (218,393,508) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම) | | 824,595,179 | 716,132,860 |
| **මෙහෙයුම්වලින් ජනිත වූ (භාවිත කරන ලද) මුදල්** | | 1,494,827,155 | 851,385,262 |
| ගෙවූ ආදායම් බදු | | (211,170,312) | (650,205,907) |
| ගෙවූ අධිභාර බදු | | (711,035,566) | - |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ | 17 | (184,776,742) | (220,472,106) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද /(භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | 387,844,535 | (19,292,751) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදීගැනීම් | 10.1 | (925,467,991) | (1,357,927,201) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබීම් | | 4,186,632 | - |
| මූල්‍ය ආදායම | 5 | 285,281,394 | 201,571,237 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ /(භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (635,999,965) | (1,156,355,964) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ණය ආපසු ගෙවීම | | - | - |
| ගෙවන ලද ලාභාංශ | | - | - |
| කල්බදු ණයකරුගේ ගෙවීම | | (2,665,004) | (9,442,200) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | (2,665,004) | (9,442,200) |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (250,820,434) | (1,185,090,915) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 2,256,929,658 | 3,442,020,573 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | 15 | 2,006,109,224 | 2,256,929,658 |

පිටු 08 සිට 36 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2003 ඔක්තෝබර් 08 වන දින සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම් ඇති සමාගමක් වන අතර, සමාගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, නිමාව, කොලොන්නාව යන ස්ථානයෙහිය.

### 1.2 මූලික කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ, සමාගමේ මූලික කටයුතු වූයේ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

### 1.3 මව් සමාගම සහ අවසාන පාලන පාර්ශවය

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් සමාගම වන්නේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවයි.

### 1.4 නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාව අනුව 2023 පෙබරවාරි 28 දින බලය පවරනු ලැබීය.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියමකරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKASs) වලට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

### 2.1.1 අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

- නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සඳහා වන වගකීම් ආයුග ණක ක්‍රම අනුව තක්සේරුකර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

### 2.1.2 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් සිදුකර ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය තුළ අඛණ්ඩව කටයුතු කිරීමට සම්පත් සමාගමට ඇති බවට ඔවුන් තෘප්තිමත්ය. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව තිබෙන යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එම නිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

### 2.2 ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වේ.

### 2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් නිසැක වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග අනුරූප වේ. පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

### 2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා කරන ලද ප්‍රමාණයට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවන් වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්වලට අනාගත කාලසීමාවන් තුළ බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු හා උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

ඇස්තමේන්තුවලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකළ කාලසීමාවේදී සහ එය බලපාන අනාගත කාලවලදී හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද වටිනාකම් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, ඇස්තමේන්තු කිරීම, අවිනිශ්චිතතාවය සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වඩා වැදගත් ක්ෂේත්‍ර පහත පරිදි වේ.

### (අ) සේවක ප්‍රතිලාභ වගකීම

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් - පාරිතෝෂිකවල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, සහ අනෙකුත් අදාල දත්තයන් ඇතුළත් වේ. සේවක ප්‍රතිලාභවල දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එකී ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමාගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් 17.2 සහ 17.4 හි දක්වා ඇත.

### (ආ) වෙළෙඳාමෙන් ලැබිය යුතු දෑ හානිකරණය

වෙළෙඳාමෙන් ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට සමාගම විසින් තක්සේරු කරනු ලැබෙයි. ලැබිය යුතු දෑ දැනට පවත්නා තත්ත්වය සහ ණය අයකර ගැනීම පිළිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. එවැනි හානිකරණ සැබෑ සහ අපේක්ෂිත හානි පිළිබිඹු කිරීම සඳහා වරින් වර ගැලපීම් කරනු ලැබේ. සටහන 13 සහ 19 හි අනාවරණය කර ඇති පරිදි සමාගම 2021 වසර තුළ වෙළඳ සහ ලැබිය යුතු මුදල් හා සම්බන්ධ වෙනත් කිසිදු හානිකරණ හඳුනාගෙන නොමැත.

### (ඇ) ආදායම් බදු සහ විලම්භිත බදු

සමාගම ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය අවිනිශ්චිත වන බොහෝ ගණුදෙනු සහ ගණනය කිරීම් ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටළු මත ආයතනය බදු වගකීම් හඳුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණන්වලින් වෙනස් වන විට, එවැනි වෙනස්කම් ජංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්භිත බදු වත්කම් සහ වගකීම්වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

## 2.5 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.5.1 විදේශ විනිමය පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර එය සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ ව්‍යවහාර මුදල වේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනු දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ.

### 2.5.2 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට ආදායම හඳුනාගත හැකිය. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළෙඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කළ අගය මත බදු) අඩු කොට ආදායම ගණනය කෙරෙයි.
ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකිවිට, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළ විශේෂිත නිර්ණායක සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. එය අනාගතයේදී ලැබිය හැකි ආදායමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට සමාගම ආදායම හඳුනා ගනී, අදාල සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසැලකෙයි.

### (අ) සේවාවන් සැපයීම

සේවාවන් සැපයූ හෝ ඉටුකළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හඳුනාගනී.

**පර්යන්ත ගාස්තුව**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව අතර 2003 වර්ෂයේ දී අත්සන් කළ පසුව 2011 සහ 2019 වර්ෂවල සංශෝධනය කළ, පොදු භාවිතා ගිවිසුම අනුව, අලෙවිකරණ සමාගම්වලින් අයකරවාගත් මෙහෙයුම් පිරිවැයවලින් සමන්විත වේ. එය ඔවුන්ට හිමි ඛනිජතෙල් නිෂ්පාදනයන් හුවමාරුවන අවස්ථාවේ දී හඳුනාගැනේ. අලෙවි කරනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මනිනු ලැබේ.

**මෙහෙයුම් ආන්තිකය**

මිල සූත්‍රවල කලින් තීරණය කළ අනුපාතය මත පදනම්ව මෙහෙයුම් ආන්තිකය හඳුනා ගැනේ. මෙහෙයුම් ආන්තිකය මනිනු ලබන්නේ විකුණනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදන ලීටරයකට ය.

**ප්‍රවාහන ආදායම**

දුම්රිය, වැගන්, නළ මාර්ග සහ බවුසර් ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර පරිමාව සහ ගමන් කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගනු ලැබේ.

2022 නොවැම්බර් 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, ඓතිහාසික SLAB ගාස්තු අයකර ගැනීම වෙනුවට CPC සහ LIOC සමඟ අත්සන් කිරීමට නියමිත නව ගිවිසුමේ වගන්ති අංක 06 අනුව තොග ගබඩාවල ඉන්ධන අලෙවිය මත අන්තර්-පර්යන්ත ඉන්ධන තොග ප්‍රවාහන ගාස්තු 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකර ගැනීමට අනුමැතිය ලබා දෙන ලදී.

**(ආ) මූල්‍ය ආදායම**

පොළිය උපචිත වනවිට, ඵලදායි පොළි ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනී.

දේපළ, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන් ලද මුදල් වලින් වත්කම්වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශනයට ගණනය කර ඇත.

අහඹු කටයුතුවල සිට ප්‍රධාන ආදායම් උත්පාදන කටයුතු දක්වා සහ වැදගත් නොවන සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

**2.5.3 වියදම් හඳුනාගැනීම**

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ රාජ්‍යයක දේපළ පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරණ ලද සියලුම වියදම් කාලසීමාව සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය සඳහා අය කර ඇත.

**2.5.4 බදුකරණය**

එය කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම වර්තන සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාලව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහා වන ලාභයට හඳුනාගනී. මෙහිදී බදු, පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම හා සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගැනේ.

**වත්මන් බදු**

වත්මන් සහ පෙර කාලපරිච්ඡේද සඳහා වත්මන් ආදායම් බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු බලධාරීන්ගෙන් අයකර ගැනීම හෝ ගෙවනු ලබන අපේක්ෂිත මුදලින් ය. එම මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති ඒවා වාර්තා කරන දිනය වන විට පනවනු බල පැවැත්වෙන බදු නීතීන්ය.

ආදායම් බදු ගණනය මූල්‍ය ප්‍රකාශයන්හි සඳහන් අදාල බදු නීතීන්හි, විධිවිධාන අනුව ප්‍රකාශ සහ ගණනය කර ඇත.

හිමිකම් සඳහා සෘජුවම පිළිගත් අයිතමවලට අදාල වත්මන් ආදායම් බද්ද හිමිකම් ප්‍රාග්ධනය හා ගැළපීම් කරන අතර එය විස්තීර්ණ ගැලපීම් නොකෙරේ.

**විලම්භිත බදු**

වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරන පරමාර්ථ සඳහා වන ධාරණ අගයන් අතර, වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්භිත බදු වෙන් කිරීම සිදුකරයි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්භිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන, තාවකාලික වෙනස්කම් ඇතිවිට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හදුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම්වලට අදාල විලම්භිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හදුනාග ැනීමකින් හටගන්නේ නම් සහ ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන්නේ නම්, අඩුකලහැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාග නු ලබයි.

විලම්භිත ආදායම් බදු වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරන අතර භාවිතා කළ යුතු විලම්භිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්භිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධි වනවිට හෝ වගකීම පියවනවිට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

**අධිභාර බදු**

**මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

තවද, 2022 අංක 14 දරන අධිභාර බදු පනතෙන් පැන නගින බදු වගකීම් අංක 22.2 ආදායම් බදු සටහන යටතේ අනාවරණය කර ඇති පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ප්‍රතිකාර ප්‍රකාශය (SoAT) මගින් නිර්දේශිත පරිදි ගිණුම්ගත කර ඇත.

විකුණුම් බදු (එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද) බදු අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිලදී ගැනීමේ දී දරණ ලද, අදාල පරිදි විකුණුම් බදු ඇතුළත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර, අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ වල කොටසක් ලෙස ඇතුළත් කරයි.

## 2.5.5 මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම සහ පසුකාලීන අගය කිරීම

### 2.5.5.1 මූල්‍ය වත්කම්

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

**මූලික හඳුනාගැනීම සහ මැනීම**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂයපථය තුළ ඇති මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි රැකුමක් ඇති ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස යොදවා ඇති ව්‍යුත්පන්න ලෙස සුදුසු පරිදි වර්ගීකරණය කරයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේ දී තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් මූලිකවම ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ලාභාලාභ තුළින් සාධාරණ අගයට නොදක්වන වත්කම් සම්බන්ධයෙන් ඍජුවම හඳුනාගත හැකි ගනුදෙනු පිරිවැය ද ඊට එකතු කරයි.

වෙළෙඳපොලේ රෙගුලාසි හෝ සම්මුතියකට (සාමාන්‍ය ආකාරයේ වෙළෙඳාම්) අනුව පිහිටුවා ගන්නා ලද, කාල පරාසයක් තුළ වත්කම් බෙදාහැරීමට අවශ්‍යවන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම් දිනට, එනම් සමාගම වත්කම් මිලට ගැනීම් හෝ විකිණීම් සිදුකරන දිනට, හඳුනාගනු ලබයි.

**පසුකාලීන අගය කිරීම**

මූල්‍ය වත්කම් පසුකාලීනව අගය කිරීම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ:

### (අ) ණය සහ ලැබිය යුතු මුදල්

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළෙඳ ලැයිස්තුගත නොකල ස්ථාවර හෝ තිරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික අගය කිරීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණය අඩුකර අගය කරයි.

අත්පත්කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කරයි. හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයෙහි හඳුනා ගනී.

### ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (අදාල වන විටදී මූල්‍ය වත්කමකින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක්) ඉවත් කරනු ලබන්නේ;

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට,
- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගමට ඇති අයිතිය පවරා ඇති විට, හෝ මාරු කිරීම් වැඩ පිළිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළුමනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිකරගෙන ඇතිවිටක සහ (අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම් සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට, නැතහොත් (ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම් සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැති වුව ද වත්කමෙහි පාලනය පවරා ඇති විට.

සමාගම විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ මාරුකිරීම් වැඩ පිළිවෙලකට සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැතිව හෝ එහි පාලනය පවරා නොමැතිව ඇති විට වත්කම හඳුනාග නු ලබන්නේ ඒ සඳහා සමාගමේ අඛණ්ඩ මැදිහත්වීම් මට්ටම අනුව ය. එවැනි විටදී, සමාගම ආශ්‍රිත වගකීමක්ද හඳුනාග නී. සමාගම විසින් රඳවා තබාගත් හිමිකම් සහ බැඳීම් පෙන්නුම් වන පදනමක් මත පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම අගය කරනු ලබයි.

පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමාගමට ආපසු ගෙවීමට අවශ්‍යවන, උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

### මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණය වී තිබේ ද යන්න පිළිඳව විෂය මූලික සාක්ෂි තිබේ ද යන්න, සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හඳුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්) ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ, විශ්වාසවන්තව මිනුම් කළහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇතිකරනවිට, හානිකරණය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය සිදුවී ඇතැයි සලකනු ලබයි. ණයගැතියන් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විඳිමින් සිටිනවිට, පොළිය හෝ මුල් මුදල නොගෙවීම, ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇතිවිට, සහ පැහැර හැරීම සමග සහසම්බන්ධවන හිඟවල හෝ ආර්ථික තත්ත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනියහැකි අඩුවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථා ඇගයීම් හානිකරණය වීම පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් කළ හැක.

### ක්‍රමක්ෂය පිරිවැයට පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සමාගම විසින් පළමුව තක්සේරු කරනු ලබන්නේ, තනි තනිව සැලකියයුතු මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිකරණය වීම පිළිබඳ විෂය මූලික සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳ හෝ තනිතනිව නොසැලකියයුතු මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හානිකරණය වීම පිළිබඳව විෂය මූලික සාක්ෂි පවතින්නේද යන්න සම්බන්ධයෙහි මූල්‍ය වත්කම් සඳහා හානිකරණය වීම පිළිබඳ විෂය මූලික සාක්ෂි නොමැති බවට සමාගම විසින් නිශ්චය කරගන්නේ නම්, ඒවා සැලකියයුතු වුවත්, නැතත්, සමාන ණය අවදානම් ගතිලක්ෂණ පවතින මූල්‍ය වත්කම්

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

සමූහයක් එයට ඇතුලත් කොට, හානිකරණය වීම සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් හෝ එය අඛණ්ඩව පවතින බව හඳුනා ගත්තේ නම්, එකී වත්කමේ හානිකරණය වීම තක්සේරු නොකරයි.
හානිකරණය අලාභයක් දරා ඇති බවට විෂයමූලික සාක්ෂි ඇති විට අලාභයේ ප්‍රමාණය මිනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (තවමත් දරා නොමැති අනාගත අපේක්ෂිත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනස මගිනි. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන්, මූල්‍ය වත්කමේ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සඳහා විචල්‍ය පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සඳහා විචල්‍ය පොළී අනුපාතිකයක් ඇත්නම්, යම් හානිකරණය අලාභයක් මිනුම් කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වන්නේ වර්තන සඵල පොළී අනුපාතයයි.

වත්කමේ ධාරණ අගය අත්තිකාරම් ගිණුමක් භාවිත කිරීම හරහා අඩුකරන අතර අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. පොළී ආදායම, අඩුවූ ධාරණ අගය මත අඛණ්ඩව උපචිත වන අතර, හානිකරණය අලාභය මැනීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට භාවිතා කරන පොළී අනුපාතය භාවිතයෙන් පොලිය උපචිත කිරීම සිදු කරයි. පොළී ආදායම, ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරයි. අනාගත අයකර ගැනීම සම්බන්ධයෙන් යථාර්තවාදී අපේක්ෂාවක් නොමැති අවස්ථාවේදී සහ සියලු අතිරේක ඇප උපලබ්ධි වී ඇති හෝ සමාගමට පැවරනු ලැබ ඇති විට, ණය සහ ණය ආශ්‍රිත ඉඩහැරීම් සමාගම ලියාහරියි. හානිකරණය හඳුනාගත් පසු ඇති වූ සිදුවීමක් නිසාවෙන්, පසු කාලීන වසරකදී, හානිකරණය හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමක් නිසා, තක්සේරු කරන ලද හානිකරණ අලාභය ඉහළ යාම සිදුවේනම්, පෙර හඳුනාගත් හානිකරණ අලාභය දීමනා ගිණුම ගැලපීම මගින් වැඩි කිරීම හෝ අඩු කිරීම කරේ. අනාගත ලියාහැරීමක් පසුව නැවත අයකරගතහොත්, අයකරග ැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරයි.

### 2.5.5.2 මූල්‍ය වගකීම්

වෙළෙඳ කටයුතුවලින් ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොලි දරණ ණය සහ ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ.

#### මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 යේ විෂයපථය තුළ වූ මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ සුදුසු පරිදි ඵලදායි ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන් වර්ග කෙරේ.

සමාගම මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි. සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායම් සංරචකයක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාල කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හඳුනාගනු ලබයි.

#### පසුකාලීනව අගය කිරීම

පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් අගය කිරීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

#### (අ) ණය සහ ණය ගැනීම්

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොළී දරණ ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමයකි. පිරිවැයට පසු කාලීනව මිනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුළ මෙන්ම වගකීම් ඉවත්කිරීම් සිදු කරනවිට ආදායම් ප්‍රකාශය තුළ ලාභ අලාභ හඳුනාගැනේ. අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් කරයි.

#### ඉවත් කිරීම

වගකීම යටතේ ඇති බැදියාව මුදාහැර ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනත් නියමයන් මත එම ණයහිමියාගෙන් හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනසක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට, එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාල ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 2.5.6 සාධාරණ අගය මැනීම

අගය කරන දිනයට වෙළෙඳපොල සහභාගිවන්නන් අතර නිසි ලෙස කරන ගනුදෙනුවකදී වත්කමක් විකිණීම සඳහා

ලැබෙන මිල හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගනුදෙනුව

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොළ

හෝ

- ප්‍රධාන වෙළෙඳපොලක් නැතිවිට දී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී

ප්‍රධාන හෝ වාසිදායක වෙළෙඳපොල සමාගමට ඇතුලත් විය හැකි වෙළෙඳපොලක් වියයුතුය.

වෙළෙඳපොල සහභාගීවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන්න උපකල්පනය කරමින් වත්කම හෝ වගකීම මිල කිරීමේ දී වෙළෙඳපොලට සහභාගීවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහළ ම හා හොඳම භාවිතය යොදාගනිමින් හෝ ඉහළම සහ හොඳම භාවිතය යොදාගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට විකිණීමෙන් වෙළෙඳපොල සහභාගීවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.

ඇගයුම් කිරීමේ දී අදාල නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය මනිනු ලැබූ හෝ හෙලිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය ධූරාවලිය තුළ පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.

- මට්ටම 1 - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොලෙහි ලැයිස්තුගත (නොගැලපූ) මිල ගණන්
- මට්ටම 2 - සාධාරණ අගය මැනීමට වැදගත් ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන ඇගයීම් ක්‍රම
- මට්ටම 3 - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙලිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම් ඉහත විස්තරකර ඇති ආකාරයට ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම්වල අවධානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

### 2.5.7 තොග

කල් පැන ගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කළ පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග සහ විකිණිය හැකි මිලක් නියම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකළ පසු ශුද්ධ උපලබ්ධි අගය වේ. තොග වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරණ ලද පිරිවැය, සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.

| | |
|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් හා අළුත්වැඩියාව සඳහා පොදු භාණ්ඩ - | බර තබන ලද සාමාන්‍ය මත පදනම්ව මිල දී ගැනීමේ පිරිවැයට |
| නිමි තොග - | සත්‍ය ගැනුම් පිරිවැයට |

### 2.5.8 දේපළ පිරියත සහ උපකරණ

එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර, පිරිවැයේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකළ පසු අගයට දේපොළ, පිරියත සහ උපකරණ දක්වා ඇත. හඳුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපොළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය, දැරූවිට එවැනි පිරිවැයට ඇතුළත් වේ.

වසර අවසානයට තව දුරටත් අසම්පූර්ණ තත්ත්වයේ පවතින, භාරගත් කාර්යයන් මත ගෙවන ලද, සියලුම අගයන් නිම නොවූ ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි.

අවිනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලකෙන නිසාවෙන් ඉඩම් ක්ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්ෂයවීම් අවසාන කරයි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීව කාලය සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි.

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකරගතහැකි අගය දක්වා කපා හරිනු ලබයි. විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමඟ සැසඳීමෙන් බැහැර කිරීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබයි.

### 2.5.9 කල්බදු සඳහා ගිණුම්කරණය - සමාගම කල්බදු ලාභියා වන විට

කොන්ත්‍රාත්තුවක් කල්බදුවක් ද, යන්න කොන්ත්‍රාත්තුවේ ආරම්භයේදීම සමාගම තක්සේරු කරයි. එනම්, කොන්ත්‍රාත්තුව යම් කාල සීමාවක් සඳහා හඳුනාගත් වත්කමක පාලනය සහ භාවිතා කිරීම කිරීමට ඇති අයිතිය යම් අගයක් හුවමාරුව මත ලබාදීමයි.

සමාගම අඩු වටිනාකමකින් යුත් වත්කම් බදු දීම හැර කෙටි කාලීන කල්බදු සහ අනෙකුත් සියලුම කල්බදු සඳහා කේවල හඳුනාගැනීමේ සහ මිනුම් ප්‍රවේශයක් යොදයි.

පාදක වූ වත්කම් භාවිතා කිරීමට ඇති අයිතිය නියෝජනය කරන වත්කම් භාවිතයේ අයිතිය සහ කල්බදු ගෙවීම් සහ කල්බදු වගකීම් සමාගම හඳුනා ගනී.

### වත්කම් භාවිතයේ අයිතිය

2020 වර්ෂයේදී වත්කම් භාවිතා කිරීමේ අයිතිය පසු කාලීන වසර සඳහා ද ගැළපීම පිළිගෙන ඇත. භාවිත යේ අයිතිය වත්කම් මනිනු ලබන්නේ පිරිවැය, සමුච්චිත ක්ෂයවීම් සහ හානිවීම් සහ කල්බදු පාඩු අනුවය. භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම්වලට වියදම, පිළිගත් කල්බදු වගකීම් ප්‍රමාණය, දරණ ලද මූලික සෘජු පිරිවැය සහ බදු ගෙවීම් ඇතුළත් වේ. කල්බදු කාලසීමාව සහ වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය කෙටිකාලීනව සරල රේඛීය පදනම මත පහත සඳහන් පරිදි ය:

මෝටර් රථ - මෙහෙයුම් කල්බදු කාලය වසර 5

### 2.5.10 අස්පෘශ්‍ය වත්කම්

#### (අ) ERP පද්ධති සහ ERP සඳහා බලපත්‍ර ගාස්තු

ආයතන සම්පත් සැළසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැළසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු මිලට ගත් මෘදුකාංග යෙදුම් සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මගින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකොට ගෙන යයි. බලපත්‍රවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

### 2.5.11 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොසැලකිය යුතු තරමේ අවදානමක් සහිත, ඉහළ ද්‍රවශීලතාවයන් ඇති කෙටිකාලීන ආයෝජන වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ අර්ථකථනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා, මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් සහ පියවිය යුතු බැංකු අයිරාව අඩුකල පසු ඉතිරිවන බැංකු තැන්පතුවලිනි. මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජන ද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

### 2.5.12 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

අවිනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය වීමට භාජනය නොකරන අතර, හානිකරණයවීම සම්බන්ධව පරීක්ෂා කරනු ලබයි. ධාරණ අගය අයකරගැනීමට නොහැකි වනු ඇති බවට සිදුවීම් හෝ අවස්ථාවන්ගේ වෙනස්කම් පෙන්නුම් කරන විට දී, ක්‍රමක්ෂය සඳහා භාජනය වන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්තමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට හානිකර අලාභය හඳුනාගනු ලැබේ. ආපසු අයකරගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන පිරිවැය අඩුකළ පසු ලැබෙන අගය සහ භාවිත අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි. හානිකරණය තක්සේරු කිරීමේ අරමුණ සඳහා, වෙන් වෙන්ව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් ජනනය කරන ඒකක) ඇති පහළම මට්ටම් වලට වත්කම් කාණ්ඩ කරනු ලැබේ.

### 2.5.1 වෙන්කිරීම්

සමාගමට, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීමේ ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවලට සටහන් පිළිබඳව විශ්වාසදායක ලෙස ඇස්තමේන්තුවක් කළහැකි විටක, වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම මුළුමනින්ම හෝ කොටස් ප්‍රතිපූර්ණ කිරීමට සමාගම අපේක්ෂා කරනවිට, එම ප්‍රතිපූර්ණය සැබැවින්ම නිශ්චිත නම් පමණක්, එය අඩුකල පසු ලැබෙන අගයට ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ. මුදලේ කාල වටිනාකම සැලකිය යුතු වන්නේ නම්, වෙන්කිරීම් තීරණය කරනු ලබන්නේ, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ කාල වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරුකිරීම් සහ යෝග්‍ය විටදී වගකීමට විශේෂිත වන අවදානම පෙන්නුම් කරන බදු පෙර අනුපාතයට වට්ටම් කිරීමෙහි වට්ටම් කිරීම භාවිතා කරන විට, කාල පරාසය හේතුවෙන් වෙන්කිරීමෙහි සිදුවන ඉහළ වියදම් ලෙස හඳුනා ගැනේ.

### 2.6 සේවක ප්‍රතිලාභ

#### (අ) නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂිකය

'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය' භාවිතා කරමින් සෑම මූල්‍ය වර්ෂයකදීම, ආයුගණකයකුගේ උපදෙස් අනුව සමාගම විසින් නිශ්චිත සැලසුමක් ලෙස සලකනු ලබන පාරිතෝෂික බැඳීම්වල පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය ගිණුම් කරනු ලබයි. ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා කාලසීමාව තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි. වගකීම මූල්‍යනය කරනු නොලැබේ.

#### ආයුගණන ලාභ සහ අලාභ හඳුනාගැනීම

ආයුගණන ලාභ සහ අලාභ ඒවා හටගන්නා වර්ෂය තුළදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි.

#### (ආ) නිශ්චිත දායක සැළසුම්

සමාගම නිශ්චිත දායක සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායක සැලසුම සඳහා ගෙවිය යුතු දායකය, සේවකයන් විසින් සමාගමට සැපයූ සේවයට සමානුපාතික වන අතර, 'කාර්යමණ්ඩල වියදම්' යටතේ වාර්තා කෙරෙයි. නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස වාර්තා කරයි. සමාගම පහත සඳහන් යෝජනාක්‍රම සඳහා දායක වේ.

#### සේවක අර්ථසාධක අරමුදල

සමාගම හා සේවකයා විසින් දළ වැටුපෙන් (අතිකාල රහිතව) 15% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

#### සේවක නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් අතිකාල රහිතව 3% කින් සමාගම දායක වේ.

#### (ඇ) වෛද්‍ය ප්‍රතිලාභ යෝජනාක්‍රමය

CPSTL සේවකයින් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අලියාන්ස් රක්ෂණ සමාගම විසින් කළමනාකරණය කෙරේ. සමාගම විසින් රක්ෂණ සමාගමට ගෙවූ රක්ෂණ වාරිකය වසර තුළ වියදමක් ලෙස හඳුනා ගනී.

### 2.7 කොටස් හිමියන්ගේ ගිවිසුම කල් ඉකුත් වීම සහ කොටස් විකුණුම් මිලදී ගැනීමේ ගිවිසුම - පොදු පරිශීලක පහසුකම්

කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකිණීමේ මිලදී ගැනීමේ ගිවිසුම - ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන සමාගම් අතර පොදු පරිශීලක පහසුකම්, පසුගිය 2008 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් විය. එකී ගිවිසුම අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම සිදුකර නොමැති අතර ආදායම් සහ වියදම් ගිවිසුමේ සඳහන් කර ඇති, ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇති අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද කොන්දේසි සහ පසුකාලීන වෙනස්කම් සලකා බැලීමෙන් පසු මෙම මූල්‍ය ද ගිවිසුම කල් දැමූ ආදායම් බදු වගකීම්, කල් දැමූ ආදායම් බදු හැර බදු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් මූල්‍ය අංශයේ සඳහන් වෙයි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | | 2022<br>රු. | 2021<br>රු.<br>නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **3.** | **ආදායම** | | |
| **3.1** | **ප්‍රධාන ආදායම** | | |
| | පර්යන්ත ආදායම | 6,891,331,880 | 8,363,888,241 |
| | මෙහෙයුම් ආන්තිකය | 2,492,318,423 | 2,983,425,462 |
| | | 9,383,650,303 | 11,347,313,703 |
| | **සේවා සැපයීම** | | |
| | ප්‍රවාහන ආදායම | 49,665,783 | 2,928,875,589 |
| | | 49,665,783 | 2,928,875,589 |
| | **මුළු ආදායම** | 9,433,316,086 | 14,276,189,292 |
| **4** | **වෙනත් මෙහෙයුම් ආදායම්** | | |
| | කාර්ය මණ්ඩල ණය සහ වෙනත් දෑ සඳහා පොළිය | 699,532,464 | 457,423,182 |
| | දේපල, පිරියත හා උපකරණ විකිණීම මත අලාභය | 3,808,632 | (69,236) |
| | කුලී ආදායම | 11,922,876 | 10,941,824 |
| | මුදාහැරීමේ ගාස්තු | 2,290,000 | 4,930,000 |
| | විද්‍යාගාර පරීක්ෂණ ගාස්තු | 188,028,587 | 99,938,982 |
| | පුද්ගලික බවුසර් රියදුරන්ට/පෝටර්වරුන්ට පුහුණුව | 9,764,294 | 3,368,649 |
| | සුන්බුන් අලෙවිය | 19,004,039 | 9,718,504 |
| | ගිනි නිවීමේ උපකරණ සේවා | 72,590 | 441,132 |
| | ක්‍රමාංකන ගාස්තු | 6,262,750 | 6,657,077 |
| | විනිමය ලාභ / අලාභ | 356,398,600 | 92,104,967 |
| | විවිධ ආදායම | 8,053,489 | 18,055,837 |
| | සංචාරක බංගලා ආදායම | 507,800 | 95,400 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 2,856,374 | 1,905,491 |
| | දිගුකාලීන හිඟ ණයහිමි ශේෂ ආපසු ගෙවීම | - | - |
| | | 1,308,502,495 | 705,511,810 |
| **4.1** | **නැවත අයකරගත නොහැකි ණය කපාහැරීම** | - | 174,338,317 |
| | | - | 174,338,317 |
| **5.** | **මූල්‍ය ආදායම** | | |
| | **මූල්‍ය ආදායම** | | |
| | ප්‍රති ආයෝජන (REPO) මත පොළිය | 58,806,447 | 29,087,636 |
| | තැන්පතු මත පොළිය | 226,474,947 | 172,483,601 |
| | | 285,281,394 | 201,571,237 |

| | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **6. බදු පෙර ලාභය** | | |
| **පහත දෑ අය/බැරකිරීමෙන් පසු** | | |
| **සෘජු වියදම්වල ඇතුළත් දෑ** | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 3,190,140,824 | 3,188,058,702 |
| වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | 681,494,842 | 727,384,093 |
| **පරිපාලන වියදම්වල ඇතුළත් දෑ** | | |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | 4,500,145 | 7,957,893 |
| අධ්‍යක්ෂවරු සඳහා ගාස්තු | 1,737,500 | 2,090,000 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 3,555,055,732 | 3,720,333,582 |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම : වසර සඳහා ගාස්තුව | 270,587,099 | 242,758,885 |
| විගණන ගාස්තුව - පවත්නා වසර | 2,780,000 | 1,920,000 |
| වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | 164,957,443 | 165,759,980 |
| වසර සඳහා ක්‍රමක්ෂය ගාස්තු | 29,775,640 | 28,186,363 |
| කාර්ය මණ්ඩල ණය හානිකරණය සඳහා දීමනාව/(ආපසු හැරීම) | (9,483,126) | 33,641,168 |
| තොග සඳහා වෙන්කිරීම් | 324,325 | 630,498 |

## 7. බදු වියදම්

2022 දෙසැම්බර් 31 සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංරචක පහතින් දැක්වේ :

| | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **7.1 ආදායම් ප්‍රකාශය** | | |
| ***වර්තන ආදායම් බද්ද:*** | | |
| වර්තන බදු වියදම් | - | 505,568,268 |
| පෙර වර්ෂය වෙනුවෙන් වර්තන බදු ඌණ / අධි වෙන්කිරීම | (3,194,266) | (6,928,800) |
| ***විලම්භිත බදු:*** | | |
| විලම්භිත බදු අයකිරීම /(බැර) (සටහන 8) | 357,806,322 | (89,603,710) |
| **ආදායම් ප්‍රකාශනයේ වාර්තාකරන ආදායම් බදු වියදම /(බැර)** | 354,612,056 | 409,035,758 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

## 7. බදු වියදම් (ඉදිරියට.....)

**7.2** 2022 දෙසැම්බර් 31 සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා බදු වියදම හා ගිණුම්කරණ ලාභය ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කිරීමෙන් ලද ලාභය අතර සසැඳුම පහත දැක්වේ.

| | 2022<br>රු. | 2021<br>රු.<br>නැවත ප්‍රකාශිත |
|---|---|---|
| බදු පෙර ගිණුම්කරණ ලාභය | (704,084,743) | 1,595,321,623 |
| ඉඩ නොදෙන ලද සමස්ත අයිතමයන් | 911,087,610 | 1,388,180,547 |
| ඉඩ දෙන ලද සමස්ත අයිතමයන් | (1,855,359,290) | (1,168,462,126) |
| | (1,648,356,423) | 1,815,040,044 |
| පොළී ආදායම | 431,467,843 | 291,494,405 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | (1,216,888,580) | 2,106,534,449 |
| අඩුකිරීම: ඉදිරියට ගෙන යන බදු අලාභ | - | - |
| බදු අයකළ හැකි ලාභය/ (අලාභය ) | (1,216,888,580) | 2,106,534,449 |
| බදු අයකළ හැකි ලාභය සඳහා ආදායම් බදු | - | 505,568,268 |
| වර්තන ආදායම් බදු වියදම | - | 505,568,268 |

## 8. විලම්භිත බදු වගකීම්

### 8.1 විලම්භිත බදු

විලම්භිත බදු වත්කම්, වගකීම් සහ ආදායම් බදු පහත පරිදි අදාල වේ.

| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | | අනෙකුත් විස්තීර්ණ ආදායම් | |
|---|---|---|---|---|---|---|
| | 2022<br>රු. | 2021<br>රු. | 2022<br>රු. | 2021<br>රු. | 2022<br>රු. | 2021<br>රු. |
| **විලම්භිත බදු වගකීම්** | | | | | | |
| බදු අරමුණ සඳහා ප්‍රාග්ධන දීමනා | 2,483,277,026 | 1,999,721,176 | 483,555,850 | (79,614,948) | - | |
| අස්පෘශ්‍ය වත්කම් | 7,589,171 | 10,292,598 | (2,703,427) | 3,585,265 | - | |
| | 2,490,866,197 | 2,010,013,774 | | | | |
| **විලම්භිත බදු වත්කම්** | | | | | | |
| තොග | 5,122,349 | 4,020,042 | (1,102,308) | (151,320) | - | |
| වෙන්කිරීම් | 9,585,932 | 9,944,696 | 358,764 | (8,073,880) | - | |
| නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් | 385,161,856 | 386,237,798 | (122,302,557) | (5,348,827) | 123,378,500 | 102,865,531 |
| බදු අලාභයෙන් බලපෑම | - | - | - | - | - | |
| | 399,870,137 | 400,202,535 | | | | |
| විලම්භිත ආදායම් බදු - ආදායම | | | | | | |
| **ශුද්ධ විලම්භිත බදු වගකිම/(වත්කම්)** | 2,090,996,061 | 1,609,811,239 | 357,806,322 | (89,603,711) | 123,378,500 | 102,865,531 |

**8.2 ආදායම් බදු අනුපාතය වෙනස් වීමේ බලපෑම**

30.0% ක ඵලදායි බදු අනුපාතයක් භාවිතයෙන් විලම්භිත බදු ගණනය කර ඇත. තනි බදු අනුපාත විවිධ බදු අයකළ හැකි ආදායම් මට්ටම්වලට අදාළ වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනට විලම්භිත බදු වගකීම් රු. 481,184,822/- කින් වැඩි විය.

2022 දෙසැම්බර් 19 දින සහතික කරන ලද 2022 අංක 45 දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව ව්‍යාපාර ආදායමෙන් පැන නගින ආයතනික ආදායම් බද්ද 2022 ඔක්තෝම්බර් 01 දින සිට 30% දක්වා ඉහළ නංවා ඇත. ආදායම් බදු සඳහා වන LKAS 12 ට අනුව විලම්භිත බදු ගණනය කිරීම වගකීම් ක්‍රමය මත පදනම්ව සිදුකරනු ලබන අතර, 30%ක නව බදු අනුපාතය 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත තාවකාලික වෙනස්කම් සඳහා යොදවා ඇත. සමාගම සඳහා ආදායම් බදු අනුපාතවල මෙම වෙනස හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට විලම්භීත බදු වියදම් / (ආපසු හැරවීම්) පිළිවෙලින් රු. මිලියන 564ක් සහ (රු. මිලියන 27)කි.

**9. කොටසක ඉපයීම්**

**9.1** කොටසක ඉපයීම ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත කාල පරිච්ඡේදය සඳහා වන ශුද්ධ ලාභය වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. මෙම පරිච්ඡේදය සහ පෙර කාල පරිච්ඡේදය තුළ හිඟව පවත්නා සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය බරතබන ලද සංඛ්‍යාව ප්‍රසාද දීමනාව වැනි මූලාශ්‍රයන්හී අනුරූප වෙනසක් නොමැතිව, හිඟව පවත්නා සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් වී ඇති සිදුවීම් සඳහා ගලපනු ලැබේ.

**9.2** කොටසක ඉපැයුම ගණනය කිරීම සඳහා භාවිතා කළ ආදායම් සහ කොටස් පිළිබඳ දත්ත පහතින් දැක්වේ.

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **ලවය වශයෙන් යොදාගත් සංඛ්‍යාවන්** | | |
| කොටසක මූලික ඉපයීම් සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවන ශුද්ධ ලාභය | (1,058,696,799) | 1,169,211,614 |
| **හරය ලෙස භාවිතා කරන සාමාන්‍ය කොටස් ගණනः** | | |
| බරතැබූ සාමාන්‍ය කොටස් ගණන | 750,000,000 | 750,000,000 |
| කොටසක මූලික ඉපයුමට අදාළ වන කොටසක මූලික ඉපැයුම | (1.41) | 1.56 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

## 10. දේපළ, පිරියත සහ උපකරණ

### 10.1 දළ ධාරණ අගය

| පිරිවැයට | 01.01.2022 දිනට ශේෂය රු. | එකතු කිරීම් රු. | මාරු කිරීම් රු. | බැහැර කිරීම් රු. | 31.12.2022 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 4,805,518,404 | | | | 4,805,518,404 |
| සින්නක්කර ගොඩනැගිලි | 1,795,929,730 | 982,270 | 116,577,664 | (804,000) | 1,912,685,664 |
| ගබඩා ටැංකි | 7,000,110,481 | | 1,670,269,925 | (7,663,000) | 8,662,717,406 |
| මෝටර් රථ | 1,870,359,156 | | | | 1,870,359,156 |
| නළ මාර්ග | 7,796,662,802 | 26,858,632 | | | 7,823,521,434 |
| ලීබඩු, සවිකිරීම් හා උපකරණ | 2,324,542,855 | 39,939,690 | 22,003,591 | (2,022,195) | 2,384,463,941 |
| පරිගණක | 333,993,614 | 8,010,300 | | | 342,003,914 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | 3,330,770,472 | 26,588,798 | 9,119,003 | | 3,366,478,272 |
| පොම්ප සහ ගැන්ට්‍රි | 1,502,334,782 | 5,587,793 | | | 1,507,922,575 |
| අඩු වටිනාකම් වත්කම් | 707,203 | 194,155 | | | 901,358 |
| **ක්ෂයකළ හැකි වත්කම්වල මුළු පිරිවැය** | 30,760,929,500 | 108,161,638 | 1,817,970,183 | (10,489,195) | 32,676,572,126 |
| **නොනිමි ප්‍රාග්ධනය** | 2,041,175,887 | 817,306,353 | (1,817,970,183) | (11,694,929) | 1,028,817,128 |
| | 32,802,105,387 | 925,467,991 | - | (22,184,124) | 33,705,389,254 |

### 10.2 ක්ෂයවීම්

| පිරිවැයට | 01.01.2022 දිනට ශේෂය රු. | වසරට අයකිරීම රු. | මාරු කිරීම් රු. | බැහැර කිරීම් රු. | 31.12.2022 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 783,387,307 | 53,338,770 | | (426,001) | 836,300,076 |
| ගබඩා ටැංකි | 3,090,992,422 | 175,798,767 | | (7,663,000) | 3,259,128,189 |
| මෝටර් රථ | 1,740,591,332 | 96,733,511 | | | 1,837,324,843 |
| නළ මාර්ග | 4,054,524,635 | 290,251,620 | | | 4,344,776,255 |
| ලීබඩු, සවිකිරීම් හා උපකරණ | 1,989,588,093 | 77,635,727 | | (222,759) | 2,067,001,061 |
| පරිගණක | 268,876,732 | 33,838,165 | | | 302,714,898 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | 3,116,473,815 | 85,663,081 | | | 3,202,136,896 |
| පොම්ප සහ ගැන්ට්‍රි | 1,240,045,364 | 33,047,862 | | | 1,273,093,226 |
| අඩු වටිනාකම් වත්කම් | 628,878 | 144,781 | | | 773,659 |
| | 16,285,108,578 | 846,452,285 | - | (8,311,760) | 17,123,249,103 |

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **10.3 ශුද්ධ පොත් වටිනාකම** | | |
| සින්නක්කර ඉඩම් | 4,805,518,404 | 4,805,518,404 |
| සින්නක්කර ගොඩනැගිලි | 1,076,385,588 | 1,012,542,424 |
| ගබඩා ටැංකි | 5,403,589,218 | 3,909,118,059 |
| මෝටර් රථ | 33,034,313 | 129,767,824 |
| නළ මාර්ග | 3,478,745,179 | 3,742,138,167 |
| ලීබඩු, සවිකිරීම් හා උපකරණ | 317,462,880 | 334,954,762 |
| පරිගණක | 39,289,016 | 65,116,882 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | 164,341,377 | 214,296,658 |
| පොම්ප සහ ගැන්ට්‍රි | 234,829,349 | 262,289,418 |
| නොනිමි ප්‍රාග්ධනය | 1,028,817,128 | 2,041,175,887 |
| අඩු වටිනාකම් වත්කම් | 127,699 | 78,326 |
| **දේපළ, පිරියත සහ උපකරණ සඳහා මුළු ධාරණ වටිනාකම** | 16,582,140,151 | 16,516,996,810 |

**10.4** මූල්‍ය වර්ෂය තුළ දී සමාගම විසින් සමස්ථ වටිනාකම රු. 925,467,991/- (2021 - රු. 1,357,927,201/-) ක දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගෙන ඇති අතර දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා වර්ෂය තුළ රු. 925,467,991/- (2021 - රු. 1,357,927,201/-) ක මුදල් ගෙවීම් සිදු කර ඇත. වර්ෂය තුළ රු. 1,817,970,183/- ක නොනිමි ප්‍රාග්ධනය ප්‍රධාන වත්කම් වෙත මාරු කරන ලදි.

### 10.6. වත්කම් භාවිතයේ අයිතිය

භාවිතයේ අයිතිය පිළිගත් වත්කම් ප්‍රමාණය සහ වසර තුළ චලනයන් පහත දක්වා ඇත.

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **පිරිවැය** | | |
| දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 42,309,263 | 42,309,263 |
| 2020 ජනවාරි 01 දිනට SLFRS 16 යොදාගැනීමෙන් | | |
| එකතු කිරීම සහ වැඩිදියුණු කිරීම | - | - |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 42,309,263 | 42,309,263 |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 39,900,751 | 31,438,898 |
| වසර සඳහා අය කිරීම | 2,408,512 | 8,461,853 |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 42,309,263 | 39,900,751 |
| **දෙසැම්බර් 31 වන දිනට ශුද්ධ පොත් වටිනාකම** | - | 2,408,512.10 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

### 10.7. බදු වගකීම භාවිතයේ අයිතිය

කල්බදු වගකීම් දරා ගැනීමේ ප්‍රමාණයන් සහ කාල සීමාව තුළ සිදු වූ චලනයන් පහත දක්වා ඇත.

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,665,004 | 11,771,450 |
| 2020 ජනවාරි 01 දිනට SLFRS 16 යොදාගැනීමෙන් | | |
| පොලී එකතු කිරීම | - | 335,753 |
| ගෙවීම් | (2,665,004) | (9,442,200) |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | - | 2,665,004 |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | | |
| වත්මන් වගකීම | - | 2,665,004 |
| වත්මන් නොවන වගකීම | - | - |
| | - | 2,665,004 |

### 10.8 වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:

| | 2022 | 2021 |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | අවුරුදු 35 | අවුරුදු 35 |
| ගබඩා ටැංකි | අවුරුදු 40 | අවුරුදු 40 |
| තොග ටැංකි | අවුරුදු 30 | අවුරුදු 30 |
| නළ මාර්ග | අවුරුදු 30 | අවුරුදු 30 |
| පොම්ප | අවුරුදු 20 | අවුරුදු 20 |
| වාහන | | |
| - නව අත්පත් කර ගැනීම් | අවුරුදු 5 | අවුරුදු 5 |
| - පැවරුණු අයිතමයන් | ඉතිරිව ඇති ජීව කාලය පුරා | |
| ගැන්ට්‍රි | අවුරුදු 15 | අවුරුදු 15 |
| උපකරණ | | |
| - ඉලෙක්ට්‍රොනික් | අවුරුදු 5 | අවුරුදු 5 |
| - වෙනත් | අවුරුදු 10 | අවුරුදු 10 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | | |
| - දැඩි | අවුරුදු 5 | අවුරුදු 5 |
| - වෙනත් | | |
| මුතුරාජවෙල අනෙකුත් වත්කම් | | |
| - ද්විත්ව ශීර්ෂ බෝයාව | අවුරුදු 10 | අවුරුදු 10 |
| - PLEM | අවුරුදු 10 | අවුරුදු 10 |
| - නළ මාර්ග | අවුරුදු 20 | අවුරුදු 20 |
| පරිගණක | අවුරුදු 4 | අවුරුදු 4 |

## 11. අස්පෘශ්‍ය වත්කම්

| | ERP පද්ධතිය රු. | SAP ERP බලපත්‍රය රු. | අක්වෙරළ නළ මාර්ගය ස්වයංක්‍රියකරණ පද්ධතිය රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **11.1 දළ ධාරණ අගය** | | | | |
| 2022.01.01 දිනට | 561,374,796 | 9,380,250 | 37,793,560 | 608,548,606 |
| එකතු කිරීම් | - | - | - | - |
| බැහැර කිරීම් | - | - | - | - |
| 2022.12.31 දිනට | 561,374,796 | 9,380,250 | 37,793,560 | 608,548,606 |

| | ERP පද්ධතිය රු. | SAP ERP බලපත්‍රය රු. | අක්වෙරළ නළ මාර්ගය ස්වයංක්‍රියකරණ පද්ධතිය රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **11.2 ක්‍රමක්ෂය** | | | | |
| 2022.01.01 දිනට | 494,700,197 | 9,380,250 | 37,793,560 | 541,874,007 |
| වසර සඳහා අය කිරීම | 29,775,640 | - | - | 29,775,640 |
| 2022.12.31 දිනට | 524,475,838 | 9,380,250 | 37,793,560 | 571,649,648 |
| **11.3 2021.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | 66,674,599 | - | - | 66,674,599 |
| **11.4 2022.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | 36,898,958 | - | - | 36,898,958 |

**11.5** අස්පෘශ්‍ය වත්කම්වලට රු. 459,670,405/- (2021 - රු. 459,670,405/-)ක දළ ධාරණ අගයක් සහිත සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද වත්කම් ඇතුළත්ය.

## 12. තොග

| | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|
| අලුත්වැඩියා සඳහා වන සාමාන්‍ය ද්‍රව්‍ය | 457,139,827 | 409,024,236 |
| මෝටර් රථ අමතර කොටස් | 326,871,796 | 259,905,274 |
| පාරිභෝගික ද්‍රව්‍ය | 80,814,725 | 24,164,078 |
| නිමි භාණ්ඩ | | |
| ලංකා පෙට්‍රල් LP-95 | - | - |
| ලංකා පෙට්‍රල් LP-92 | 1,623,931 | 602,667 |
| ලංකා ඔටෝ ඩීසල් - LAD | 13,147,680 | 5,109,105 |
| | 879,597,959 | 698,805,360 |
| භාවිතය අඩු තොග සඳහා වෙන්කිරීම | (17,074,498) | (16,750,173) |
| | 862,523,461 | 682,055,187 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **13. වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ** | | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශව (සටහන 13.1) | 8,492,160,381 | 9,317,649,253 |
| වෙනත් ලැබිය යුතු දෑ | 97,380,718 | 81,040,415 |
| තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවීම් (සටහන 13.3) | 2,006,778,573 | 1,690,628,286 |
| | 10,596,319,671 | 11,089,317,954 |

**13.1 වෙළෙඳ ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශව**

| | සම්බන්ධතාව | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හානිකරණයෙන් පසු (සටහන 13.2) | මව් සමාගම | 8,000,362,924 | 8,607,570,164 |
| ලංකා ඉන්දියන් තෙල් සමාගම හානිකරණයෙන් පසු (සටහන 13.2) | අනෙකුත් ප්‍රධාන කොටස් හිමියා | 491,797,457 | 710,079,090 |
| | | 8,492,160,381 | 9,317,649,253 |

**13.2** 2022 දෙසැම්බර් 31 දිනට, වෙළෙඳ ලැබිය යුතු දෑ හී වයස් විශ්ලේෂණය පහත පරිදි වේ.

| | එකතුව | දින 0-30 | දින 31-90 | දින 91-180 | දින 181-365 | දින 365 ට වැඩි |
|---|---|---|---|---|---|---|
| **ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව** | 8,000,362,924 | 2,266,424,266 | 1,366,137,408 | 252,083,086 | 421,814,386 | 3,693,903,778 |
| | 8,000,362,924 | 2,266,424,266 | 1,366,137,408 | 252,083,086 | 421,814,386 | 3,693,903,778 |
| **ලංකා ඉන්දියන් තෙල් සමාගම** | 491,797,457 | 247,793,345 | 41,489,800 | 2,257,085 | - | 200,257,227 |
| | 491,797,457 | 247,793,345 | 41,489,800 | 2,257,085 | - | 200,257,227 |

| | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **13.3 තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවීම්** | | |
| තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම් | 803,026,712 | 681,671,234 |
| පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ | 1,203,751,861 | 1,008,957,052 |
| | 2,006,778,573 | 1,690,628,286 |

| | 2022<br>රු. | 2021<br>රු.<br>නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **14. වෙනත් මූල්‍ය වත්කම්** | | |
| සමාගමේ නිලධාරීන්ට ණය | | |
| මෝටර් රථ ණය | 183,570,349 | 217,195,096 |
| නිවාස ණය | 1,453,812,070 | 1,590,350,388 |
| ආපදා ණය | 1,158,360,899 | 1,221,725,914 |
| වෙනත් ණය | 352,779,779 | 330,388,025 |
| | 3,148,523,097 | 3,359,659,422 |
| (-) හානිකරණය සඳහා දීමනා | (31,953,105) | (41,436,231) |
| | 3,116,569,992 | 3,318,223,191 |
| **14.1 ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| මෝටර් රථ ණය | 146,856,279 | 173,756,077 |
| නිවාස ණය | 1,319,952,838 | 1,428,524,719 |
| (-) හානිකරණය සඳහා දීමනා | (31,953,105) | (41,436,231) |
| | 1,434,856,012 | 1,560,844,565 |
| **14.2 ජංගම මූල්‍ය වත්කම්** | | |
| මෝටර් රථ ණය | 36,714,070 | 43,439,019 |
| නිවාස ණය | 133,859,231 | 161,825,669 |
| ආපදා ණය | 1,158,360,899 | 1,221,725,914 |
| වෙනත් ණය | 352,779,779 | 330,388,025 |
| | 1,681,713,979 | 1,757,378,626 |
| **15. මුදල් හා මුදල් සමාන දෑ** | | |
| වාසි සහගත මුදල් හා මුදල් සමාන දෑ ශේෂය | | |
| මුදල් හා බැංකු ශේෂ | (47,051,772) | (257,060,110) |
| කෙටිකාලීන ආයෝජන | 2,053,160,997 | 2,513,989,768 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුළු මුදල් සහ මුදල් සමාන දෑ** | 2,006,109,225 | 2,256,929,657 |

### 16. ප්‍රකාශිත ප්‍රාග්ධනය

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | රු. | සංඛ්‍යාව | රු. |
| සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් | 750,000,000 | 7,500,000,000 | 750,000,000 | 7,500,000,000 |

### 16.1 ප්‍රාග්ධන සංචිතය

සමාගම සංස්ථාපනය කර ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මගින් වත්කම් මාරුකරන අවස්ථාවේදී, ප්‍රාග්ධනකරණයේ කොටසක් ලෙස රු. 979,000,000 ක ප්‍රාග්ධන සංචිතයක් ඇති කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | 2022 රු. | 2021 රු. නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **17. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්** | | |
| **ජනවාරි 01 දිනට ශේෂය** | 1,609,324,159 | 2,015,643,759 |
| පවත්නා සේවා පිරිවැය | 85,514,820 | 81,507,384 |
| පොලී පිරිවැය | 185,072,279 | 161,251,501 |
| ආයුගණක (ලාභය)/ අලාභය | (411,261,666) | (428,606,379) |
| ගෙවන ලද ප්‍රතිලාභ | (184,776,742) | (220,472,106) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,283,872,850 | 1,609,324,159 |

